# වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්ම

# උතුරු මැද පළාත



## තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

"නිපුණතා පියස", 3වන මහල, 354/2, ඇල්විටිගල මාවත,

කොළඹ 05, ශ්‍රී ලංකාව

දුරකථන: +94-(0)115849291, ෆැක්ස්: +94(0)11-2555007

විද්‍යුත් තැපෑල: info@tvec.gov.lk, වෙබ් අඩවිය: www.tvec.gov.lk

# පළාත් වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු සැලසුම

# උතුරු මැද පළාත

**2016 සිට 2020 දක්වා**


**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව**

**03 වන මහල, "නිපුණතා පියස",**

**354/2, ඇල්විටිගල මාවත**

**කොළඹ 05**

## පටුන


| | | |
|---|---|---|
| මූලික පද අර්ථ දැක්වීම | | vi |
| විධායක සාරාංශය | | vii |
| **01** **වන පරිච්ඡේදය - හැඳින්වීම** | | **1-6** |
| 1.1 | පසුබිම | 1 |
| 1.2 | තාර්කිකත්වය | 1 |
| 1.3 | අරමුණු | 3 |
| 1.4 | ක්‍රියාකාරකම් | 3 |
| 1.5 | ද්‍රව්‍ය සහ ක්‍රම | 4 |
| 1.6 | වාර්ථාව පිළිබඳ දළ සටහනක් | 6 |
| **02** **වන පරිච්ඡේදය - උතුරු මැද පළාතේ සමාජ ආර්ථික පරිසරය** | | **7-26** |
| 2.1 | පසුබිම | 7 |
| 2.2 | පළාත් පරිපාලන ව්‍යුහය | 7 |
| 2.3 | ජෛවීය හා භෞතීය පරිසරය | 11 |
| 2.4 | උතුරු මැද පළාතේ ජන සංයුතිය | 12 |
| 2.5 | උතුරු මැද පළාතේ අධ්‍යාපන අංශය | 15 |
| 2.6 | ශ්‍රම බලකාය පිළිබඳ අනාවැකි | 21 |
| 2.7 | සාරාංශය | 26 |
| **03** **වන පරිච්ඡේදය - ජීවනෝපාය වෘත්තීන් සඳහා පුහුණු අවශ්‍යතා** | | **27-43** |
| 3.1 | පසුබිම | 27 |
| 3.2 | පළාතේ ජීවනෝපාය වෘත්තීන් | 29 |
| 3.3 | ජීවනෝපාය වෘත්තිකයින් මුහුණපාන ගැටළු | 31 |
| 3.4 | ජීවනෝපාය වෘත්තිකයින් විසින් ලබාගෙන ඇති පුහුණු | 36 |
| 3.5 | සාරාංශය සහ නිර්දේශ | 43 |
| **04** **වන පරිච්ඡේදය - කර්මාන්ත ක්ෂේත්‍රවල දැනට පවතින සහ පුරෝකථනය කරන ලද මානව සම්පත් අවශ්‍යතාවය** | | **44-77** |
| 4.1 | කර්මාන්ත නැඹුරුව පිළිබඳ දළ විශ්ලේෂණය | 44 |
| 4.2 | ආයතනවල වත්මන් පුහුණු සැපයුම පිළිබඳව සේවායෝජකයාගේ හැඟීම | 52 |
| 4.3 | කර්මාන්ත ක්ෂේත්‍රවල රැකියා පැතිකඩ | 54 |
| 4.4 | සේවායෝජකයින් විසින් පෙන්වාදෙන ලද අපේක්ෂිත සේවා සංඛ්‍යාවේ ප්‍රශ්ණ සහ ගැටළු | 64 |
| 4.5 | සේවායෝජකයන්ගේ හැඟීම් පදනම්කරගත් පුරෝකථනයන් සඳහා විකල්පයක් ලෙස ආර්ථික/ කර්මාන්ත වර්ධනයමත පදනම් වූ පුරෝකතනය | 66 |
| 4.6 | සාරාංශය | 77 |

**05 වන පරිච්ඡේදය - වත්මන් පුහුණු පැතිකඩ - පළාත් ශ්‍රම වෙළෙඳපොළ වෙත අවශ්‍ය පුහුණු ශ්‍රම සම්පත් සම්පාදනය** **79-109**

5.1 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතන පද්ධතිය 79

5.2 පළාතේ දැනට පවතින කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා 81

5.3 පළාතේ දැනට පවතින සහ පුරෝකතනය කරන ලද පුහුණු පාඨමාලා 87

5.4 ඉගැන්වීම, ඉගෙනීම සහ ඇගයීම් සම්පත් 98

5.5 ආයතන ප්‍රවර්ධන උපාය මාර්ග 101

5.6 පළාතේ පුහුණු සැපයුම සහ නිපුණ සේවකයින් සඳහා ඉල්ලුම අතර නොගැලපීම් විශ්ලේෂණය 109

**06 වන පරිච්ඡේදය - නිර්දේශ සහ ක්‍රියාකාරි සැලැස්ම** **122-144**

6.1 ශ්‍රම බලකා දත්තමත නිර්දේශ 122

6.2 ජීවනෝපාය වෘත්තිකයින් සඳහා නිපුණතා පුහුණුවට නිර්දේශ 124

6.3 පුහුණු වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාලත්වය දියුණු කිරීම පිළිබඳ නිර්දේශ 125

6.4 පළාතේ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතන සඳහා බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩිකර ගැනීම සහ වෘත්තීය පුහුණුව සංවර්ධනය සඳහා නිර්දේශ 126

6.5 උතුරු මැද පළාත සඳහා ක්‍රියාකාරී සැලැස්ම 128

6.6 සීමාවන් 144

## වගු සැලැස්ම


වගුව 2.1: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් සහ ග්‍රාම නිළධාරී වසම් සංඛ්‍යාව 10

වගුව 2.2: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාම නිළධාරී වසම් සහ ගම්මාන සංඛ්‍යාව 11

වගුව 2.3: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනගහනය 12

වගුව 2.4: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජන වර්ගය අනුව ජනගහන විස්තරය 13

වගුව 2.5: අනුරාධපුර දිස්ත්‍රික්කයේ සාක්ෂරතාව සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය 13

වගුව 2.6: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනගහන ව්‍යාප්තිය 14

වගුව 2.7: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වයස අනුව ජනගහන ව්‍යාප්තිය 14

වගුව 2.8: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනවර්ගය අනුව ජනගහන ව්‍යාප්තිය 14

වගුව 2.9: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සාක්ෂරතාව සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය (වයස අවුරුදු 10 සහ ඉහළ) 15

වගුව 2.10: වර්ගය අනුව පළාතේ සමස්ථ පාසැල් සංඛ්‍යාව 16

වගුව 2.11: අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසැල් සංඛ්‍යාව 16

වගුව 2.12: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසැල් සංඛ්‍යාව 16

වගුව 2.13: උතුරු මැද පළාතේ අ. පො. ස. (උ. පෙළ) තාක්‍ෂණ විෂයධාරාව සහිත පාසැල් සංඛ්‍යාව 17

වගුව 2.14: 2015 අ. පො. ස. (උ. පෙළ) තාක්‍ෂණ විෂයධාරාවේ කාර්යසාධනය 18

වගුව 2.15: අ. පො. ස. (සා.පෙළ) විභාගයේ ඉදිරිපත්වීම - 2012 20

වගුව 2.16: අ. පො. ස. (උ.පෙළ) විභාගයේ ඉදිරිපත්වීම - 2012 20

වගුව 2.17: අ. පො. ස. (සා.පෙළ) පසුව ශ්‍රම බලකාය වෙත අතුළු වන්නන් පිළිබඳ පස් අවුරුදු පුරෝකථනය 23

වගුව 2.18: අ. පො. ස. (උ.පෙළ) පසුව ශ්‍රම බලකාය වෙත අතුළු වන්නන් පිළිබඳ පස් අවුරුදු පුරෝකථනය 23

වගුව 2.19: ශ්‍රම බලකාය වෙත සමස්ථ අතුළු වන්නන් පිළිබඳ පස් අවුරුදු පුරෝකථනය 23

වගුව 3.1: උතුරු මැද පළාත් එක් එක් උප අංශයේ ජීවනෝපාය වෘත්තීය ප්‍රභේද 30

වගුව 3.2: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවනෝපාය වෘත්තිකයන් මුහුණපාන ගැටළු 32

වගුව 3.3: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජීවනෝපාය වෘත්තිකයින් මුහුණපාන ගැටළු 34

වගුව 3.4: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවනෝපාය වෘත්තිකයින් විසින් දැනට ලබාගෙන ඇති පුහුණුව 37

වගුව 3.5: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජීවනෝපාය වෘත්තිකයින් විසින් දැනට ලබාගෙන ඇති පුහුණුව 37

වගුව 3.6: ශ්‍රී ලංකාවේ ජීවනෝපාය වෘත්තිකයින්ට කර්මාන්ත කාණ්ඩ අනුව දිවි නැගුම වැඩසටහන යටතේ ලබාදුන් පුහුණුව 39

වගුව 3.7: ශ්‍රී ලංකාවේ ජීවනෝපාය වෘත්තිකයින්ට පුහුණුව සපයන්නන් විසින්
දිවි නැගුම නැගුම වැඩසටහන යටතේ ලබාදුන් පුහුණුව 40
වගුව 3.8 : උතුරු මැද පළාතේ දිස්ත්‍රික්ක දෙකෙහි පුද්ලයින්ගේ පුහුණු අවශ්‍යතා 40
වගුව 4.1: 2014 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයේ පළාත් දායකත්වය 45
වගුව 4.2: 2014 දී උතුරු මැද පළාත් දළ ජාතික නිෂ්පාදිතයට ක්ෂේත්‍රයහි දායකත්වය 45
වගුව 4.3: උතුරු මැද පළාතේ කාෂිකාර්මික ක්ෂේත්‍රයහි 2011-2012 වර්ෂ තුල
කර්මාන්ත අනුව පළාත් දළ දේශීය නිෂ්පාදිතය (රු. මිලියන වලින්) 46
වගුව 4.4: පළාත් අනුව කර්මාන්ත ආයතනවල ව්‍යාප්තිය (2012) 47
වගුව 4.5: උතුරු මැද පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි 2011-2012 වර්ෂතුල කර්මාන්ත
අනුව පළාත් දළ දේශීය නිෂ්පාදිතය (රු. මිලියන වලින්) 47
වගුව 4.6: උතුරු මැද පළාතේ සේවා අංශයෙහි 2011-212 වර්ෂතුල කර්මාන්ත අනුව
පළාත් දේශීය නිෂ්පාදිතය 48
වගුව 4.7: 2013 වර්ෂයේදී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයින් සංඛ්‍යාව 49
වගුව 4.8: නියැදියේ විස්තර 51
වගුව 4.9: අධ්‍යාපනය සහ පුහුණුව සපයන ආයතන පිළිබඳව සේවා යෝජකයන්ගේ දැක්ම 53
වගුව 4.10: අධ්‍යාපන සහ පුහුණුව සපයන ආයතන පිළිබඳව සේවා යෝජකයන්ගේ දැක්ම 54
වගුව 4.11: අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිෂ්පාදන අංශය තුල වත්මන් සහ අපේක්ෂිත
රැකියා පැතිකඩ 55
වගුව 4.12: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නිෂ්පාදන අංශය තුල වත්මන් සහ අපේක්ෂිත
රැකියා පැතිකඩ 56
වගුව 4.13: අනුරාධපුර දිස්ත්‍රික්යේ සංචාරක හා ආගන්තුක සත්කාර අංශයේ වත්මන් සහ
අපේක්ෂිත රැකියා පැතිකඩ 57
වගුව 4.14: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සංචාරක හා ආගන්තුක සත්කාර අංශයේ
වත්මන් සහ අපේක්ෂිත රැකියා පැතිකඩ 59
වගුව 4.15: අනුරාධපුර දිස්ත්‍රික්කයේ සේවා අංශයේ වත්මන් සහ අපේක්ෂිත රැකියා පැතිකඩ 60
වගුව 4.16: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සේවා අංශයේ වත්මන් සහ අපේක්ෂිත
රැකියා පැතිකඩ 61
වගුව 4.17: අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිනිස්ඉලය සඳහා පුරෝකථනය කරනලද මුළු ඉල්ලුම 68
වගුව 4.18: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මිනිස්ඉලය සඳහා පුරෝකථනය කරනලද
මුළු ඉල්ලුම 71
වගුව 4.19: උතුරු මැද පළාතේ මිනිස්ඉලය සඳහා පුරෝකථනය කරනලද මුළු ඉල්ලුම 74
වගුව 5.1: අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු 79
ආයතන ලැයිස්තුව

වගුව 5.2: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතන ලැයිස්තුව 81
වගුව 5.3: අනුරාධපුර දිස්ත්‍රික්කයේ වර්ථමානයේ පවතින කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු පාඨමාලා ලැයිස්තුව 82
වගුව 5.4: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වර්ථමානයේ පවතින කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු පාඨමාලා ලැයිස්තුව 85
වගුව 5.5: අනුරාධපුර දිස්ත්‍රික්කයේ වත්මන් සහ පුරෝකථනය කරන ලද සමස්ථ පුහුණු ප්‍රතිදාන 88
වගුව 5.6: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වත්මන් සහ පුරෝකථනය කරන ලද සමස්ථ පුහුණු ප්‍රතිදාන 91
වගුව 5.7: උතුරු මැද පළාතේ වත්මන් සහ පුරෝකථනය කරනලද සමස්ථ පුහුණු ප්‍රතිපාදන 94
වගුව 5.8: 2015 වර්ෂයේදී තාක්‍ෂණ විද්‍යාලය මඟින් පවත්වන ලද විවිධ විශේෂ පුහුණු පාඨමාලාවල පුහුණු සැපයුම 97
වගුව 5.9: පුහුණුවේ ගුණාත්මකභාවය සහ අදාලත්වය 100
වගුව 5.10: ප්‍රචාරණ මාධ්‍ය 102
වගුව 5.11: ආයතනවල ප්‍රවර්ධන උපායමාර්ග 103
වගුව 5.12: අනුරාධපුර දිස්ත්‍රික්යේ ඉල්ලුම සහ සැපයුම අතර පරතරය 106
වගුව 5.13: පොළොන්නරුව දිස්ත්‍රික්යේ ඉල්ලුම සහ සැපයුම අතර පරතරය 110
වගුව 5.14: උතුරු මැද පළාතේ ඉල්ලුම සහ සැපයුම අතර පරතරය 114
වගුව 5.15: 2016 සිට 2020 දක්වා උතුරු මැද පළාතේ ඉල්ලුම සහ සැපයුම 118
වගුව 6.1: ක්‍රියාකාරී සැලැස්ම 129

**රූපසටහන් සැලැස්ම**

රූපසටහන 2.1: මධ්‍යම රජයේ පරිපාලන ව්‍යුහය 8
රූපසටහන 2.2: පළාත් සභා පරිපාලන ව්‍යුහය 9

**මූලික පද අර්ථ දැක්වීම**

කාර්මික අධ්‍යාපනය: ව්‍යවහාරික විද්‍යා සහ නවීන තාක්‍ෂණය සම්බන්ධ රැකියා සඳහා සිසුන්ව අධ්‍යයන හා වෘත්තීමය ලෙස සූදානම්කිරීම. එය ක්‍රියාකාරී කුසලතා ප්‍රවීනතා අත්පත්කර ගැනීම වෙනුවට විද්‍යාව සහ ගණිතය මූලික මූලධර්මවල අවබෝධය සහ ප්‍රායෝගික භාවිතය අවධාරණය කිරීම.

වෘත්තීය අධ්‍යාපනය: ක්‍රියාකාරී කුසලතාමත පදනම් වූ විශේෂ වෘත්තීය ක්ෂේත්‍ර තුල ප්‍රායෝගික අත්දැකීම් සපයන අධ්‍යාපනය සහ පුහුණුවයි.

ආධුනිකත්වය: සමහර ක්‍රියාකාරී කුසලතා පිළිබඳ ප්‍රවීනතාවය

පුහුණු සේවක: යම් නිශ්චිත කාර්යයක් කාර්යක්‍ෂම හා ඵලදායීව ඉටුකිරීම සඳහා සේවකයෙකු විසින් විශේෂ හැකියාවන්, පුහුණුව, දැනුම අත්පත් කර ගැනීමයි.

අර්ධ පුහුණු ශ්‍රමිකයා: යම් නිශ්චිත කාර්යයක් යම් ප්‍රමාණයක කාර්යක්‍ෂම හා ඵලදායීව ලෙස ඉටු කිරීම සඳහා සේවකයෙකු විසින් හැකියාවන්, පුහුණුව සහ දැනුම අත්පත්කර ගැනීමයි.

ජීවනෝපාය: ජීවත්වීමේ උපක්‍රමයක් සඳහා අවශ්‍ය හැකියාවන්, වත්කම් (ගබඩා, සම්පත්, හිමිකම් හා ප්‍රවේශ) යන ක්‍රියාකාරකම් වලින් ජීවනෝපාය සමන්විතය. ජීවනෝපායක් සමඟ සාර්ථකව කටයුතු කල හැකි අතර මානසික ආතතිය හා කම්පන තුලිත කර පවත්වාගෙන යාම හෝ එහි හැකියාවන් සහ වත්කම්වල තිරසාර වර්ධනය සහ ඊළඟ පරම්පරාව සඳහා තිරසාර ජීවනෝපාය මාර්ග සැලසීම/සැපයීම; සහ දේශීය හා ගෝලීය මට්ටමින් සහ කෙටි කාලීන හා දිගු කාලීනව අනෙකුත් ජීවනෝපායන්වල ශුද්ධ ප්‍රතිලාභවලට දායක වේ.

සංයුක්ත වර්ධන අනුපාතිකය: යම් නිශ්චිත කාල වකවානුවක් සඳහා වසරින් වසරට ආර්ථික වර්ධන වේගයේ ඕනෑම අගයක් එම වර්ධන අනුපාතය දිගුකාලයක් බව තීරණය කළහැකි සියළු සාධක ඇතුලත් වේ.

ශ්‍රම බලකාය: දී ඇති කාලයක් සඳහා ශ්‍රමය සැපයිය හැකි ජනතාවගේ සත්‍ය සංඛ්‍යාවයි. එයට රැකියා නියුක්ති සහ වියුක්ති යන දෙවර්ගයේම පුද්ගලයින් අතුලත් වේ.

## විධායක සාරාංශය

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම සකස්කිරීම විවිධ පැතිකඩ වලින් සාධාරණ වේ. පළමුව, අනිසි හා අවිධිමත් පුහුණු පුද්ගලයින් කර්මාන්තය තුල විධිමත් පුහුණුවක් අවශ්‍ය රැකියාවල නිරත වන බව. දෙවනුව, පාඨමාලා සැපයීම බොහෝ දුරට සැපයුම-මෙහෙයවීම සහ ඉල්ලුම-මෙහෙයවීම මත සිදුවන බව. තෙවනුව බොහෝ තරුණ තරුණියන් රාජ්‍ය අංශයේ රැකියා අරමුණු කරගෙන සාම්ප්‍රදායී අධ්‍යාපනය සිදුකරන අතර සුළු වශයෙන් පමණක් පෞද්ගලික අංශයේ අවශ්‍යතා පිළිබඳ සලකන පද්ධතියක් වෙත අවධානය යොමුකරන බව.

හතරවනුව බොහෝමයක් ආයතන මඟින් ප්‍රාදේශීය සහ ජාතික අවශ්‍යතා සඳහා පුද්ගලයින්ට අධ්‍යාපනය ලබාදීම සහ පුහුණු කිරීම සිදු නොකරන බව. පස්වනුව රජයේ ආයතන හා අනෙකුත් රාජ්‍ය නොවන ආයතන විසින් සපයන කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව නොසලකා හැරීමක් සහ නොපිළිගැනීමක් අත්විඳිනු දක්නට ලැබේ. එබැවින් දිවයින තුල වඩාත් ප්‍රධාන කර්මාන්තයන්හි ශ්‍රම බලකායන් අවිධිමත් අංශයේ සාම්ප්‍රදායික ආධුනිකත්ව මඟින් සැපයීම කැපීපෙනේ. හයවනුව, අවිධිමත් අංශයේ පුහුණුව අත්හැරීම වෙනුවට රැකියා අපේක්ෂකයින් හඳුනාගැනීමට ඔවුන් ඇමතීමෙන් ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව භාවිතයෙන් සහ දැනට පවතින තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කුසලතා සහතිකපත් පද්ධතිය ක්‍රියාත්මක කිරීම මඟින් එය පිළිගැනීමේ ආකාරයක් අවශ්‍ය වේ. අවසාන වශයෙන් සෑම මට්ටමක දීම අධ්‍යාපන හා පුහුණු ආයතන මඟින් අධ්‍යාපනය සහ පුහුණුව සැපයීම පෞද්ගලික අංශය සමඟ සහයෝගීතාවක් නොමැතිබව දක්නට ලැබේ.

වෘත්තීය පුහුණු සැලැස්මේ අරමුණු නම්: පළාතේ ශ්‍රම බලකායේ ප්‍රවණතා ඇගයීමට සහ ඉදිරි වසර පහ සඳහා පුරෝකථනය කිරීමට ද; ඉදිරි වසර පහ සඳහා කර්මාන්ත ක්ෂේත්‍රවල නිපුණ සහ අර්ධ පුහුණු ශ්‍රම අවශ්‍යතා තක්සේරු කිරීම; ඉදිරි වසර පහ තුල ආයතන මඟින් වෘත්තීය අධ්‍යාපන හා පුහුණුව සැපයීම තක්සේරු කිරීමට; පළාතේ ආයතන විසින් ඉදිරිපත් කරන විවිධ පාඨමාලාවල ගුණාත්මකභාවය හා අදාලත්වය තක්සේරු කිරීමට; පළාතේ ආයතනික විධිවිධාන සහ දිරිගැන්වීමේ ව්‍යුහය පරීක්ෂා කිරීමට කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු වැඩසටහන් පහසුකිරීම හා උත්තේජනය කිරීමට ආධාර කිරීම; පළාතේ අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණු පාඨමාලා සඳහා ඉල්ලුම සහ සැපයුම අතර පවතින පරතරය පරීක්ෂා කිරීම; හා කර්මාන්තයේ ඉල්ලුම සපුරාලීම පිණිස ඵලදායී හා කාර්යක්ෂම වෘත්තීය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සැපයීම පිණිස සැලැස්මක් යෝජනා කිරීම.

ප්‍රායෝගික නිර්දේශවලට එළඹීම සඳහා දත්ත එක් රැස්කිරීමට සහ නිගමනවලට එළඹීමට ක්‍රමානුකූල පටිපාටියක් අනුගමනය කරන ලදී. පළමුව මූලික දත්ත රැස්කිරීම සඳහා ආයෝජන සමාගම්

උපදේශන වැඩමුළු තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහ උතුරු මැද පළාත් සභාව එක්ව අනුරාධපුරයේදී පවත්වන ලදී. දෙවනුව ශ්‍රම වෙළෙඳපොළ ලක්ෂණ ඇතුළු පළාතේ සමාජ ආර්ථික පරිසරය පිළිබඳ දත්ත එක්රැස් කිරීම සඳහා විවිධ මූලාශ්‍රවල ද්විතීයික දත්ත භාවිතා කරන ලදී. තෙවනුව ඉදිරි වසර පහ සඳහා ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍රවල ශ්‍රම අවශ්‍යතා පිළිබඳ දත්ත එක් රැස් කිරීම සඳහා සවිස්තර ව්‍යුහගත ප්‍රශ්නාවලිය සකස්කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් පළාතේ සියළු වාර්ථාගත සහ අදාල කාර්මික ව්‍යාපාර සඳහා යොමුකර ලබාගත් මුළු කාර්මික ව්‍යවසායන් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී. හතරවනුව ව්‍යුහාත්මක ප්‍රශ්නාවලී සමීක්ෂණය මඟින් පවතින පාඨමාලා පිළිබඳ දත්ත සහ ඒවායේ ව්‍යාප්තිය ගුණාත්මකභාවය පළාතේ අධ්‍යාපන හා පුහුණු සේවා සපයන්නන් මඟින් රැස්කරන ලදී. එසේම, පස්වනුව ව්‍යුහාත්මක ප්‍රශ්නාවලී සමීක්ෂණය මඟින් පළාතේ අධ්‍යාපන හා පුහුණු ආයතනවල සිසුන් නියැදි මඟින් පුහුණු වන්නන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳව දත්ත රැස් කිරීම සිදුකරන ලදී. හයවනුව ඉලක්ක කණ්ඩායම් සහ තෝරාගත් රාජ්‍ය නිළධාරීන් සංඛ්‍යාවක් වාණිජ හා කර්මාන්ත මණ්ඩල සාමාජිකයින් සහ අධ්‍යාපනය හා පුහුණුව සපයන නියෝජිතයන් සමඟ එක්ව කාර්මික හා වාත්තීය අධ්‍යාපන පුහුණු වැඩසටහන්/පාඨමාලාවන්හි ගැටළු සහ ප්‍රශ්ණ පිළිබඳ ගුණාත්මක දත්ත රැස්කිරීම සඳහා සාකච්ඡා පවත්වන ලදී. හත්වනුව ඉල්ක්ක කණ්ඩායම් එම පළාතේ ජීවනෝපාය රැකියාවල නිරතව සිටින පුද්ගලයින් සමඟ ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා පිළිබඳ දත්ත රැස්කිරීමට සාකච්ඡා පවත්වන ලදී. අටවනුව පළාතේ කර්මාන්ත ක්ෂේත්‍ර අංශයේ යෝජනා තහවුරු කිරීමට සහ ප්‍රතිචාර ලබාගැනීමට අනුරාධපුරයේදී වැඩමුළු පවත්වන ලදී. අවසාන වශයෙන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව උතුරු මැද පළාත සමඟ එක්ව වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැසුම යෝජිත කෙටුම්පත පිළිබඳ ප්‍රතිචාර ලබාගැනීම සඳහා වලංගභාවය තහවුරු කිරීමේ වැඩමුළුව පවත්වන ලදී. මෙම සැලැස්ම ඊට සහභාගී වූ පාර්ශවකරුවන් විසින් අනුමත කරන ලදී.

මෙම අධ්‍යයනය මඟින් ජීවනෝපාය අංශයේ මෙන්ම කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ පුහුණු අවශ්‍යතා ද හඳුනාගෙන තිබේ. එසේම, සමහර ප්‍රදේශවල පුහුණුව සැපයීමේ අතිරික්ත බවක් ඇති අතර, සමහර ප්‍රදේශවල පුහුණුව සැපයීමේ ඌනතාවක් ඇති බවත් ඉල්ලුම් සමීක්ෂණය මඟින් තහවුරු කෙරේ. එපමණක් නොව, කර්මාන්ත සහ ආර්ථික පරිසරය වෙනස් කිරීමේ ප්‍රතිඵල ලෙස නව පුහුණු වැඩසටහන් නව වෘත්තීමය අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය වන බව ඉස්මතු විය. මෙම නව පුහුණු වැඩසටහන්වලදී නිෂ්පාදන ක්‍රියාවලිය තුල විවිධ යන්ත්‍රසූත්‍ර හා උපකරණ භාවිතය අවශ්‍ය බව සඳහන් වේ. පළාතේ පුහුණු කිරීම සම්බන්ධ නිශ්චිත ගැටළු සඳහා නිශ්චිත නිර්දේශ පවතී.

මෙම අධ්‍යයනය මඟින් සාමාන්‍ය සොයාගැනීම් ගනණාවක් අනාවරණය කර ඇත. පළමුව විශේෂයෙන්ම වෘත්තීයමත දැනුවත් කිරීමේ ඉගැන්වීම හෝ දැනුම දෙසට දැඩි ලෙස යොමුවන ජීවනෝපාය පුහුණු වැඩසටහන් විවිධ රාජ්‍ය යෝජනා ක්‍රම මඟින් මේ වන විටත්/ දැනටමත් සපයා ඇත. යම් රැකියාවක් සඳහා නිශ්චිත කුසලතා නොමැති වීම ජීවනෝපාය වෘත්තිකයින් ගේ අදහස වේ.

දෙවනුව පළාතේ කර්මාන්ත අංශ ඉතා අවිධිමත් ආර්ථික කටයුතු සහ නුපුහුණු ශ්‍රම ආධිපත්‍ය දරනු ලැබේ. තුන්වනුව බොහෝ කර්මාන්ත ස්ථිර රැකියා සඳහා විකල්ප ලෙස කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන පුහුණුවන්නන්/ අභ්‍යාසලාභීන් සේවා ලබාගැනීමත රඳා පවතින බව පෙනීයයි. මෙමඟින් ස්ථිර සේවකයින් බඳවා ගැනීමේ දී කර්මාන්තයට බාධාවන් පමුණුවා ඇත. හතරවනුව වෘත්තීය ප්‍රමිතිකරණය හිඟවීම/ නොමැතිවීම නිපුණ ශ්‍රම ඉල්ලුම සඳහා සෘණාත්මක ලෙස බලපෑම් ඇති කරයි. යම් වෘත්තිකයක් සඳහා ඉහළ කුසලතා සපිරි සහ අඩු කුසලතා සහිත පුද්ගලයන්ගේ වෙනස හඳුනා ගැනීමට ක්‍රමවේදයක් නොමැත. පස්වනුව පළාතේ සමස්ථ ආර්ථික කටයුතු වලින් විධිමත් ආර්ථික කටයුතු වල ප්‍රමාණය 20 % පමණ වන අතර, විධිමත් ක්ෂේත්‍රය තුල වැටුප් ශ්‍රමය ඉතා දුර්වලය. අවසාන වශයෙන් සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල කුසලතා සංවර්ධන සහකාර නිළධාරීන් සමඟ සිදුකල සාකච්ඡා මඟින්, අ. පො. ස. (උ. පෙළ) තාක්‍ෂණ විෂයධාරාව හදාරන ලද සිසුන් සඳහා ප්‍රමාණවත් පාඨමාලා සංඛ්‍යාවක් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන සතුව නොමැති බවද අනාවරණය/ නිරීක්‍ෂණය කළ හැකි විය.

## 01 වන පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 පසුබිම

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත මේ රටේ එක් එක් පළාතේ සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සංවර්ධනය කිරීමේ වැදගත් කාර්යභාරය ආරම්භ කර ඇත. මෙහිදී සිදුවන්නේ එක් එක් පළාතෙහි මානව සම්පත් හා පුහුණු අවශ්‍යතාවයන් හඳුනා ගැනීම සහ හඳුනාගත් සංවර්ධන ගැටලු සඳහා උපාය මාර්ගික සැලසුම් සංවර්ධනය කිරීම ය. මෙම වාර්තාව උතුරු මැද පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ඉල්ලීමකට අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව උතුරු මැද පළාත් සභාව සමග එක්ව කරන ලද ව්‍යාපෘතියකි. මෙම වාර්ථාව උතුරු මැද පළාත සඳහා සාමාන්‍ය හා විශේෂ අරමුණු ඉටුකර ගැනීමට වූ කාර්යයන්වලට අනුකූලවන පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අවශ්‍යතා සපුරාලීම සඳහා වන පස් අවුරුදු සැලැස්මක් නිර්මාණය කිරීමකි.

### 1.2 තාර්කිකත්වය

මීලග ආසියාවේ ආශ්චර්යය ලෙස ශ්‍රී ලංකාව නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට සහාය පිණිස ශ්‍රී ලංකාව තුල පුහුණු ශ්‍රම බලකාය නිර්මාණය කිරීමට ඉහළ අවධානය සහ ක්‍රියාවලිය වේගවත් කිරීමට යොමුවීමයි. රජය උසස් අධ්‍යාපන පද්ධතිය සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව හරහා දැනුම හා කුසලතාමත පදනම් වූ සමාජයක් ඇති කිරීමට පියවර හා ආයෝජන සහිත පැහැදිලි සැලැස්මක් දක්වා ඇත. මෙම ජාතික වශයෙන් වැදගත් ප්‍රතිපත්ති බලගැන්වීම පහසුකිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ පැහැදිලි සැලසුම් වලට අනාගත කුසලතා අවශ්‍යතා සහ පුහුණුව සැපයීම හඳුනා ගැනීම අවශ්‍යවේ.

කෙසේ වෙතත්, රැකියා වෙළෙඳපොළ තොරතුරු සහ ශ්‍රම බලකාය පිළිබඳ දත්ත මඟින් දැක්වෙන ආකාරයට ශ්‍රී ලංකාව තුල විශාල රැකියා පුරප්පාඩු සහ නොනැවතී පවත්නා විරැකියාව යන දෙකම පවතී. එමඟින් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්ම සකස් කිරීමේ විවිධ පැතිකඩ කිහිපයක් සාධාරණීකරණය කරගත හැකිය. පළමුව විධිමත් පුහුණුවක් අවශ්‍ය කර්මාන්ත තුල අනිසි හා අවිධිමත් පුහුණු පුද්ගලයින් රැකියාවල නිරතවන බව, දෙවනුව පාඨමාලා සැපයීම බොහෝ දුරට සැපයුම් මෙහෙයවීම සහ ඉල්ලුම් නොවන මෙහෙයවීම මහා පරිමාණ විරැකියාව ඉදිරියේදී ඉහළ පුරප්පාඩු අනුපාත රට තුල පවතින කුසලතා නොගැලපීම තහවුරු කරයි. රට තුල පවතින කුසලතා නොගැලපීම ද අධ්‍යාපනයේ ගුණාත්මක භාවයේ දුර්වලතාව සහ අධ්‍යාපන පද්ධති සහ සේවා යෝජකයින් අතර සහසම්බන්ධතා නොමැති වීමද ගැටළුවක් ලෙස අවධාරණය කරයි. තෙවනුව බොහෝ තරුණ තරුණියන් රාජ්‍ය අංශයේ රැකියා අරමුණු කරගෙන සාම්ප්‍රදායි අධ්‍යාපනය සිදුකරන

අතර, සුළු වශයෙන් පෞද්ගලික අංශයේ අවශ්‍යතා ගැන සැලකෙන පද්ධතියක් වෙත අවධානය යොමු කෙරෙන බවයි. බොහෝ ආයතන මඟින් ප්‍රාදේශීය සහ ජාතික අවශ්‍යතා සඳහා පුද්ගලයින්ට අධ්‍යාපනය ලබාදීම හා පුහුණු කිරීම සිදුනොකරන බව පෙනේ. වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව) සතුව තරුණයන්ට ව්‍යවහාරික කුසලතා හා ශ්‍රම වෙළෙඳපොළ තුල වඩා හොඳ අවස්ථා සැපයීමට හැකියාවක් පවතින අතර, කෙසේ වුවද එය වඩා හොඳින් හඳුනාගැනීම හා ප්‍රකාශ කිරීම කළයුතුව ඇත. පස්වනුව, දක්නට ලැබෙන පරිදි රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන විසින් සපයන කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව නොසලකාහැරීම සහ නොපිළිගැනීමක් හැඟෙන අතර ඒ වෙනුවට අවිධිමත් අංශයේ සාම්ප්‍රදායික ආධුනිකත්ව රට තුල වඩාත් ප්‍රධාන කර්මාන්තයන්හි ශ්‍රම බලකායක් සැපයීම කැපී පෙනේ. මෙම අඩු ගුණාත්මක ප්‍රතිදානය, සම්පත් නාස්තිය, අකාර්යක්ෂමතාව හා අඩු ඵලදායීතාවය කර්මාන්තයන් තුල මන්දගාමී වර්ධනයට හේතු වී තිබේ. හයවනුව අවිධිමත් අංශයේ පුහුණුව වෙනුවට රැකියා අපේක්ෂකයින් හඳුනාගැනීමට ඔවුන් ඇමතීම සහ ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව භාවිතයෙන් සහ දැනට පවතින TVEC කුසලතා සහතිකපත් ක්‍රියාත්මක කිරීම මඟින් එය ද පිළිගැනීමකට ලක්කිරීම අවශ්‍යවේ. හත්වනුව අධ්‍යාපන හා පුහුණු ආයතනවල අධ්‍යාපනය සහ පුහුණුව සෑම මට්ටමකදීම පෞද්ගලික අංශය සමඟ සහයෝගීතාවක් නොමැතිබව දක්නට ලැබේ. අවසාන වශයෙන් මෑත කාලයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කර ඇති අයවැය අනුව වෘත්තීය හා කාර්මික අධ්‍යාපන සංවර්ධනය මඟින් අර්ධ පුහුණු හා පුහුණු ශ්‍රම බලකාය සඳහා ඉහළ හා වර්ධනය වන ගෝලීය ඉල්ලුමක් ඇති බව අවධාරණය කරන අතර, සමහර එම ගෝලීය වෘත්තීන් ලබාගැනීමට කෙටි කාලීන හා මධ්‍යකාලීන ලෙස රැකියා ප්‍රශ්නය සඳහා පිළියම් යෙදීමට ශ්‍රී ලංකාට හැකිවනු ඇත.අ.පො.ස. (උ.පෙළ) අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සහ අ.පො.ස. (උ.පෙළ) පසු විශ්ව විද්‍යාලවලට ඇතුළුවිය නොහැකි අය සඳහා මූලික වශයෙන් රට තුල වෘත්තීය හා කාර්මික අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ වැදගත්කම 2013 අයවැය වාර්ථාව මඟින් දැඩිලෙස අවධාරණයකර ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන් කර්මාන්තයේ නිපුණ සහ අර්ධ පුහුණු මිනිස් බලය සඳහා ඉල්ලුම හා එහි ගුණාත්මකභාවය සහ වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් පාඨමාලාවල අදාලබව හඳුනාගැනීම නිසි ලෙස පිළිගැනීමට ලක්කල යුතුය. කර්මාන්තයට අවශ්‍ය පුහුණු හා අර්ධ පුහුණු ශ්‍රම බලකාය සැපයීම සාර්ථකවීමට නම්, එම පළාතේ ආයතන, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු පද්ධතිය අපේක්ෂිත ප්‍රතිඵලය පිළිබඳ පැහැදිලි දැක්මක් අවශ්‍යවන අතර ඉදිරි සාර්ථක රැකියා අපේක්ෂාවන් සහිත අංශ කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. පවත්නා පාඨමාලාවලට සහ නව පාඨමාලා හඳුන්වාදීම අඛණ්ඩව යාවත්කාලීන කිරීම හා සංශෝධනය කර්මාන්තය තුල වෙනස් සහ ගතික රැකියා අපේක්ෂාවන් ප්‍රකාශනයට පත්කිරීමේදී අවශ්‍ය විය හැකිය. උතුරු මැද පළාත සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්මක ගතික හමුවීමට වෘත්තීය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්/පාඨමාලා සැපයීමේ වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාව හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නෙවන ආයතනවල සහය බලාපොරොත්තුවේ.

## 1.3 අරමුණු

i. පළාතේ ශ්‍රම බලකාය නැඹුරුතා පිළිබඳ ඇගයීම සහ ඉදිරි වසර පහ සඳහා පුරෝකතනයන් සිදුකිරීම
ii. ඉදිරි වසර පහ සඳහා උතුරු මැද පළාත සඳහා කර්මාන්ත අංශයේ පුහුණු හා අර්ධ පුහුණු ශ්‍රම බලකායේ අවශ්‍යතාව විමසා බැලීම
iii. ඉදිරි වසර පහක කාලයක් තුල ආයතන මඟින් සපයන වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ඇගයීම
iv. පළාතේ ආයතන මඟින් සැපයෙන විවිධ පාඨමාලාවල ගුණාත්මකභාවය සහ අදාලත්වය ඇගයීම
v. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු වැඩසටහන් පහසුකිරීමට සහ උත්තේජනය කිරීමට පළාතේ ආයතනික සැකැස්ම සහ දිරිගැන්වීමේ ව්‍යුහය පරීක්‍ෂා කිරීම
vi. පළාත තුල වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා සැපයීම හා ඉල්ලුම අතර පවතින නොගැලපීම පරීක්‍ෂා කිරීම
vii. උතුරු මැද පළාතේ කර්මාන්ත ඉල්ලුමට සරිලන ඵලදායී හා කාර්යක්‍ෂම වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණු වැඩසටහන් සැපයීම සඳහා වැඩ සැලසුම් යෝජනා කිරීම

## 1.4 ක්‍රියාකාරකම්

i. දිස්ත්‍රික් පදනම මත පළාතේ ප්‍රධාන කර්මාන්ත අංශය හඳුනාගැනීමට සහ ඒවායේ ප්‍රධාන ගැටළු පළාත් වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහය ඇතිව දිස්ත්‍රික්ක දෙකක දිස්ත්‍රික් සැලසුම් වැඩමුළු 2 ක් සංවිධානයකර පවත්වන ලදී.
ii. ද්විතීයික දත්ත සහ තොරතුරුමත පදනම්ව දිස්ත්‍රික් සමාජ ආර්ථික විශ්ලේෂණ සැලසුම් වැඩමුළු පවත්වා ආර්ථික ප්‍රවනතා හඳුනාගන්නා ලදී.
iii. ඉදිරි වසර 05 සඳහා ශ්‍රම වෙළෙඳපොළ සඳහා නව ඇත්ලත්වීම් තක්සේරු කිරීම සඳහා පළාත් පාසල් පද්ධතිය ප්‍රතිදානය විශ්ලේෂණය කරන ලදී.
iv. නිපුණ ශ්‍රමිකයන්ගේ ඉල්ලුම සහ නිපුණ ශ්‍රමිකයන්ගේ සැපයුම ප්‍රධාන කර්මාන්ත අංශවල ප්‍රධාන වෘත්තීන් පිළිබඳ ඉදිරි වසර පහ සඳහා පුරෝකථනය කිරීම දිස්ත්‍රික් පදනමමත අංශ වාර්ථා සකස්කිරීමට ප්‍රධාන කර්මාන්ත අංශ සමීක්‍ෂණ 3 ක් පවත්වන ලදී.
i. පළාතේ දැනට පවතින ජීවනෝපාය වෘත්තීන් හඳුනාගෙන ඔවුන්ගේ අදාල වෘත්තීය සඳහා කුසලතාවයේ අවශ්‍යතාව උපදේශනයෙන් සහ ඉලක්ක කණ්ඩායම් සමඟ සාකච්ඡා කිරීම මඟින් ඇගයීමට ලක් කරන ලදී.
ii. අංශ වාර්ථා පිළිගැනීමට ලක්කිරීමට සහ ඉල්ලුම් පාර්ශව විශ්ලේෂණයන් සිදුකිරීමට ඉලක්ක කණ්ඩායම් සහ විද්වත් හමු පවත්වන ලදී.

iii. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු පද්ධතියේ නිපුණතා සැපයුම ප්‍රධාන වශයෙන් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු හැකියාවන් ගුණාත්මක හා වෙනත් ඒ හා සම්බන්ධ ගැටළු හා කාර්යයමණ්ඩල සංවර්ධන අවශ්‍යතා ව්‍යුහගත ප්‍රශ්නාවලී සමීක්ෂණයක් තුලින් විශ්ලේෂණය කරනලදී.

iv. වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්ම පිළිගැනීමට ලක්කිරීමට වලංගුබාවය තහවුරු කිරීමේ වැඩමුළු පවත්වන ලදී.

## 1.5 තොරතුරු සහ ක්‍රමවේද

අධ්‍යයනය සඳහා විවිධ මූලාශ්‍ර වලින් දත්ත එකතු කිරීමට මූලික දත්ත රැස්කිරීමේ ක්‍රම සහ ද්විතීයික දත්ත රැස්කිරීමේ ක්‍රම යන දෙකම අවශ්‍ය විය. අධ්‍යයනය සඳහා දත්ත රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීමට පහත ක්‍රම අනුගමනය කරන ලදී.

i. **සමාජ-ආර්ථික සහ වෙනත් ද්විතීයික දත්ත**: පළාතේ පරිපාලන ව්‍යුහය පිළිබඳ දත්ත ලබාගැනීම සඳහා; පළාතේ භූගෝලීය හා දේශගුණික තත්ත්ව; පළාතේ ජන සංයුතිය; ආර්ථික ව්‍යුහය; රැකියා හා ආදායම්; පළාතේ සාක්ෂරතාව; පළාතේ පාසල් සහ ශිෂ්‍ය සංඛ්‍යාව; සිසු-ගුරු අනුපාතය; ශිෂ්‍ය කාර්යසාධනය; විශ්වවිද්‍යාල ප්‍රවේශය; බැහැර වන්නන්; වෘත්තීය පුහුණුව සපයන්නන් සඳහා යෝග්‍ය පාරිභෝගිකයන් ඇතුළු අධ්‍යාපන පද්ධතිය.ව්‍යාපෘති කණ්ඩායම උතුරු මැද පළාත් සභාවේ සහ එහි අමාත්‍යාංශවල දත්ත භාවිතා කිරීම, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකු මූලාශ්‍ර, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ප්‍රධාන කර්මාන්ත අංශවල හා විභාග දෙපාර්තමේන්තුව වත්මන් රැකියා විස්තර

ii. **පුහුණු සැපයුම් දත්ත:** කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන ජාලය පිළිබඳ දත්ත, පළාතේ ශ්‍රම වෙළෙඳපොළ සඳහා පුහුණු/නිපුණ ශ්‍රම බලකාය සැපයීමට හැකියාව, දිස්ත්‍රික්ක තුල දැනට පවතින පාඨමාලා සංකලනය, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු සේවා සපයන්නන් වෙතින් වාර්ෂික පුහුණු නිමැවුම/ ප්‍රතිදානය, පළාතේ තක්සේරුකරුවන් සහ ගුරුවරුන් සංඛ්‍යාවේ සුලභතාවය, පළාතේ ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාණය/ වපසරිය, විශේෂ කණ්ඩායම් (අඩු ආදායම්/ පහසුකම් සහිත, ආබාධ, අවදානමට ලක්විය හැකි ආදිය) සඳහා පුහුණු ප්‍රතිපාදන පළාතේ ක්‍රියාත්මක වන රාජ්‍ය හා පෞද්ගලික තෘතීයික හා වෘත්තීය පුහුණු ආයතන වලින් රැස් කරන ලදී.

iii. **ප්‍රධාන ආර්ථික අංශවලට නිපුණ ශ්‍රම බලකාය සඳහා වන ඉල්ලුම**: ප්‍රධාන කර්මාන්ත අංශවල වත්මන් රැකියා තොරතුරු ආවරනය වන පරිදි පළාතේ ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍රවල මධ්‍යකාලීන

හා දිගුකාලීන අපේක්ෂා, පවතින පිරිස්බලය, ප්‍රධාන කර්මාන්ත අංශවල සංක්‍රමණික සේවකයින්ගේ කෙටි චරිත සටහන් (ජීව දත්ත) සහ නැඟී එන වෘත්තීන් හෝ පුහුණු ක්ෂේත්‍ර හඳුනාගන්නා ලදී.

ඉහත දක්වා ඇති විෂයයන් සම්බන්ධයෙන් ලබාගත් ද්විතීයික දත්ත ප්‍රතිපූරනයට අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුල පිහිටා ඇති කර්මාන්ත ආයතන මුළු ජනගහනයෙන් ආවරණය වන පරිදි පුළුල් සමීක්ෂණයක් සිදුකරන ලදී. ගණන්ගන්නා නිළධාරීන් සමීක්ෂණය සඳහා භාවිතා කරන ලදී.

iv. **මූලික තොරතුරු දැනගැනීමේ සාකච්ඡා සහ සිද්ධි අධ්‍යයන:**
කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන වලින් හා ව්‍යාපාරික නියෝජිතයින්ගෙන් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් තෝරාගත් සංඛ්‍යාවක් සමඟ මෙම මූලික තොරතුරු දැනගැනීමේ සාකච්ඡා පවත්වන ලදී. දිස්ත්‍රික්ක දෙකෙන් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වෙත අනුයුක්ත නිපුණතා සංවර්ධන සහකාරවරු 40 ක නියැදියක් සමඟ අවශ්‍ය පුහුණු ශ්‍රම සම්පත්, ප්‍රධානපෙළේ කර්මාන්ත, සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතනවල පුහුණුව හා පහසුකම්, ඔවුන්ගේ සංජාතනය සඳහා ඇති ඉල්ලුම පිළිබඳ ඔවුන්ගේ අදහස් රැස් කිරීමට සාකච්ඡා කළහ.

v. **ජීවනෝපාය වෘත්තීන්:** ජීවනෝපාය වෘත්තීන් හි පුහුණු අවශ්‍යතා පිළිබඳව දත්ත රැස්කිරීම සඳහා විවිධ වෘත්තීන් ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක දෙකෙන්ම ප්‍රතිචාර දක්වන්නන් 60ක නියැදියක් සඳහා ව්‍යුහගත නොවන ප්‍රශ්නාවලියක් මඟින් සමීක්ෂණය සිදුකරන ලදී.

vi. **දත්ත විශ්ලේෂණය:** මෙම අධ්‍යයනය මඟින් තෘතීයික හා වෘත්තීය පුහුණු සැපයුම සහ එම පුහුණුව සඳහා වන ඉල්ලුම අතර පරතරය හඳුනාගැනීමට අපේක්ෂා කෙරෙන බැවින් දත්ත විශ්ලේෂණ සඳහා අප විශ්ලේෂණ තාක්ෂණය ආරම්භකරන ලදී. සංඛ්‍යානමය ක්‍රම මෙන්ම ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමද විශ්ලේෂණය සඳහා යොදාගන්නා ලදී. සංඛ්‍යාලේඛන නිරීක්ෂණ ආකෘතිය භාවිතයෙන් පුරෝකථනයන් සිදුකරන ලදී.දැනට පවතින කාර්මික හා වෘත්තීය පුහුණු ව්‍යුහය, අන්තර්ගතය සහ බෙදාහැරීමේ ක්‍රම විධි, නව තෘතීයික හා වෘත්තීය පුහුණු වැඩසටහන් හඳුන්වාදීම සඳහා අවශ්‍ය සහ ආයතනික ව්‍යුහය තුල වන පරතරය පිරවීමට අවශ්‍යවන ප්‍රතිපත්තිමය සහභාගීවීම් සහ තත්ත්ව සහතික රාමුව අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමට අපට හැකිවිය. කර්මාන්ත අංශය විසින් ශ්‍රම වෙළෙඳපොළ පුළුල් කිරීමේ හා පුහුණු ශ්‍රමිකයින් සඳහා වන ඉල්ලුම පුරෝකථනය කිරීමට ආර්ථිකමිතික ක්‍රම භාවිතාකර ඇත.

## 1.6 වාර්ථාව පිළිබඳ දළ සටහනක්

වාර්ථාවේ ඉතිරි කොටස් පරිච්ඡේද පහක් යටතේ සංවිධානයක් පෙළගන්වා ඇත. වාර්ථාවේ දෙවන පරිච්ඡේදය මඟින් පළාතේ සමාජ ආර්ථික පරිසරය සහ ප්‍රධාන ව්‍යාපාර ක්ෂේත්‍රවල පවතින ඉල්ලුම මත පදනම් වූ අධ්‍යාපන හා පුහුණු අවශ්‍යතා පිළිබඳ අවධානය යොමුකිරීම තුලින් පස් අවුරුදු අනාවැකි සහිතව විස්තරකර පැහැදිලි කරයි. විශ්ලේෂනය සඳහා ද්විතීයික දත්ත යොදාගන්නා ලදී. තුන්වන පරිච්ඡේදය මඟින් උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන ජීවනෝපාය වෘත්තීන්හි පුහුණු අවශ්‍යතා සාකච්ඡා කෙරේ. හතරවන පරිච්ඡේදය වාර්ථව මඟින් පුහුණු අවශ්‍යතා හා රැකියා අපේක්ෂාවන් ඉලක්ක කර ගනිමින් සෑම කර්මාන්ත අංශයක් සඳහාම වන වත්මන් හා අනාගත පුහුණු ශ්‍රම ඉල්ලුම විශ්ලේෂණය කරයි. පස්වන පරිච්ඡේදයෙන් පළාතේ පවතින වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා, පාඨමාල ප්‍රවර්ධනය කිරීමට විවිධ පාඨමාලා/ වැඩමුළු පැවැත්වීම, සැපයුම් ප්‍රමිති හා මඟපෙන්වීම.උපදේශනය කටයුතු ගුණාත්මකභාවය හා අදාලත්වය සම්බන්ධ කරුණු විශ්ලේෂණය කරයි. වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු පාඨමාලා සඳහා ඇති ඉල්ලුම හා සැපයීම අතර දැනට පවතින පරතරයද මෙම කොටසේදී විශ්ලේෂණය කෙරේ. අවසාන පරිච්ඡේදයේදී කාර්යක්ෂම හා ඵලදායි අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සැපයීමට අවශ්‍ය සාර්ව සහ ක්ෂුද්‍ර වෙනස්කම් සහ මැදිහත්වීම් ඇතුළු වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අවශ්‍යතා අනුව යමින් උතුරු මැද පළාත සඳහා යෝජිත වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්ම සපයයි.

# 02 වන පරිච්ඡේදය

# උතුරු මැද පළාතේ සමාජ ආර්ථික පරිසරය

## 2.1 පසුබිම

ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත අනුරාධපුරය සහ පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත වේ. උතුරු මැද පළාත ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික අධිකාරයක් ඇති ප්‍රදේශයක් වන අතර එහි ප්‍රධාන බෝගය වීය. මීට අමතරව පළාතේ කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපොළ නොවන ආර්ථික කටයුතු හා සංචාරක කලාපයේ රැකියාවන් සැපයේ. එහි ඉතා ඉහළ සාමාන්‍ය උෂ්ණත්වය සහිත රටේ වියළි කලාපයේ විශාල කොටසක් අත්පත් කරගෙන ඇත. පළාතේ ඉහළින්ම මූලිකව නියෝජනය වන කාණ්ඩය වන්නේ ගොවි ජනතාවයි. අවිධිමත් ආර්ථික කටයුතු සහ නුපුහුණු ශ්‍රමය විසින් කර්මාන්ත අංශය විශාල වශයෙන් පාලනය කරනු ලැබේ.

## 2.2 පළාත් පරිපාලන ව්‍යූහය

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස් කරන අවස්ථාවේ සිට පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය සහ පශ්චාත් ස්වාධීන කාලය පුරාම පරිපාලන ව්‍යූහය සඳහා සංශෝධන ඉදිරිපත්කර ඇත. ශ්‍රී ලංකාවේ අධිකරණ හා පරිපාලන ව්‍යූහය පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ අංග සම්බන්ධකර ඇති ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවමත පදනම් වේ. ජනරජයේ විධායක ජනාධිපති, ජනතාව විසින් තෝරාපත්කර ගනුලබන අතර වසර හයක නිල කාලයක් දැරීමෙන් පසු නැවත මැතිවරණයක් සඳහා හිමිකම් ලැබේ. ජනතාව විසින් තෝරාපත්කර ගත් සාමාජිකයින් 196 දෙනෙකුගෙන් සහ ජාතික ලැයිස්තුවෙන් පත්කරනු ලැබූ සාමාජිකයින් 29 දෙනෙකුගෙන් පාර්ලිමේන්තුව සමන්විත වේ. ජනාධිපති තුමා විසින් අග්‍රාමාත්‍යතුමා සහ කැබිනට් අමාත්‍ය මණ්ඩලයත් කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා කවුරුන්ද යන වගත් පත්කරනු ලැබේ (2.1 රූපය). අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ මධ්‍යම රජයේ ව්‍යවස්ථාපිත ආයතනද රටේ සියළුම පළාත්වල කර්මාන්ත සංවර්ධනය මෙන්ම වෘත්තීය හා කාර්මික අධ්‍යාපනය සැලසුම් කිරීම සහ පරිපාලනය කිරීම සඳහා වගකිව යුතුවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ගත්කල මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා සඳහා විශේෂිත කාර්යයන් නිර්දේශකර ඇත. සියළු විෂයයන් හා කාර්යයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස්කිරීම මධ්‍යම රජය මඟින් නියමකර ඇති අතර නියමිත ලැයිස්තුවේ පළාත් විෂයයන් ලෙස ලැයිස්තුගතකර ඇති විෂය ක්ෂේත්‍රයකට සමගාමී බලතල ලැයිස්තුව පිළිබඳ නීති අනුමත කිරීමට බලය ද එයට ඇත. මධ්‍යම රජයේ අනිවාර්ය කාර්යයන් වන්නේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, අන්තර්-රාජ්‍ය ස්ථානමාරු

නිර්මාණය මධ්‍යම ආණ්ඩුව සහ පළාත් අතර ස්ථාපිත කිරීම සහ කළමණාකරණය, රාජ්‍ය සේවක සංඛ්‍යාවන් සහ ඔවුන් බවා ගැනීම් සහ 'අභ්‍යන්තර කටයුතු වල' පරිපාලනයයි.

**රූපසටහන 2.1: මධ්‍යම රජයේ පරිපාලන ව්‍යුහය**



**රූපසටහන 2.2: පළාත් සභා පරිපාලන ව්‍යූහය**




දිවයිනේ පාලන කටයුතු සඳහා එය පළාත් නවයකට සංවිධානයකර ඇත. උසස් අධ්‍යාපනය සහ වෘත්තීය හා කාර්මික අධ්‍යාපනය මූලිකවම මධ්‍යම ආණ්ඩුව යටතේ වන අතර පළාතේ සාමාන්‍ය අධ්‍යාපන සැලසුම් සළු පරිපාලන කටයුතු සඳහා පළාත් සභාවලට හිමිකම් පවතී. මානව සම්පත් සංවර්ධනය සඳහා එම පළාතේ වෘත්තීය හා කාර්මික අධ්‍යාපන ප්‍රතිපත්ති සැලසුම් කිරීම් සහ ක්‍රියාත්මක කිරීම් තුල පළාත් සභාව සාමාන්‍ය අධ්‍යාපනයට දායක වුවද එමඟින් රඨයේ ව්‍යූහයට එය වැදගත් අංගයක් ලෙස සැලකේ.

සෑම පළාතකම ජනතාව විසින් තෝරාපත්කරගත් සභාකයන්ගෙන් සමන්විත පළාත් සභා පැවතීම, බලය බෙදා හැරීමේ ඒකකයක් ලෙස පළාත් සභාව තෝරාගැනීමට ඉවහල් වේ. ජනාධිපතිතුමා විසින් පත්කරන ලද ප්‍රධානියා පළාත් ප්‍රධානියා ආණ්ඩුකාරවරයා වන අතර, පළාත් සභාවේ තේරී පත්වූ සාමාජිකයන්ගෙන් පත්වූ ප්‍රධානියා ප්‍රධාන අමාත්‍ය වේ. බොහෝ පළාත් අධ්‍යාපනය, සෞඛ්‍ය සහ අන් සියළු සංවර්ධන ප්‍රයත්නයන් සඳහා සැලසුම්කිරීම් සහ ක්‍රියාත්මක කිරීම් සඳහා පළාත් සභාව වගකීම් දරනු ලැබේ. පළාත් සභා ස්ථාපිත කිරිම සමඟ රටේ පරිපාලනය විමධ්‍යගත කරනලදී. මධ්‍යම රජය සහ පළාත් සභා අතර වගකීම් පැවතීම ව්‍යවස්ථාදායකය, විධායකය රාජ්‍ය මූල්‍ය හා පරිපාලන කටයුතු විසින් අර්ථ දක්වා ඇත. පළාත් සභා වෙත වගකීම් පැවරීමේ විෂය පථය සහ ප්‍රමාණය සහ මධ්‍යම රජය විසින් රඳවා තබාගත යුතු දේ පිළිබඳව ඔවුන් අර්ථ දක්වා ඇත.

**වගුව 2.1: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් සහ ග්‍රාම නිළධාරී වසම් සංඛ්‍යාව**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වර්ග කි.මී. | ග්‍රාම නිලධාරි වසම් | ගම්මාන |
|---|---|---|---|
| පදවිය | 231 | 15 | 39 |
| කැබිතිගොල්ලෑව | 560 | 26 | 90 |
| මහවිලච්චිය | 635 | 17 | 112 |
| මැදවච්චිය | 507 | 37 | 112 |
| නුවරගම් පළාත මධ්‍යම | 378 | 40 | 165 |
| රඹෑව | 255 | 38 | 142 |
| කහටගස්දිගිලිය | 331 | 40 | 127 |
| හොරොව්පතාන | 855 | 38 | 100 |
| ගලෙන්බිඳුනුවැව | 277 | 41 | 157 |
| මිහින්තලේ | 253 | 25 | 149 |
| නුවරගම් පළාත නැගෙනහිර | 106 | 29 | 72 |
| නාච්චදූව | 82 | 19 | 52 |
| නොච්චියාගම | 869 | 36 | 111 |
| රාජාංගනය | 89 | 21 | 34 |
| තඹුත්තේගම | 112 | 26 | 62 |
| තලාව | 247 | 39 | 121 |
| තිරප්පනේ | 308 | 41 | 105 |
| කැකිරාව | 349 | 53 | 143 |
| පලුගස්වැව | 197 | 16 | 39 |
| ඉපලෝගම | 134 | 32 | 116 |
| ගල්නෑව | 145 | 30 | 85 |
| පලාගල | 258 | 35 | 98 |
| **මුළු එකතුව** | **7179** | **694** | **2231** |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

උතුරු මැද පළාත අනුරාධපුර සහ පොළොන්නරුව ලෙස පරිපාලන දිස්ත්‍රික්ක දෙකකට බෙදා ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 ක් ද, ග්‍රාම නිළධාරී වසම් 694 ක් සහ ගම්මාන 2231 ක් වේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 7 ක් ද ග්‍රාම නිළධාරී වසම් 295 ක් සහ ගම් 657 ක් ඇත (වගුව 2.1 සහ වගුව 2.2 බලන්න).

වගුව **2.2:** පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාම නිළධාරී වසම් සහ ගම්මාන සංඛ්‍යාව

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වර්ග කි.මී. | ග්‍රාම නිලධාරි වසම් | ගම්මාන |
|---|---|---|---|
| තමන්කඩුව | 445 | 55 | 125 |
| දිඹුලාගල | 578.9 | 56 | 97 |
| හිඟුරක්ගොඩ | 696 | 53 | 141 |
| මැදිරිගිරිය | 537 | 45 | 111 |
| වැලිකන්ද | 548 | 30 | 46 |
| ඇළහැර | 349 | 28 | 88 |
| ලංකාපුර | 184 | 28 | 49 |
| **මුළු එකතුව** | **3337.9** | **295** | **657** |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## 2.3 ජෛවීය හා භෞතීය පරිසරය

විවිධ පුරාවෘත්තවලට අනුව ක්‍රි. පූ. 4 වන සියවසේ දී අනුරාධපුරය ශ්‍රී ලංකාවේ අගනුවර බවට පත්ව ඇති බව පැවසේ. ශ්‍රී ලංකා ඉතිහාසය අනුව ක්‍රි. පූ. 4 වන සියවසේ සිට ක්‍රි. පූ. 10 වන සියවස දක්වා කාලය අනුරාධපුර යුගය ලෙස සාමාන්‍යයෙන් සඳහන්කර ඇත. 250-210 කාලයේදී රජකල දේවානම්පියතිස්ස රජුගේ කාලයේදී බුදු දහම හඳුන්වාදෙන ලදී. අදටත් නොනැසී පවතින විශාල වැව් බොහෝමයක්ගෙන් කිහිපයක් ලොව පවතින පැරණිතම වැව් විය හැකිය. ශ්‍රී ලංකාවේ උතුරු මාර්ගයේ ප්‍රධාන මහා මාර්ග සන්ධිය නව නගරය (ජනගහනය 40,000) වන අතර එය දුම්රිය මාර්ගය ඔස්සේ ද වැටී ඇත. ශ්‍රී ලංකා පුරාවිද්‍යා ගවේෂණ මූලස්ථානය අනුරාධපුරයේ පිහිටා ඇත. අද එහි පවතින මාලිගා, ආරාම හා ස්මාරක සමඟ අනුරාධපුරයේ අලංකාර පූජා නගරය බොහෝ බෞද්ධ වන්දනාකරුවන් නරඹන්නන් හා සංචාරකයින්ගේ ආකර්ෂණය ලබා ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ උෂ්ණත්වය වසරපුරා 20 $^0$C සිට 3 $^0$C දක්වා පවතී. වසරේ වඩාත් උණුසුම් කාලය සාමාන්‍යයෙන් අප්‍රේල් වන අතර සාමාන්‍ය උෂ්ණත්වය 29 $^0$C වන අතර නමුත් 34 $^0$C උපරිමයක් දක්වා ඉහළ යා හැකිය. අනෙක් අතට වසරේ වඩාත් ශීත කාලය ජනවාරි වන අතර සාමාන්‍ය උෂ්ණත්වය 25 $^0$C පමණවේ. නමුත් 20 $^0$C දක්වා පහළ බැසිමට හැකියාව ඇත. පුරාණ චාරි ශිෂ්ඨාචාරය හා විවිධ උරුමයන් සමඟ හිතකර කාලගුණික තත්ත්වය අනුරාධපුරය ශ්‍රී ලංකාව තුල ප්‍රධාන සංචාරක ගමනාන්තයක් බවට පත්කර ඇත. ඔක්තෝබර් සිට අප්‍රේල් දක්වා වර්ෂාපතන සමය වන අතර අනුරාධපුරයේ වියළි දේශගුණය මැයි සිට සැප්තැම්බර් දක්වා පවතී. රටෙහි සහල් සහ එළවළු වගාවෙන් විශාල කොටසක් මෙම පලාතින් සපයනු ලබයි. අතීතයේදී මෙන් නොව ජනතාව

විවිධ රැකියා වල නියතව සිටින අතර අද වන විට රටෙහි දළ දේශිය නිෂ්පාදනයට විවිධ ක්‍රමවලින් දායකත්වය ලබාදෙයි.

පොළොන්නරුව දිස්ත්‍රික්කයට වර්ග කි. මී. 3.403 ක ප්‍රමාණයක ප්‍රදේශයකින් සමන්විත වේ. එය දිවයිනේ ඊසාන දිශාවේ වියළි කලාපීය තලයේ පිහිටා ඇත. නොයෙකුත් ජනාවාස සඳහා පොළොන්නරුව සාක්ෂිදරන අතර 12 වැනි සහ 13 වැනි සියවස් තුල සිංහල රජවරුන්ගේ ජයග්‍රාහී පාලනයන් විශිෂ්ඨ වේ. 12 වන සියවසේ දී පළවන පරාක්‍රමබාහු විසින් නිර්මාණය කරන ලද අගනගරය ඓතිහාසික වඩාත් විශ්මය ජනක නාගරික නිර්මාණ වලින් එකකි. විජයබාහු රජ සමයේදී බුදුරජාණන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කරනලද අටදාගෙය සිංහ රාජාණ්ඩුවේ අන්තිමවාරම ලෙස සැලකේ.
උතුරු මැද පළාතේ දෙවන විශාලම නගරය වන්නේ පොළොන්නරුවයි. එය දිවයිනේ පිරිසිදු සහ අලංකාර නගරවලින් එකක් ලෙස හැඳින්වේ. මෙහි පවතින හරිත පරිසරය, විශ්මිත පුරාණ ඉදිකිරීම්, පරාක්‍රම සමුද්‍රය සහ ආගන්තුක සත්කාරට ලැදි ප්‍රියමනාප ජනතාව හැමවිටම දේශීය හා විදේශීය සංචාරකයින් ආකර්ෂණය කරගනී. ඉතිහාසගත ආකාරයට පොළොන්නරුව වසර පුරාම නිවර්තන දේශගුණය සහිත වන අතර දෙසැම්බර් සිට ජනවාරි දක්වා සමහර විට ශීතල ස්වභාවයක් දක්නට ලැබුණි. මෑත කාලයේදී වර්ෂාපතනය සහ සිසිල්බව වැඩිවීමක් නිරීක්ෂණය කරන ලදී.

## 2.4 උතුරු මැද පළාතේ ජන සංයුතිය

කලාපයේ ජනගහනය ව්‍යාප්තව පැවතියද, උතුරු මැද පළාත ශ්‍රී ලංකාවේ විශාලතම පළාත් වලින් එකකි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමස්ථ ජනගහනය 875,861 වන අතර එය පවුල් 238,772 ට අයත් වේ (වගුව 2.3). ජනගහනයෙන් විශාලතම ප්‍රමාණයක් සිංහල වන අතර දෙමළ, මුස්ලිම් සහ අනෙකුත් ජාතීන් ද දිස්ත්‍රික්කයේ ජීවත් වේ (වගුව 2.4). මෙහි සාමාන්‍ය සාක්ෂරතාවය 90% ක් පමණ වේ (වගුව 2.5).

**වගුව 2.3: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනගහනය**

| දේශීය ලේකම් කොට්ඨාශය | ඇස්තමේන්තුගත | |
|---|---|---|
| | පවුල් සංඛ්‍යාව | ජනගහනය |
| පදවිය | 6 418 | 25317 |
| කැබිතිගොල්ලෑව | 4954 | 21741 |
| මහවිලච්චිය | 6173 | 22258 |
| මැදවච්චිය | 13494 | 48451 |
| නුවරගම් පළාත මධ්‍යම | 16557 | 57837 |
| රඹෑව | 11727 | 38509 |

| දේශීය ලේකම් කොට්ඨාශය | ඇස්තමේන්තුගත | |
|---|---|---|
| | පවුල් සංඛ්‍යාව | ජනගහනය |
| කහටගස්දිගිලිය | 11346 | 42939 |
| හොරොව්පතාන | 9932 | 35376 |
| ගලෙන්බිඳුනුවැව | 13951 | 52558 |
| මිහින්තලේ | 8860 | 32494 |
| නුවරගම් පළාත නැගෙනහිර | 15273 | 67388 |
| නාච්චිදූව | 7165 | 25464 |
| නොච්චියාගම | 14471 | 49802 |
| රාජාංගනය | 9436 | 36544 |
| තඹුත්තේගම | 14147 | 49586 |
| තලාව | 16094 | 57870 |
| තිරප්පනේ | 8088 | 25948 |
| කැකිරාව | 15503 | 60324 |
| පලුගස්වැව | 4323 | 16059 |
| ඉපලෝගම | 10660 | 35994 |
| ගල්නෑව | 10304 | 36260 |
| පලාගල | 9906 | 37142 |
| මුළු එකතුව | **238772** | **700257** |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

වගුව **2.4:** අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජන වර්ගය අනුව ජනගහන විස්තරය

| සිංහල | දෙමළ | ඉන්දියානු දෙමළ | මුස්ලිම් | මැලේ | බර්ගර් | වෙනත් | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 676073 | 5073 | 443 | 61989 | 279 | 179 | 1657 | **745693** |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

වගුව **2.5:** අනුරාධපුර දිස්ත්‍රික්කයේ සාක්ෂරතාව සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය

| සාක්ෂරතාව | මුළු එකතුව (%) | ස්ත්‍රී පුරුෂ භාවය | |
|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී |
| සාක්ෂරතාව | 90.5% | 92% | 88.8% |
| නූගත් | 9.5% | 8% | 11.2% |
| මුළු එකතුව | 100% | 100% | 100% |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

වගුව 2.6: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනගහන ව්‍යාප්තිය

| ප්‍රාදේශීය සභා බලප්‍රදේශය | පවුල් සංඛ්‍යාව | ජනගහනය |
|---|---|---|
| තමන්කඩුව | 19244 | 85631 |
| දිඹුලාගල | 20265 | 89039 |
| හිඟුරක්ගොඩ | 17138 | 69176 |
| මැදිරිගිරිය | 16386 | 73129 |
| වැලිකන්ද | 9794 | 35976 |
| ඇළහැර | 11536 | 44805 |
| ලංකාපුර | 8540 | 39915 |
| **මුළු එකතුව** | **102903** | **437671** |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

වගුව 2.7: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වයස අනුව ජනගහන ව්‍යාප්තිය

| ප්‍රාදේශීය සභා බලප්‍රදේශය | වයස අවු. 20 ට අඩු | වයස අවු. 20 ට වැඩි | මුළු ජනගහනය |
|---|---|---|---|
| තමන්කඩුව | 27463 | 47275 | 74739 |
| දිඹුලාගල | 32349 | 45365 | 77713 |
| හිඟුරක්ගොඩ | 21110 | 39268 | 60377 |
| මැදිරිගිරිය | 24625 | 39202 | 63827 |
| වැලිකන්ද | 13434 | 17967 | 31400 |
| ඇළහැර | 14899 | 24207 | 39106 |
| ලංකාපුර | 13747 | 21092 | 34838 |
| **මුළු එකතුව** | **147624** | **234375** | **382000** |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

වගුව 2.8: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනවර්ගය අනුව ජනගහන ව්‍යාප්තිය

| සිංහල | දෙමළ | ඉන්දියානු දෙමළ | මුස්ලිම් | මැලේ | බර්ගර් | වෙනත් | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 393532 | 8606 | - | 34460 | 28 | 34 | 11 | **437671** |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

වගුව **2.9:** පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සාක්‍ෂරතාව සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය (වයස අවුරුදු **10** සහ ඉහළ)

| සාක්‍ෂරතාව | **මුළු එකතුව %** | ස්ත්‍රී පුරුෂ භාවය | |
|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී |
| සාක්ෂරතාව | 90.0 | 91.2 | 88.7 |
| නූගත් | 10.0 | 8.8 | 11.3 |
| **මුළු එකතුව** | 100 | 100 | 100 |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

උතුරු මැද පළාත සාපේක්‍ෂව උගත් ජනගහනය සහිත ප්‍රදේශයක් ලෙස වර්ථමානයේ හැඳින්වේ. සාමාන්‍ය වාර්ෂික පාසල් ප්‍රජාව සාපේක්‍ෂව ඉහළ බවක් දක්නට ලැබේ. පළාතේ පදිංචි ස්ථාන/ප්‍රදේශ කෘෂිකාර්මික සහ වාරිමාර්ග සැලසුම් දියත් කිරීම සහ රජයේ අනුග්‍රාහක ගොවීන් පදිංචිකරීම්/ ස්ථානගත කිරීම් අනුව ඒකරාශි වී ඇත. එසේම නගර පිහිටුවීම ප්‍රධාන ප්‍රාදේශීය සහ ප්‍රදේශවල සිදුකර ඇත. එමඟින් පළාතේ කුසලතා සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමට/ ස්ථානගත කිරීම සඳහා උතුරු මැද පළාත භූගෝලීයව සුවිශේෂී සහ ප්‍රජාමූලික කිරීම සිදුකර ඇත.

## 2.5 උතුරු මැද පළාතේ අධ්‍යාපන අංශය

උතුරු මැද පළාත සාපේක්‍ෂව අඩු දිළිඳුතා මට්ටමක පැවතීම සමඟම වාරිමාර්ග වලින් පෝෂිත කෘෂිකාර්මික දිස්ත්‍රික්කයක් වීම සහ දිවයිනේ සියළුම ප්‍රදේශවලින් පැමිණි ජනගහන ව්‍යාප්තියක්/ විවිධත්වයක් ස්ථානගත වීමේ ප්‍රතිඵලය ලෙස පුද්ගලයන්ට අධ්‍යාපනයට අනුගතවීමට වඩාත් උචිත පරිසරයක් නිර්මාණයකර සපයා ඇත.

කෙසේ වුවද භෞතික සහ මානව සම්පත් ඇතුළු අධ්‍යාපන පහසුකම් ඒකාකාර නොවේ. ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි වැනි සමහර ක්ෂේත්‍ර සඳහා සුදුසුකම්ලත් ගුරුවරු හිඟවීම පළාතට ගැටළුවක් වී ඇත. එසේම අ. පො. ස. (උ. පෙළ) විද්‍යා විෂයධාරාව සහ ගණිත විෂයධාරාව හැදෑරීමට අවශ්‍ය පහසුකම් ද සාමාන්‍යයෙන් අඩු මට්ටමක පවතී.

වගුව 2.10: වර්ගය අනුව පළාතේ සමස්ථ පාසැල් සංඛ්‍යාව

| පාසැල් වර්ගය | | පාසැල් සංඛ්‍යාව |
|---|---|---|
| | | **798** |
| ජාතික | ජාතික පාසැල් | 10 |
| පළාත් | 1AB වර්ගයේ පාසැල් | 25 |
| | 1C වර්ගයේ පාසැල් | 158 |
| | 2 වර්ගයේ පාසැල් | 265 |
| | 3 වර්ගයේ පාසැල් | 340 |

*මූලාශ්‍රය : පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත*

උතුරු මැද පළාතේ පවතින පාසැල් 798 අතරින් 10 ක් ජාතික පාසැල් වන අතර ඉතිරිය පළාත් පාසැල් වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසැල් 778 ක් පවතින අතර. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසැල් 232 ක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 7 ක් තුල පවතී. බොහොමයක් පාසැල් දෙවර්ගයේ සහ තුන් වර්ගයේ වන අතර අ. පො. ස. (උ. පෙළ) විද්‍යා සහ ගණිත විෂයධාරාව සහිත පාසැල් සංඛ්‍යාව ඉතා අඩුය.

වගුව 2.11: අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසැල් සංඛ්‍යාව

| වර්ගය | පාසැල් සංඛ්‍යාව |
|---|---|
| **1AB** | 34 |
| **1C** | 158 |
| **2** | 332 |
| **3** | 254 |
| **මුළු එකතුව** | **778** |

*මූලාශ්‍රය : පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත*

වගුව 2.12: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසැල් සංඛ්‍යාව

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ජාතික පාසැල් | 1 ශ්‍රේණිය A&B | 1 ශ්‍රේණිය C | 2 ශ්‍රේණිය | 3 ශ්‍රේණිය | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| තමන්කඩුව | 1 | 2 | 10 | 11 | 6 | 30 |
| දිඹුලාගල | 0 | 2 | 13 | 14 | 27 | 56 |
| හිඟුරක්ගොඩ | 2 | 2 | 2 | 20 | 6 | 32 |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ජාතික පාසැල් | 1 ශ්‍රේණිය A&B | 1 ශ්‍රේණිය C | 2 ශ්‍රේණිය | 3 ශ්‍රේණිය | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| මැදිරිගිරිය | 1 | 0 | 7 | 12 | 12 | 32 |
| වැලිකන්ද | 0 | 0 | 4 | 8 | 25 | 37 |
| ඇළහැර | 0 | 1 | 3 | 14 | 10 | 28 |
| ලංකාපුර | 0 | 1 | 7 | 7 | 2 | 17 |
| **මුළු එකතුව** | **4** | **8** | **46** | **86** | **88** | **232** |

*මූලාශ්‍රය : පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත*

**වගුව 2.13: උතුරු මැද පළාතේ අ. පො. ස. (උ. පෙළ) තාක්‍ෂණ විෂයධාරාව සහිත පාසැල් සංඛ්‍යාව**

| පාසැලේ නම | පිහිටීම | දිස්ත්‍රික්කය |
|---|---|---|
| මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය | මැදවච්චිය | අනුරාධපුර |
| කැබිතිගොල්ලෑව මධ්‍ය මහා විද්‍යාලය | කැබිතිගොල්ලෑව | අනුරාධපුර |
| රුවන්වැලි මධ්‍ය මහා විද්‍යාලය | හොරොව්පතාන | අනුරාධපුර |
| වලිසිංහ හරස්චන්ද්‍ර මහා විද්‍යාලය | අනුරාධපුර | අනුරාධපුර |
| විද්‍යාදර්ශ මහා විද්‍යාලය | නොච්චියාගම | අනුරාධපුර |
| තඹුත්තේගම මධ්‍ය මහා විද්‍යාලය | තඹුත්තේගම | අනුරාධපුර |
| තලාව මහා විද්‍යාලය | තලාව | අනුරාධපුර |
| ගල්නෑව මධ්‍ය මහා විද්‍යාලය | ගල්නෑව | අනුරාධපුර |
| ගන්තිරියාගම මහින්ද මහා විද්‍යාලය | ඉපලෝගම | අනුරාධපුර |
| මිහින්තලේ මහා විද්‍යාලය | මිහින්තලේ | අනුරාධපුර |
| ශ්‍රී රේවත නවෝද්‍යා පාසල | මදටුයිගම | අනුරාධපුර |
| ගල්කිරියාගම මධ්‍ය මහා විද්‍යාලය | ගල්කිරියාගම | අනුරාධපුර |
| ලීලාරත්න විජේසිංහ මහා විද්‍යාලය | හංසයාපාලුව | අනුරාධපුර |
| එප්පාවල ශ්‍රී සිද්ධාර්ථ මහා විද්‍යාලය | එප්පාවල | අනුරාධපුර |
| මින්නේරිය ජාතික පාසැල | හිඟුරක්ගොඩ | පොලොන්නරුව |
| ආනන්ද බාලිකා ජාතික පාසල | හිඟුරක්ගොඩ | පොලොන්නරුව |
| මැදිරිගිරිය ජාතික පාසල | මැදිරිගිරිය | පොලොන්නරුව |
| රෝයල් මධ්‍ය මහා විද්‍යාලය | පොලොන්නරුව | පොලොන්නරුව |
| පලුගස්දමන මහා විද්‍යාලය | පලුගස්දමන | පොලොන්නරුව |

| පාසැලේ නම | පිහිටීම | දිස්ත්‍රික්කය |
| --- | --- | --- |
| විලයාය මධ්‍ය මහා විද්‍යාලය | අරලගංවිල | පොලොන්නරුව |
| බකමූණ මහසෙන් මධ්‍ය මහා විද්‍යාලය | බකමූණ | පොලොන්නරුව |
| වැලිකන්ද මහා විද්‍යාලය | වැලිකන්ද | පොලොන්නරුව |

*මූලාශ්‍රය : අධ්‍යාපන අමාත්‍යාංශය*

වගුව 2.13 මඟින් ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්කවල අ. පො. ස. (උ. පෙළ) තාක්‍ෂණ විෂයධාරාව පාඨමාලාව ලබාදෙන පාසැල් සංඛ්‍යාව 14 කි. මේවා දිස්ත්‍රික්කයපුරා විහිදී පැවතීම නිසා බොහෝ ශිෂ්‍යයින්ට මෙම ප්‍රතිලාභය ලබාගත හැකිවේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තාක්‍ෂණ විෂයධාරාව පාඨමාලා ලබාදෙන පාසැල් සංඛ්‍යාව 8 කි. ඒවා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ තුනෙහිම පිහිටා ඇත. කෙසේ වෙතත් පාසැල්වල සුදුසුකම් ලත් ගුරුවරුන් නොමැතිකම මෙම විෂයධාරාව හැදෑරීම සඳහා අපේක්‍ෂා කරන සිසුන් මුහුණදෙන ප්‍රධාන බාධාවක් වේ.

**වගුව 2.14: 2015 අ. පො. ස. (උ. පෙළ) තාක්‍ෂණ විෂයධාරාවේ කාර්යසාධනය**

| දිස්ත්‍රික්කය | විභාගයට පෙනීසිටි සංඛ්‍යාව | ශ්‍රී ලංකාවේ සියළුම පාසැල්වල තාක්‍ෂණ විෂයධාරාවේ සමස්ථ ශිෂ්‍ය ප්‍රතිශතය | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය (%) |
| --- | --- | --- | --- | --- |
| අම්පාර | 354 | 2.78 | 154 | 43.50 |
| අනුරාධපුර | **900** | **7.08** | **447** | 49.67 |
| බදුල්ල | 655 | 5.15 | 374 | 57.10 |
| මඩකලපුව | 345 | 2.71 | 150 | 43.48 |
| කොළඹ | 1219 | 9.60 | 709 | 58.16 |
| ගාල්ල | 658 | 5.18 | 327 | 49.70 |
| ගම්පහ | 871 | 6.85 | 481 | 55.22 |
| හම්බන්තොට | 539 | 4.24 | 286 | 53.06 |
| යාපනය | 538 | 4.23 | 327 | 60.78 |
| කලුතර | 491 | 3.86 | 287 | 58.45 |
| නුවර | 682 | 5.37 | 342 | 50.15 |
| කෑගල්ල | 671 | 5.28 | 329 | 49.03 |
| කිලිනොච්චි | 84 | 0.66 | 38 | 45.24 |
| කුරුණෑගල | 1071 | 8.43 | 585 | 54.62 |
| මන්නාරම | 67 | 0.52 | 44 | 65.67 |
| මාතලේ | 373 | 2.93 | 231 | 61.93 |
| මාතර | 727 | 5.72 | 431 | 59.28 |

| දිස්ත්‍රික්කය | විභාගයට පෙනීසිටි සංඛ්‍යාව | ශ්‍රී ලංකාවේ සියළුම පාසැල්වල තාක්‍ෂණ විෂයධාරාවේ සමස්ථ ශිෂ්‍ය ප්‍රතිශතය | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| මොණරාගල | 269 | 2.11 | 153 | 56.88 |
| මුලතිව් | 60 | 0.47 | 33 | 55.00 |
| නුවර එළිය | 394 | 3.10 | 166 | 42.13 |
| පොලොන්නරුව | **340** | **2.67** | **172** | **50.59** |
| පුත්තලම | 385 | 3.03 | 177 | 45.97 |
| රත්නපුර | 701 | 5.52 | 476 | 67.90 |
| ත්‍රිකුණාමලය | 178 | 1.40 | 73 | 41.01 |
| වව්නියාව | 125 | 0.98 | 53 | 42.40 |
| **එකතුව** | **12697** | | **6845** | **43.50** |

*මූලාශ්‍රය : විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය*

2015 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් සිසුන් 900 දෙනෙකු තාක්‍ෂණ විෂයධාරාව යටතේ අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව 340 ක් විය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිසුන් 900 අතරින් සිසුන් 447 ක් එම විභාගය සමත්වී ඇති අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත් වූ සිසුන් 340 අතරින් සිසුන් 172 ක් විභාගය සමත්ව ඇත. දිස්ත්‍රික්ක දෙක තුල මෙම විශාල සමත් ප්‍රතිශතයන් මඟින් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතනයේ පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථා ලබාගත හැකිබව පෙන්නුම් කරයි. 2015 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සිසුන් 12697 ක් තාක්‍ෂණික විෂයධාරාවෙන් අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනීසිට ඇතත් එයින් 6845 ක් පමණක් (43.50%) ඉන් සමත්විය. රාජ්‍ය විශ්වවිද්‍යාල 13 හි පාඨමාලා 28 ක් හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2015/2016 (http://www.moeogov.lk) අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 2250 ක් පමණ තාක්‍ෂණ විෂයධාරාව යටතේ විශ්වවිද්‍යාල වලට ඇතුලත් කිරීමට අපේක්‍ෂා කරයි. ඉතිරි යටත් සිසුන් සඳහා රජයේ විශ්වවිද්‍යාල 25 ක් ස්ථාපිත කිරීම තවදුරටත් සිදුකිරීමට අපේක්‍ෂා කරයි.

කෙසේ වෙතත් අ.පො.ස. (උ. පෙළ) විභාගය සඳහා පෙනීසිටි සිසුන් 10477 ක මුළු ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඉන් සමත්වූ සිසුන් 21595 ක් රාජ්‍ය විශ්වවිද්‍යාලවලට තවමත් ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. සෑම දිස්ත්‍රික්කයකින්ම විශ්ව විද්‍යාලවලට ඇතුලත්වන ශිෂ්‍ය සංඛ්‍යාව ආසන්න ගණනය කිරීම අනුව දැනට ප්‍රකාශ කර නොමැත.

පළාතේ බොහෝමයක් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතනවල තවමත් අ.පො.ස. (උ. පෙළ) තාක්‍ෂණ විෂයධාරාව හැදෑරූ දරුවන් සඳහා පාඨමාලා පාඨමාලා පැවැත්වීමට සූදානමක් ඇති

බව දක්නට නොලැබුණි. ශිෂ්‍යයන්ගේ පුහුණු අවශ්‍යතා සඳහා බලවත් ලෙස බලපාන්නේ විශ්වවිද්‍යාල විද්‍යායතන 25 ක් ස්ථාපිත කිරීමේ මන්දගාමීත්වයයි.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතනවලට සහය දක්වන නිපුණතා සංවර්ධන සහකාරවරුන්ගේ අදහස් වන්නේ ප්‍රමාණවත් තරම් පාඨමාලා සංඛ්‍යාවක් නොපවතින බවයි. ඊට අමතරව, සිසුන් බොහෝමයකට පවතින පාඨමාලා හැදෑරීමට ආර්ථික දුෂ්කරතා පවතින අතර එම පාඨමාලා බොහොමයක්ම ප්‍රධාන දිස්ත්‍රික් මධ්‍යස්ථානවල පමණක් පවතී.

**අ.පො.ස. (සා. පෙළ) සහ අ.පො.ස. (උ. පෙළ) විභාගවලින් පසුව ශ්‍රම බලකාය වෙත ඇතුළුවීම**

උතුරු මැද පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි දත්ත අනුව දැක්වෙන්නේ මෑත කාලයේදී ශ්‍රම බලකායේ අනවරත වර්ධනයක් ඇති බවයි. වගු අංක 2.13 සහ 2.14 මඟින් 2012 වර්ෂයේ දි අ.පො.ස. (සා. පෙළ) සහ අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවත්, ඉන් සමත් ශිෂ්‍ය සංඛ්‍යාවත් සහ ශ්‍රම බලකායට ඇතුලත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව සපයනු ලබයි. 2013 සහ 2014 වර්ෂ සඳහා දත්ත ලබාගත නොහැකි වූ බැවින් 2010 සිට 2012 දක්වා දත්ත සාමාන්‍යකරණයෙන් පුරෝකථනයන් සිදුකරන ලදී. අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් පසුව 6136 පුද්ගලයන් ශ්‍රම බලකායට ඇතුලත් වූ අතර අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් පසුව 3205 ශ්‍රම බලකායට ඇතුලත් වන ලදී.

**වගුව 2.15: අ. පො. ස. (සා.පෙළ) විභාගයේ ඉදිරිපත්වීම - 2012**

| දිස්ත්‍රික්කය | විභාගයට පෙනීසිටි සංඛ්‍යාව | විෂයන් 6 ක් සමත් සිසුන් සංඛ්‍යාව | අ. පො. සා. පෙළ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | ශ්‍රම වෙළෙඳපොළට ඇතුලත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අනුරාධපුර | 11502 | 7931 | 7361 | 4141 |
| පොලොන්නරුව | 5035 | 3282 | 3040 | 1995 |
| උතුරු මැද පළාත | 16537 | 11213 | 10401 | 6136 |

*මූලාශ්‍රය : අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත*

**වගුව 2.16: අ. පො. ස. (උ.පෙළ) විභාගයේ ඉදිරිපත්වීම - 2012**

| දිස්ත්‍රික්කය | විභාගයට පෙනීසිටි සංඛ්‍යාව | විෂයන් 6ක් සමත් සිසුන් සංඛ්‍යාව | විශ්වවිද්‍යාලය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | ශ්‍රම වෙළෙඳපොළට ඇතුලත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අනුරාධපුර | 5345 | 3271 | 3258 | 2087 |
| පොලොන්නරුව | 2205 | 1087 | 1087 | 1118 |
| උතුරු මැද පළාත | 7550 | 4358 | 4345 | 3205 |

*මූලාශ්‍රය : අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත*

## 2.6 ශ්‍රම බලකාය පිළිබඳ අනාවැකි

උතුරු මැද පළාතේ ජනගහන වර්ධන අනුපාතය 1% ක් පමණ වන අතර අ. පො. ස. (සා.පෙළ) හා අ. පො. ස. (උ.පෙළ) විභාගවලින් පසුව ශ්‍රම වෙළෙඳපොළට ඇතුලත්වන අයගේ සාමාන්‍ය වර්ධන අනුපාතය පසුගිය වසර කිහිපය තුල පහත වැටෙමින් තිබෙන අතර අ. පො. ස. (සා.පෙළ) කාර්යසාධනය වැඩි වී ඇත. ශ්‍රම වෙළෙඳපොළෙහි වර්ධනය ශක්‍ය මට්ටමේ පවත්වා ගැනීමට නම් ශ්‍රම වෙළෙඳපොළෙහි සාමාන්‍ය වර්ධන අනුපාතය 0.5% ක් ලෙස උපකල්පනය කරමින් ශ්‍රම වෙළෙඳපොළ සඳහා පුරෝකථනය සාදා ඇත. ශ්‍රම බලකායේ ආරම්භක මට්ටම ලෙස අප ශ්‍රම බලකාය වෙත ඇතුළු වූ සාමාන්‍ය සංඛ්‍යාව 2010 සිට 2012 වසර දක්වා වූ දත්ත භාවිතා කර ශ්‍රම බලකාය වෙත ඇතුළු වූ සාමාන්‍ය සංඛ්‍යාව යොදාගත් අතර 2013 සහ 2014 වසර සඳහා දත්ත ලබාගත නොහැකි විය.ශ්‍රම බලකායේ ආරම්භක මට්ටම ලෙස 2010 සිට 2012 දක්වා වසරවල දත්ත භාවිතයෙන් ශ්‍රම බලකායට ඇතුලත් වූ සාමාන්‍ය සංඛ්‍යාවන් භාවිතාකල අතර 2013 සහ 2010 වර්ෂවල දත්ත ලබාගත නොහැකි විය. මෙම පුරෝකතන වල අපගමනයන් ඉදිරි වසර පහ තුල ශ්‍රම බලකායේ වර්ධන වේගය අඩු කිරීමට හේතුවනු ඇත.

අපි ශ්‍රම වෙළෙඳපොළ අනාවැකිකරණය සඳහා සංඛ්‍යාලේඛන/ ආර්ථිකමිතික සඳහා ප්‍රවේශය ස්ථිර කරගත් අතර දත්ත ලබාගත හැකිවීම් කෙරෙහි සීමාවන් තිබූ හෙයින් වෙනත් කිසිදු සංකීර්ණ ආර්ථිකමිතික ක්‍රම භාවිතා කිරීමට නොහැකි විය. මෙම ක්‍රමය භාවිතාකර ඇති මූලික තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

| ප්‍රවේශය | අවශ්‍ය සම්පත් | ප්‍රතිලාභ | සීමාවන් |
|---|---|---|---|
| සංඥා ආර්ථිකමිතික ප්‍රවේශය | මූලික සංඛ්‍යාලේඛන දැනුම සහ කාලශ්‍රේණි දත්ත | සරල සහ සාපේක්ෂව පහසුවෙන් ලබාගත හැකි සහ යාවත්කාලීන කලහැකි දත්ත සහ විශ්ලේෂණ | විශ්ලේෂණ විශාල වශයෙන් පවතින කාලශ්‍රේණි දත්තවල ගුණාත්මකභාව මත රඳා පැවතීම |

අදාල සමීකරණ පහත දක්වා ඇත.

1. 2015 වසරේදී ශ්‍රම බලකායට ඇතුලු වන පුරෝකථනය කරන ලද සංඛ්‍යාව - ($NEFL$)

$$NEFL^{i}_{2015} = \{NEFL_{2010-2012}(1+g_{LF})^{t+1}\}$$

2. 2016 වසරේදී ශ්‍රම බලකායට ඇතුලු වන පුරෝකථනය කරනලද සංඛ්‍යාව

$$NEFL^{i}_{2016} = \{NEFL_{2010-2012}(1+g_{LF})^{t+2}\} - \{NEFL_{2010-2012}(1+g_{LF})^{t+1}\} + \{NEFL_{2010-2012}\}$$

3. 2017 වසරේදී ශ්‍රම බලකායට ඇතුලු වන පුරෝකථනය කරනලද සංඛ්‍යාව

$$NEFL^{i}_{2017} = \{NEFL_{2010-2012}(1+g_{LF})^{t+3}\} - \{NEFL_{2010-2012}(1+g_{LF})^{t+2}\} + \{NEFL_{2010-2012}\}$$

4. 2018 වසරේදී ශ්‍රම බලකායට ඇතුලු වන පුරෝකථනය කරනලද සංඛ්‍යාව

$$NEFL_{2018}^{i} = \{NEFL_{2010-2012}(1+g_{LF})^{t+4}\} - \{NEFL_{2010-2012}(1+g_{LF})^{t+3}\} + \{NEFL_{2010-2012}\}$$

5. 2019 වසරේදී ශ්‍රම බලකායට ඇතුලු වන පුරෝකථනය කරනලද සංඛ්‍යාව

$$NEFL_{2019}^{i} = \{NEFL_{2010-2012}(1+g_{LF})^{t+5}\} - \{NEFL_{2010-2012}(1+g_{LF})^{t+4}\} + \{NEFL_{2010-2012}\}$$

6. 2020 වසරේදී ශ්‍රම බලකායට ඇතුලු වන පුරෝකථනය කරනලද සංඛ්‍යාව

$$NEFL_{2020}^{i} = \{NEFL_{2010-2012}(1+g_{LF})^{t+6}\} - \{NEFL_{2010-2012}(1+g_{LF})^{t+5}\} + \{NEFL_{2010-2012}\}$$

$NEFL$ - ශ්‍රම බලකායට ඇතුලත් වූ සංඛ්‍යාව

$g_{LF}$ – ශ්‍රම බලකායේ වර්ධන වේගය

$NEFL_{2010-2012}$ –2010 සිට 2012 දක්වා උතුරු මැද පළාතේ ශ්‍රම බලකායට ඇතුලත් වූ පුද්ගලයින්ගේ සාමාන්‍ය සංඛ්‍යාව

t = 0-6 වසර සංඛ්‍යාව

පුරෝකථනයන් සඳහා භාවිතාකල උපකල්පන:

a) 2015 සිට 2020 දක්වා කාලය තුල පළාතේ ශ්‍රම බලකායේ වර්ධන වේගය නියතව පවතින බව
b) මෙම ශ්‍රම බලකාය අත්දුටු වර්ධනයන් ප්‍රදර්ශනය කරනබව
c) ඉදිරි වසර පහ තුල ජනගහන වර්ධන වේගය අනුපාතය නියතව පවතින බව
d) අ. පො. ස. (සා.පෙළ) හෝ අ. පො. ස. (උ.පෙළ) හෝ අසමත් වූවන්ට ශ්‍රම බලකාය වෙත ඇතුලත් වියහැකි අතර ඔවුන් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ආයතන පද්ධතිය තුලින් විවිධ පාඨමාලා හැදෑරීමට බලාපොරොත්තු වන්නන් වනු ඇති බව.

ඉහත දක්වන ලද සමීකරණ භාවිතයෙන් අප විසින් උතුරු මැද පළාත සඳහා අ. පො. ස. (සා.පෙළ) හා අ. පො. ස. (උ.පෙළ) පසුව ශ්‍රම බලකාය වෙත ඇතුළු වීමට අපේක්ෂිත සංඛ්‍යාවන් වෙන් වෙන් වශයෙන් ගණනය කරන ලදී.

**2.17 වගුව : අ. පො. ස. (සා.පෙළ) පසුව ශ්‍රම බලකාය වෙත අතුළු වන්නන් පිළිබඳ පස් අවුරුදු පුරෝකථනය**

| දිස්ත්‍රික්කය/ පළාත | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 4348 | 4565 | 4793 | 5033 | 5285 | 5549 |
| පොලොන්නරුව | 2194 | 2304 | 2419 | 2540 | 2667 | 2800 |
| පළාත | 6542 | 6869 | 7212 | 7573 | 7952 | 8349 |

**2.18 වගුව : අ. පො. ස. (උ.පෙළ) පසුව ශ්‍රම බලකාය වෙත අතුළු වන්නන් පිළිබඳ පස් අවුරුදු පුරෝකථනය**

| දිස්ත්‍රික්කය/ පළාත | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 2191 | 2300 | 2415 | 2536 | 2663 | 2796 |
| පොලොන්නරුව | 1173 | 1232 | 1294 | 1358 | 1426 | 1498 |
| පළාත | 3364 | 3532 | 3709 | 3894 | 4089 | 4294 |

**2.19 වගුව : ශ්‍රම බලකාය වෙත සමස්ථ අතුළු වන්නන් පිළිබඳ පස් අවුරුදු පුරෝකථනය**

| කාණ්ඩය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| අ.පො.ස. (සා.පෙළ.) පසුව | 6748 | 7085 | 7440 | 7812 | 8202 | 8612 |
| අ.පො.ස. (උ.පෙළ.) පසුව | 3365 | 3533 | 3710 | 3895 | 4090 | 4295 |
| මුළු එකතුව | 10113 | 10619 | 11150 | 11707 | 12293 | 12907 |

2.18 සිට 2.19 වගු මඟින් දිස්ත්‍රික්ක දෙක සහ පළාත සඳහා පුරෝකථනය කරන ලද දත්ත දක්වයි. 2015 සිට 2020 දක්වා කාලය තුල අ. පො. ස. (සා.පෙළ) සහ අ. පො. ස. (උ.පෙළ) පසුව ශ්‍රම වෙළෙඳපොළ වෙත සාමාන්‍යයෙන් වසරකට 11500 ක පමණ පුද්ගලයින් ඇතුලත් වනු ඇත. මෙම සංඛ්‍යාවන් මඟින් අනාගත පුහුණුවීම සැපයීම සහ ඉදිරි වසර පහ සඳහා ඉල්ලුම සහ සැපයුම අතර පවතින නොගැලපීම ආදිය පිළිබඳ සුදුසු විශ්ලේෂණ සිදුකිරීමට අපට උපකාරී වනු ඇත.

අ. පො. ස. (සා.පෙළ) සහ අ. පො. ස. (උ.පෙළ) විභාගවලින් පසු ශ්‍රම වෙළෙඳපොළ වෙත ඇතුළු වන තැනැත්තන් විසින් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු පාඨමාලාව සඳහා වන විභව ඉල්ලුම සාධක ගණනාවක් මත පදනම් වන බව අවධාරණයට ලක් කිරීම අවශ්‍ය වේ. පළමුව අ. පො. ස. (උ.පෙළ) පසුව විශ්ව විද්‍යාලයකට ඇතුළුවීමට නොහැකි වූ පුද්ගලයන්ගෙන් විශාල ප්‍රතිශතයක් බාහිර උපාධි අපේක්ෂකයන් ලෙස ශාස්ත්‍රවේදී උපාධිය හැදෑරීමට රාජ්‍ය විශ්ව විද්‍යාල සියල්ලකම පාහේ ලියාපදිංචි වනබව වර්ථමාන සංඛ්‍යාලේඛන අනුව පෙනී යයි. 2015 වසරේ දී දැක්වෙන ලෙස සිසුන් 50000 කට

වඩා වැඩියෙන් රාජ්‍ය විශ්ව විද්‍යාලවල බාහිර උපාධිය හැදෑරීම සඳහා ලියාපදිංචි වී ඇති අතර ඉන් ¾ කට වඩා වැඩි ප්‍රමාණයක් කලා විෂයධාරාවේ උපාධි සඳහා වේ. ශක්තිමත් කණ්ඩායම් ඇතුළුව සැබවින්ම නොබැඳිය හැකි ව්‍යාපාර පද්ධතිය තුල ඉස්මතු වී තිබේ. විශ්ව විද්‍යාලීය විද්වත් ප්‍රජාව ඔවුන්ට මූල්‍යමය ලෙස ප්‍රයෝජනවත් බැවින් බාහිර උපාධි සිසුන් විශාල සංඛ්‍යාවක් ඇති කිරීමට වඩා කැමති බව පෙනී යයි.මෑත කාලයේදී, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විශ්ව විද්‍යාල හා බාහිර උපාධි සඳහා පන්ති පවත්වන පෞද්ගලික උපකාරක පන්ති ආයතන අතර විධිමත් සබඳතා වැඩිදියුණුකර ඇත. කාර්යාල කටයුතු කෙරෙහි නැඹුරු රාජ්‍ය අංශයේ රැකියාගත කිරීම සඳහා වන ශක්තිමත් අභිලාෂයන් මෙම ඉල්ලුම ඉදිරියට ගෙනගොස් ඇත. බාහිර උපාධි සඳහා වන මෙම අනපේක්ෂිත සංඛ්‍යාවේ ප්‍රතිඵලයක් ලෙස කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතනවලට මුළුමනින්ම පාහේ ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් පාඨමාලා සඳහා ලබාගැනීමට අරගල කිරීමට සිදුව ඇත. රට තුල වෘත්තීය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට රජය අදහස් කරන්නේ නම් බාහිර උපාධි සඳහා ලියාපදිංචිවන සිසුන් සංඛ්‍යාව බලාත්මක කිරීමට දැඩි මාර්ගෝපදේශ අවශ්‍ය වේ. මෙම විධිමත් නියාමන රාමුව තුල ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ සහයෝගීතාවක් සහ එකමුතු බවක් තිබීම අත්‍යවශ්‍ය වේ.

දෙවනුව, හතු පිපෙන්නාක් මෙන් නැගෙන විවිධ පෞද්ගලික විශ්වවිද්‍යාල සහ පෞද්ගලික උසස් අධ්‍යාපනය සපයන්නන්ද කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතනවල පුහුණුව සඳහා ඇති ඉල්ලුම කෙරෙහි බලපා ඇත. වෘත්තීය පුහුණු ආයතනවල නායකත්වය විසින් අනාගතයේදී වැඩි සිසුන් ප්‍රමාණයක් වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පාඨමාලා සඳහා ලබාගැනීමට නම් කාර්යාල අභිමුඛ රැකියා ලබාගැනීමට වැඩි කැමැත්තක් දක්වන අය සඳහා පුහුණුවක් ලබාදීමට කටයුතු කලයුතු බවට අදහස් කරයි. ප්‍රථම උපාධි පාඨමාලාවට ඇතුලත් වීමට ඇති හැකියාව, යම් කෙනෙක් අ.පො.ස.(සා.පෙළ) අසමත් වුවහොත් ඇතිවන අසමතුලිත බව ඉදිරියට ගෙන යයි.

තෙවනුව, බොහෝ පුහුණු සපයන ආයතනවල අදහස වන්නේ අ. පො. ස. (සා.පෙළ) හෝ අ. පො. ස. (උ.පෙළ) හෝ අසමත් බොහෝ සිසුන් ඔවුන් මුහුණපාන මූල්‍යමය ගැටළු නිසා නුපුහුණු ශ්‍රමිකයන් ලෙස ශ්‍රම වෙළෙඳපොළට ඇතුලත් වී රැකියා සොයාගැනීමට වඩා කැමැත්තක් දක්වන බවයි. කර්මාන්ත අංශයේ බෙහෝ සේවායෝජකයින් අඩු වැටුප් වියදම් හේතුවෙන් නුපුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනීමට කැමැත්තක් දක්වන අතර නුපුහුණු ශ්‍රමිකයන් බොහෝ කර්මාන්ත සඳහා පහසුවෙන් යොදාගත හැකිවේ.

හතරවනුව, ත්‍රී රෝද රථ පද්ධතිය කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතනවල පුහුණුව සඳහා වන ඉල්ලුමට ප්‍රබල ලෙස බලපාන බව එම පුහුණු සපයන ආයතනවල මතයක් වේ. අ. පො. ස. (සා.පෙළ) හෝ අ. පො. ස. (උ.පෙළ) හෝ අසමත්වන බොහෝ පිරිමි සිසුන්, පවතින මූල්‍ය පහසුකම් යටතේ ත්රී රෝද රථ මිලට ගැනීම සහ ටැක්සි සේවා ලෙස රැකියා කිරීමට වැඩි කැමැත්තක් දක්වයි.

හතු පිපෙන්නාක් මෙන් බිහිවන ත්‍රී රෝද රථ කර්මාන්තය මෙයට සාක්ෂි දරයි. ත්‍රී රෝද රථ ක්‍රියාකරුවන්ගේ වයස් සීමාවන් ඉහළ නැංවීම මඟින් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුවට ඇති ඉල්ලුම ඉදිරියට ගමන් කරනු ඇති බවට පුහුණු සපයන ආයතන විසින් විශ්වාසය පළ කරයි.

පස්වනුව, රාජ්‍ය නිළධාරීන් හා පුහුණුව සපයන ආයතන සමඟ අප පැවැත්වූ සමීක්ෂණවලින් සහ සාකච්ඡා වලින්ද දැක්වෙන්නේ බොහෝ පිරිමි සිසුන් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව සඳහා ඇති ඉල්ලුම අඩු වන්නේ ඔවුන් පුහුණුව ලබා මෙහි රැකියාවක් කරනවාට වඩා ඔවුන් බොහෝමයක් විදේශ රැකියා (දකුණු කොරියාව, මැද පෙරදිග ආදී) බලාපොරොත්තු වීමයි. විවිධ සහනාධාර සහ ප්‍රවර්ධන වැඩසටහන් මඟින් මෙම විදේශ රැකියා ප්‍රවනතාව සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබාදේ.

හයවනුව, වෘත්තීය සුදුසුකම් කෙරෙහි සමාජ ආකල්පයන් හිතකර නොවන බව පෙනේ. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව ලැබීමෙන් පසුව වුවද බොහෝ ස්ත්‍රී ශ්‍රමිකයන් ක්ෂේත්‍ර හෝ නිෂ්පාදන අංශ ශාඛාවල ආශ්‍රිත රැකියාවලට වඩා කාර්යාල අභිමුඛ වන රැකියාවලට තවමත් වැඩි කැමැත්තක් දක්වයි. දෙමාපියන් ද වෘත්තීය හා කාර්මික පුහුණුව ලබාගැනීමට වඩා අධ්‍යාපන වැඩසටහන් කෙරෙහි ඔවුන්ගේ දූ පුතුන් යොමුකරන බවක් දක්නට ලැබේ.

අවසාන වශයෙන් පූර්ණ කාලීන පදනම මත මුදල් ගෙවා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව ලබාගැනීමට මූල්‍යමය වශයෙන් බොහෝ සිසුන් ශක්තිමත් වීම අවශ්‍ය වේ. මූල්‍යමය වශයෙන් ශක්තිමත් සිසුන් පෞද්ගලික විශ්ව විද්‍යාල පාඨමාලා හැදෑරීමට වඩාත් කැමති අතර මූල්‍යමය තත්ත්වය දුර්වල සිසුන් යොමු වන්නේ බාහිර උපාධි පාඨමාලා හැදෑරීමට යි. ඒවායේ සති අන්ත පන්ති පැවැත්වෙන බැවින් ඔවුන් නුපුහුණු ශ්‍රමිකයන් ලෙස සේවය කරමින් උසස් අධ්‍යාපනය සිදුකරයි.

උසස් අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුහ අතර වත්මන් බෙදීම් සහිත සහ සම්බන්ධීකරණයක් නොමැති බව පුහුණු පද්ධතිය රටෙහි පුහුණු පැතිකඩට විශාල වශයෙන් හානිකර වේ. කලා උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් රැකියා විරහිත වීම හේතුවෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සකසන්නන්ට විශාල ගැටළුවක් බවට පත්ව ඇති අතර, විවිධ යෝජනා ක්‍රම යටතේ උසස් අධ්‍යාපනය මඟින් බරපතල අසමතුලිතතාවක් බිහිකර ඇත. 2015 වසර දක්වා ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් ගෙන් 50% ක් පමණ කලා උපාධිධාරීන් විය.

## 2.7 සාරාංශය

මෙම පරිච්ඡේදය මඟින් උතුරු මැද පළාතේ ප්‍රවනතාවන්, රටාවන් සහ සමාජ ආර්ථික තත්ත්වය වර්ධනය හා ශ්‍රම බලකා පරිසර විස්තර කෙරෙයි. ඉදිරි වසර පහ සඳහා ශ්‍රම බලකායේ වර්ධනය පිළිබඳ වැදගත් අනාවැකි මෙම පරිච්ඡේදය මඟින් ඉස්මතුකර දක්වයි. ඉදිරි පස් වසර තුල උතුරු මැද පළාතේ ශ්‍රම බලකායට ඇතුළුවන සංඛ්‍යාව ආසන්නව බොහෝ සෙයින් ස්ථාවර වන බව පෙනේ. උතුරු මැද පළාතේ ආර්ථිකයට රැකියා නිර්මාණය කිරීමේ හැකියාව සහ ශ්‍රම වෙළෙඳපොළට ඇතුළු වන්නන් සංඛ්‍යාව අවශෝෂණය කරගැනීමේ හැකියාව තිබිය යුතුය. ඉහත ශ්‍රම බලකායට පුහුණු සහ අර්ධ පුහුණු රැකියා සැපයීමට නම් කර්මාන්තවල වර්ධනය සහ සේවා අංශයේ බවතින වර්ධනය අත්‍යවශ්‍ය වේ.

# පරිච්ඡේදය 03

## ජීවනෝපාය වෘත්තීන් සඳහා පුහුණු අවශ්‍යතා

### 3.1 පසුබිම

කලාපීය ආර්ථිකයේ වැදගත් සහ වර්ධනය වන කොටස කුඩා ව්‍යවසායක මඟින් සකස් වේ. කුඩා ව්‍යවසායට වීදි වෙළඳුන්, වඩු කාර්මිකයින්, යන්ත්‍ර ක්‍රියාකරුවන්, කුලී ගොවියන් ඇතුළු විවිධ වර්ගයේ ආර්ථික ව්‍යාපාර අඩංගුවේ. ඔවුන් නොයෙක් ප්‍රමාණයන්ගෙන් ව්‍යාපාර පවත්වාගෙන යයි. මෙම විවිධ කණ්ඩායම්වලට තම ව්‍යාපාර වර්ධනයට සහ වැඩිදියුණු කිරීමට නොයෙක් වර්ගයේ සහාය අවශ්‍ය වේ. මෙම පිරිමි සහ කාන්තාවන් සහ ඔවුන්ගේ සේවකයින් දිළිඳු වන අතර සේවා සඳහා ප්‍රවේශයන් සීමා වී ඇත. නමුත් ඔවුන්ට ඇති ප්‍රවේශයන් අඩු නොවේ. ශ්‍රී ලංකාවේ ඇති ව්‍යාපාර වලින් 50% කට වඩා ව්‍යාපාර සේවකයින් 5 ක් හෝ ඊට අඩු ප්‍රමාණයක් ඇති ඒවා වන අතර ඔවුන් සියළු රැකියා වලින් අධික ප්‍රමාණයක් තරම් සපයයි (ශ්‍රී ලංකා මහ බැංකුව, වසර කීපයක්).

කලාපීය ආර්ථිකයේ හදවත කුඩා ව්‍යාවසාය වේ. ආර්ථිකයට කුඩා-ව්‍යවසාය වලින් දක්වන දායකත්වය විවිධ වන අතර, සමාජයේ අඩු ආදායම් සහිත ස්ථරයට ඉතා වැදගත් බව පෙනෙන්නට තිබේ. ආර්ථික වර්ධනයට, සමාජ ස්ථාවරත්වයට සහ සමානාත්මතාවයට කුඩා ව්‍යවසායයන් කැපීපෙනෙන දායකත්වයක් ලබාදෙයි. මෙම ක්ෂේත්‍රය ප්‍රධාන වැදගත් ආධාරකයන්ගෙන් එකක් වන අතර මෙම ආධාරකය හරහා අඩු ආදායම්ලාභී ජනතාවගේ දරිද්‍රතාවය වලක්වාගත හැකිය. විධිමත් අංශයේ රැකියා සඳහා තරඟ කිරීමට මෙම මිනිසුන් සහ කාන්තාවන් සීමාසහිත නිපුණතාවය සහ අධ්‍යාපනයක් ඇතිව ව්‍යාපාර හිමිකරුවන් සහ සේවකයින් ලෙස කුඩා ව්‍යවසායන් තුල ආර්ථික අවස්ථා සොයාගනී. කුඩා ව්‍යවසාය තුල මූලික වශයෙන් පෙරමුණ ගන්නේ කාන්තා සේවකයින් වේ. මෙම ක්ෂේත්‍රය කාන්තාවන්ට නිවෙසින් බැහැරව වැඩකිරීමට උදව් වන අතර මෙය සාමාන්‍යයෙන් ඔවුන්ගේ පවුල් රැකබලා ගැනීමට අමතරව වන අතර මේ නිසා ඔවුන්ගේ රැකියා අවස්ථා සීමාවේ.

මෙම කුඩා-ව්‍යවසායකයන්ගේ සංවර්ධනය වීමේ විභවයේ හැකියාව මෙම වෘත්තීන්වල නියුක්තව සිටින පුද්ගලයින්ගේ නිපුණතාවයන්මත රඳාපවතින බව පැහැදිලිව පෙනී යයි. ජීවනෝපාය වෘත්තීන්ගේ නියැලී සිටිනා පුද්ගලයින්ගේ මූලික ක්‍රියාකාරකම් හරහා, ඔවුන්ගේ ව්‍යාපාරවල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීම බාධකයක් වී ඇති බව පෙනෙන්නට තිබේ. මෙය ඔවුන්ගේ ව්‍යාපර ඊළඟ මට්ටමට ඉහළ නැංවීමට බාධාවකි. එම නිසා රාජ්‍ය ආයතනවල කාර්යභාරයන්ගෙන් එකක් වන්නේ ජීවනෝපාය වෘත්තීන්වල නියැලී සිටින පුද්ගලයින්ට නිපුණතා සංවර්ධන පුහුණුව සැපයීම වේ. මෙම පරිච්ඡේදය මඟින් ජීවනෝපාය වෘත්තීන්වල නියුක්ත පුද්ගලයින්ගේ පුහුණු අවශ්‍යතා තේරුම් ගැනීමට උත්සාහ දරයි. පළාත තුල සිදුකල සිද්ධි අධ්‍යයන

මඟින් ලබාගත් දත්ත, ක්ෂේත්‍රයේ වැඩිදුර පුහුණු අවශ්‍යතා සඳහා නිගමනයන්ට එළඹීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට විශ්ලේෂණය කරයි.

**ජීවනෝපාය මාර්ග වෘත්තීන්ගේ පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය කිරීමේදී භාවිතාකල ක්‍රම**

උතුරු මැද පළාතේ සියළුම ජීවනෝපාය වෘත්තීන්ගේ හෝ කුඩා-ව්‍යවසායකවල නියැදි රාමුවක් නොමැති බැවින්, කිසිඳු අහඹු නියැදි ක්‍රමයක් භාවිතා කිරීම තාත්වික නොවේ. එම නිසා, මෙම සිද්ධි අධ්‍යයනය සඳහා "පහසු නියැදිය" යන අහඹු නොවන නියැදි ක්‍රමය භාවිතා කරන ලදී. ක්ෂේත්‍ර සසම්භාවී ක්‍රමයමත අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ජීවනෝපාය වෘත්තිකයින් 34 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් ජීවනෝපාය වෘත්තිකයින් 32 ක් තෝරාගන්නා ලදී. උතුරු මැද පළාතේ බොහෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල පැතිරී සිටින පුද්ගලයින් සම්මුඛපරීක්ෂණ කිරීමට පර්යේෂණ නිළධාරීන් පත්කරන ලදී. මෙම සිද්ධි අධ්‍යයනය මඟින් සිද්ධි ආඛ්‍යාන ලියන ලදී. සිද්ධි අධ්‍යයනය සඳහා "ක්ෂේත්‍ර සසම්භාවී" ක්‍රමය භාවිතයෙන් සසම්භාවීතාව ප්‍රමාණවත් මට්ටමක් පවත්වාගන්නා ලදී.

"අන්තර්ගත විශ්ලේෂණ" ක්‍රමය භාවිතා කරමින් සිද්ධි ආඛ්‍යාන විශ්ලේෂණය කරනලදී. අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය යනු ගුණාත්මක දත්ත මඟින් ජනනය වන අන්තර්ගතයෙහි විවිධ අංශ ගණනය කිරීම මඟින් ඕනෑම ආකාරයේ අන්තර්ගතයක් විශ්ලේෂණය කලහැකි ක්‍රමයකි. ශ්‍රවනය කරන්නෙකුගේ හැඟීම්මත පදනම් වූ අන්තර්ගතය සමඟ සන්නසන්දනය කරනවිට ඊට වඩා මෙම ක්‍රමයෙහි වැඩියෙන් අරමුණ ඇගයීමට හැකියාවක් ඇත. අන්තර්ගතයන් විශ්ලේෂණය, එය බොහෝවිට ලියන ලද වචන විශ්ලේෂණය නමුත්, ගුණාත්මක ක්‍රමයක් ප්‍රතිචාර ඇගයීමට ලක්කිරීම මඟින් ප්‍රමාණාත්මක දත්ත බවට පරිවර්ථනය කිරීමට උපකාරී වේ. එම නිසා අන්තර්ගත විශ්ලේෂණයක ප්‍රතිඵලය වන්නේ එම අන්තර්ගතයේ ඉල්ක්කම් සහ ප්‍රතිශතවලට හැරවිය හැකිවීමයි. උදාහරණයක් ලෙස, අන්තර්ගත විශ්ලේෂණයකින් පසු, එක් ප්‍රකාශිතයක් මෙසේ සෑදීමට ඉඩතිබේ. "ජීවනෝපාය වෘත්තිකයන්ගෙන් 60% ක් තෝරාගත් වෘත්තියක විශේෂ පුහුණුවකට වැඩි කැමැත්තක් දක්වයි". මෙය සිද්ධි අධ්‍යයනයේදී ප්‍රතිචාර දැක්වූවන් විසින් ලබාදුන් ප්‍රතිචාර වලින් ව්‍යුත්පන්න කිරීමකි. කෙසේ වුවත්, එම ප්‍රකාශය කිරීමේ දී දළ සරළ බව පෙනෙන්නට තිබුණත්, ගණනයකිරීම් හේතු දෙකකින් ඉෂ්ඨ වේ: සාරාංශයන්ගෙන් ආත්මීයත්වයේ බොහෝ දේ ඉවත් කිරීමට සහ ප්‍රවණතාවල හඳුනාගැනීම් සරළකිරීමට. විශ්ලේෂණයකරන අන්තර්ගතය මුලදී ඕනෑම ආකාරයකින් තිබිය හැකිය. නමුත් එය විශ්ලේෂණය කිරීමට පෙර බොහෝවිට ලියන වචන බවට පරිවර්ථනය කරයි. මෙම වත්මන් අධ්‍යයනයේ පරිදි මුල් මූලාශ්‍ර මුද්‍රිත ප්‍රකාශණ, විකාශන වැඩසටහන්, අනෙකුත් පටිගතකිරීම්, අන්තර්ජාලය හෝ සජීවී තත්වයන්, හෝ ලිඛිත ආඛ්‍යාත විය හැකිය. මෙම සම්පූර්ණ අන්තර්ගතය ජනතාව විසින් නිර්මාණයකල යම්කිසි දෙයක් වේ. කිසිවකුට කාලගුණය පිළිබඳව

අන්තර්ගත විශ්ලේෂණයක් කලනොහැක. නමුත් යම්කිසි කෙනෙකු කාලගුණය ගැන අනාවැකි පළකර වාර්ථාවක් ලියයි නම්, ඔහුට/ඇයට එම වාර්ථාවේ අන්තර්ගත විශ්ලේෂණයක් කල හැකිය.

## 3.2 පළාතේ ජීවනෝපාය වෘත්තීන්

උතුරු මැද පළාතේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ කෘෂිකර්මය වන අතර එයට වී සහ හේන් ගොවිතැන ඇතුලත් වේ. උතුරු මැද පළාතේ ජනගහනයෙන් 60% කට වඩා කෘෂිකර්මය හෝ ඊට අදාල ජීවනෝපාය වෘත්තීන්වල නිරත වේ. කෙසේ වෙතත්, ගොවි නොවන අංශයේ විධිමත් හා අවිධිමත් ජීවනෝපාය වෘත්තීන් ද දැකගත හැකිය. විශාල කර්මාන්ත සුළු ප්‍රමාණයක්, සිල්ලර සහ තොග ඇතුලත් වේ. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ලැබූ පුද්ගලයින් විශාල වශයෙන් විධිමත් ගොවිපොළ-නොවන ක්ෂේත්‍රයේ රැකියාගත වී ඇත. කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සඳහා කර්මාන්ත අංශවල ඉල්ලුම විශ්ලේෂණයේ දී මේ පිළිබඳව සාක්චිඡාවනු ඇත.

උතුරු මැද පළාතේ ගොවිපොළ නොවන ජීවනෝපාය වෘත්තීන් බහුවිධ සහ විවිධ වේ. මේවා කර්මාන්තය සහ සේවා යන ක්ෂේත්‍ර දෙකෙහිම වෘත්තීන්වන අතර බහුතරයක් සේවා අංශයට අයත් වේ. උතුරු මැද පළාත තුල පහත සඳහන් වෘත්තීය කාණ්ඩ ජීවනෝපාය වෘත්තීන්ගේ ප්‍රමුඛතවය දරයි. පෙනෙන පරිදි මේවා අනාගත පුහුණු අවශ්‍යතාමත පවතී. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවිනැගුම වැඩසටහනෙහි උතුරු මැද පළාතේ ඇති විවිධ වර්ගවල ජීවනෝපාය වෘත්තීන් ලේඛනගතකර ඇත. කෘෂි ක්ෂේත්‍රයේ කුඩා-ව්‍යවසාය සිට සේවා දක්වා පරාසය තුල ඇති වෘත්තීන් ප්‍රධාන වශයෙන් සිල්ලර වෙළෙඳාම සහ යාන්ත්‍රික නොවන වැඩ පිළිබඳව අවධානය යොමුකරයි (3.1 වගුව). මෙම ජීවනෝපාය වෘත්තීන්ගෙන් බොහෝමයක් ඉතා අඩු තාක්‍ෂණික කුසලතා හා පුහුණුව සහිත ස්වයං රැකියා වේ. මෙම වෘත්තීන් ගොවිජනතාව ආරක්‍ෂාවීමේ ක්‍රමෝපාය ලෙස සම්ප්‍රදායික ලෙස ඉස්මතු වී ඇත. වර්ධනය වන කර්මාන්ත සහ සේවා අංශ මඟින් නිර්මාණයකර ඇති නිකේතන වෙළෙඳපොළට ප්‍රතිචාර දැක්වීමට ජීවනෝපාය වෘත්තීන් ඉස්මතු වී ඇත. කෘෂිකර්මාන්තය ආශ්‍රිත සේවා ස්වයං රැකියා නිර්මාණයේදී පෙරමුණ ගෙන ඇත. උතුරු මැද පළාතේ මෙම ආර්ථික ක්‍රියාකාරකම් තුල සැලකිය යුතු අනාගත කර්මාන්ත සංවර්ධන ක්‍රියාවලියක් සහ අ.පො.ස.(සා.පෙළ) හෝ අ.පො.ස. (උ.පෙළ) සමත්වීමෙන් පසු උගත් පිරිසක් ලෙස ශ්‍රම වෙළෙඳපොළට එකතුවන පුද්ගලයින් සඳහා නිපුණ සහ අර්ධ-නිපුණ රැකියා බිහිකිරීමට විශාල විභවයක් ඇත.

වගුව 3.1: උතුරු මැද පළාත් එක් එක් උප අංශයේ ජීවනෝපාය වෘත්තීය ප්‍රභේද

| | උප කාණ්ඩය | වෘත්තීය කාණ්ඩ |
|---|---|---|
| 1. | කෘෂිකර්මය සහ කුකුළු ගොවිපළ | කුකුළු ගොවියා, ගවපට්ටි බලාගන්නා, එළවළු වගා කරන්නන්, බිම්මල් වගාකරන්නන්, මී මැසි පාලක |
| 2. | ආහාර සහ පාන වර්ග | තේ වෙළෙන්දා, පළතුරු බීම සාදන්නා සහ විකුණන්නා, ජල පිරිපහදු කිරීම සහ බෙදා හැරීම, රසකැවිලි සාදන්නා, මී කිරි සාදන්නා, ආහාර සැකසුම්කරු |
| 3. | පොල් ආශ්‍රිත | පොල්තෙල් නිශ්පාදනය කරන්නා සහ විකුණන්නා, පොල්කටු ආශ්‍රිත ආභරණ/විසිතිරුබඩු නිශ්පාදනය කරන්නා, පොල්කොළ ආශ්‍රිත නිශ්පාදන, කොසු ඉදල් නිශ්පාදනය කරන්නා සහ විකුණන්නා |
| 4. | හස්ත කර්මාන්ත | කෘෂි උපකරණ සහ මෙවලම් නිශ්පාදන සහ නඩත්තු කරන්නා, ගෘහ උපකරණ සහ මෙවලම් නිශ්පාදක, අත්යන්ත්‍ර නිෂ්පාදක, මැටි භාණ්ඩ නිෂ්පාදකයින්, වේවැල් ආශ්‍රිත භාණ්ඩ නිශ්පාදකයින් |
| 5. | රෙදිපිළි කර්මාන්තය | අත්යන්ත්‍ර නිශ්පාදකයින් |
| 6. | සිමෙන්ති ආශ්‍රිත | ගඩොල් නිශ්පාදකයින්, කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන |
| 7. | සපත්තු සහ සම්භාණ්ඩ | සපත්තු මහන්නන්, සපත්තු නිශ්පාදකයින් (බෑග් ආදිය) |
| 8. | දැව ආශ්‍රිත | ගෘහ භාණ්ඩ නිශ්පාදක, නිවාස වහළ, ජනෙල් සහ දොරවල් ඉදිකිරීම, දැව ආශ්‍රිත කලාත්මක උපකරණ නිශ්පාදකයා |
| 9. | කඩදාසි ආශ්‍රිත | අභ්‍යාස පොත් නිෂ්පාදක, බෑග් නිෂ්පාදනය, පාස් පොත්, කුවිතාන්සි පොත් නිශ්පාදක |
| 10. | සේවා | මාළු වෙළෙන්දා, සිල්ලර වෙළෙන්දා, ජංගම වෙළෙන්දා, ගෙවතු වගාකරන්නා, පළතුරු එකතුකරන්නා, පෙදරේරු, වඩු කාර්මික, ඉදිකිරීම් සේවක, ඉදිකිරීම් සහායක, ගෘහ සේවක, ආගන්තුක සත්කාර සේවක, වෙළෙඳ ප්‍රචාරණ |
| 11. | කුඩා පරිමාණ කෘෂිකාර්මික නිශ්පාදන | එළවළු ගොවියා, පළතුරු වගාකරන්නා |
| 12. | මිරිදිය ධීවර කර්මාන්තය | ධීවරයින්, මාළු වෙළඳාම් කරන්නා |

| | උප කාණ්ඩය | වෘත්තීය කාණ්ඩ |
|---|---|---|
| 13. | පශු සම්පත් සහ කුකුළු | ආවරණ පද්ධති, ආහාර ලබාදීම සහ ආහාර ලබාදීමේ ක්‍රමෝපායන්, රෝග/පරපෝෂිතයන් වැලැක්වීම සහ පාලනය කිරීම, දෛනික හා විශේෂ නිත්‍ය ක්‍රියාකාරකම් |
| 14. | ගෙවතු වගාව | උද්‍යාන විශේෂඥයන්; සංරක්ෂණ විශේෂඥයන්; මල්වගාකරුවන්; උද්‍යාන අලංකරණය; පැළතවාන්කරු; පාලකයින් |
| 15. | විවිධ අංශ | විසිතුරු මත්සයින් රැකබලා ගැනීම |

*මූලාශ්‍රය: දිවිනැගුම වැඩසටහනෙහි ඇති තොරතුරු*

උතුරු මැද පළාතේ ජීවනෝපාය වෘත්තීන්වල පුහුණු අවශ්‍යතා සහ ඉදිරි දර්ශනයන් ලබාගැනීමට අපි සිද්ධි අධ්‍යයන සිදුකරන ලදී. උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් පුද්ගලයින් 34 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් පුද්ගලයින් 32 ක් මෙම සිද්ධි අධ්‍යයනවලින් ආවරණය විය. මෙම සිද්ධි අධ්‍යයනවල ප්‍රතිඵල පහත ඡේදයේදී සාකච්ඡා කෙරේ. මෙහිදී කරුණු කීපයක් ගැන අවධානය යොමුකරමින් අපි සාකච්ඡා කරන්නෙමු. ඒවා නම්; දැනට පවතින පුහුණු අවශ්‍යතා පිළිබඳ වෘත්තිකයන්ගේ ඉදිරි දර්ශනය, අනාගත පුහුණු අවශ්‍යතා, පුහුණු කාලසීමාව, ජීවනෝපාය වෘත්තීන් සඳහා පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීමේ දී ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන ගැටළු සහ අභියෝග.

## 3.3 ජීවනෝපාය වෘත්තිකයින් මුහුණපාන ගැටළු

උතුරු මැද පළාත තුල පවත්වන ලද සිද්ධි අධ්‍යයනයන් විශ්ලේෂණය කිරීමේ දී ජීවනෝපාය වෘත්තිකයින් මුහුණපාන ගැටළු සහ ප්‍රශ්ණ ගණනාවක් හඳුනාගැනීමට අපිට හැකිවිය. ජීවනෝපාය වෘත්තිකයින් තම ව්‍යාපාර සංවර්ධනයකර ගැනීමට යාමේ දී මුහුණපාන වර්ථමාන ව්‍යාපාරික ප්‍රශ්ණ පිළිබඳව ප්‍රතිචාර දැක්වූවන් විසින් ලබාදුන් තොරතුරු 3.2 සහ 3.3 වගුවල සාරාංශ ගතකර ඇත. එහි දක්වා ඇති පරිදි බොහෝ ප්‍රශ්න ආර්ථික ප්‍රශ්න සම්බන්ධව වේ. නමුත් ජීවනෝපාය වෘත්තිකයින් විසින් ඉදිරිපත්කර ඇති සමහර ප්‍රශ්න පුහුණුව සැපයීම සම්බන්ධව වේ. උතුරු මැද පළාතේ දිස්ත්‍රික්ක දෙකෙහිම ජීවනෝපාය වෘත්තිකයින් ඉස්මතුකර ඇති ගැටළු පහත සඳහන් පරිදි සාරාංශ කලහැක;

a. අදාල නවීන උපකරණ මදිකම
b. අමුද්‍රව්‍ය සඳහා ප්‍රවේශයන් මඳිකම
c. උසස් තාක්ෂණික පුහුණු හිඟයන්
d. දැනට පවතින පුහුණු වැඩසටහන්වල කාලසටහන් ඉතා දැඩි සහ කාලය වැයවන නිසා පුහුණුව ලබාගැනීමේ අපහසුතාවය

e. බොහෝ වෘත්තීන්වලට දැනුම් හැකියාවන් අඩුකම
f. ව්‍යවසායකත්වය පිළිබඳ පුහුණුව මදිකම
g. හොඳින් විස්ථාරණය වූ සේවා සහ සුදුසු විශේෂඥ සේවා මදිකම
h. මූල්‍ය ප්‍රාග්ධනය සහ බැංකු සඳහා ප්‍රවේශ අඩුකම
    a. ඉහළ පොළී අනුපාත සහ ණය ලබාගැනීම සඳහා අවශ්‍ය අමතර සුදුසුකම් ණය ලබාගැනීමට බාධාකිරීම
i. වෙළෙඳපොළ පිළිබඳව යාවත්කාලීන වූ/ කාලීන තොරතුරු මදිකම

උතුරු මැද පළාතේ ජීවනෝපාය වෘත්තීන් සහ කර්මාන්ත සංවර්ධනය කිරීම ගන්නා පියවරවල ඕනෑම අනාගත සැලැස්මකට සහ පුහුණුව සැපයීම සඳහා මෙම ප්‍රශ්න විසඳීමට අවශ්‍ය වේ.

**වගුව 3.2: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවනෝපාය වෘත්තිකයන් මුහුණපාන ගැටළු**

| | නම | ක්‍රියාව/නිෂ්පාදන | මුහුණපාන ගැටළු |
|---|---|---|---|
| 1. | හේමමාලි | සිමෙන්ති ගඩොල් නිශ්පාදනය කිරීම | ජල හිඟය, නවීන උපකරණ නොමැතිවීම |
| 2. | ගුණසේන | ගෘහ භාණ්ඩ සෑදීම | ගුණාත්මක ලී මදිකම, නවීන උපකරණ නොමැතිකම |
| 3. | නිසන්සලා | කිරි නිශ්පාදනය | සත්ත්ව ආහාර සොයාගැනීමේ අපහසුව, වැඩියෙන් කිරි උත්පාදනය කරන සතුන් මිලදී ගැනීමේ අපහසුව |
| 4. | වරුසුත් | පෑස්සුම් වැඩ | නවීන උපකරණ මිලදී ගැනීම් අපහසුව |
| 5. | මධුභාෂිණී | මල්පෝච්චි නිශ්පාදනය | අමුද්‍රව්‍ය ලබාගැනීම සඳහා ප්‍රවේශයන් අඩුකම |
| 6. | කුසුමලතා | ඇඳුම් මැසීම | නවීන උපකරණ මිලදී ගැනීමේ අපහසුව ව්‍යාපාර භූමිකව ඇති ප්‍රවේශය මදිකම |
| 7. | සෝමපාල | ඇඳුම් මැසීම | නවීන උපකරණ මිලදී ගැනීමේ අපහසුව ව්‍යාපාර භූමිකව ඇති ප්‍රවේශය මදිකම |
| 8. | ලසන්ත | පැළ තවාන් | රෝග පාලන ක්‍රම, වෙළෙඳපොළවල් සඳහා ප්‍රවේශය |
| 9. | මල්ලිකා | කිරි නිශ්පාදනය | තණකොළ සහ තණබිම් සඳහා ප්‍රවේශයන් මදිකම |
| 10. | කුමාර | කොණ්ඩා කැපීම | ව්‍යාපාර සංවර්ධනය |
| 11. | හඳපාන්ගොඩ | සිමෙන්ති ගඩොල් නිශ්පාදනය | ජලය සහ වැලිවලට ප්‍රවේශයන් අඩුකම, |

| | නම | ‍රකියාව/නිෂ්පාදන | මුහුණපාන ගැටළු |
|---|---|---|---|
| | | | නවීන උපකරණ මිලදී ගැනීමේ අපහසුව |
| 12. | ආරියදාස | කුකුළු ගොවිපොළ | නිවාස සහ ආහාර ක්‍රම |
| 13. | කරුණාරත්න | ගඩොල් නිශ්පාදනය | ඉහළ ඵලදාවක් ඇති සතුන්, නියමිත වේලාවට පශු වෛද්‍ය සේවා ලබාගැනීමේ අපහසුව |
| 14. | ධනපාල | කිරි නිශ්පාදනය | ඉහළ ඵලදාවක් ඇති සතුන්, නියමිත වේලාවට පශු වෛද්‍ය සේවා ලබාගැනීමේ අපහසුතා |
| 15. | කුමාර | කිරි නිශ්පාදනය | සත්ත්ව ආහාර සොයා ගැනීමේ, පැටවුන් සොයාගැනීමේ අපහසුව |
| 16. | මධුසංඛ | ගෘහ භාණ්ඩ නිශ්පාදනය | නවීන උපකරණ මිලදී ගැනීමේ අපහසුව |
| 17. | ශාලික | රූපලාවන්‍ය | ණය ලබාගැනීමේ දුෂ්කරතා, ව්‍යාපාර භූමියක් සඳහා ප්‍රවේශයක් නැතිකම, රජයේ සහයෝගය මදිකම |
| 18. | ලලන්ති | ඇඳුම් මැසීම | ණය ලබාගැනීමේ දුෂ්කරතා, නවීන උපකරණ සඳහා ඇති ප්‍රෙවිශ අඩුකම, අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ අපහසුව |
| 19. | ප්‍රේමසිරි | ගෘහ භාණ්ඩ | නවීන උපකරණ සඳහා ප්‍රවේශය අඩුකම, අමුද්‍රව්‍ය සඳහා ඇති ප්‍රවේශය අඩුකම,ප්‍රවාහන ගැටළු |
| 20. | තිලකරත්න | ගඩොල් නිශ්පාදනය | ජලය සඳහා ප්‍රවේශය අඩුවීම, මැටි සඳහා ප්‍රවේශය අඩුවීම |
| 21. | චන්ද්‍රසිරි | කුකුළු ගොවිපොළ | සත්ත්ව ආහාර සොයාගැනීමේ දුෂ්කරතාව, ණය ලබාගැනීමේ අපහසුකම් |
| 22. | අබේරත්න | වීදුරු කැපීම | ප්‍රවාහන සහ ණය ලබාගැනීමේ ගැටළු |
| 23. | පද්මසිරි | සුරතල් මසුන් ඇතිකිරීම | නොයෙක් මාළු වර්ග සඳහා ප්‍රවේශයක් නොමැතිකම |
| 24. | සෝමසිරි | කුකුළු ගොවිපොළ | නවීන නිවාස සඳහා ඇති ප්‍රවේශයන් මදිකම, සත්ත්ව ආහාරවල මිළ වෙනස්වීම |
| 25. | සරත් | කුකුළු ගොවිපොළ | සත්ත්ව ආහාර සොයා ගැනීමේ අපහසුව, ණය ලබාගැනීමේ දුෂ්කරතා |
| 26. | සිසිර | ගෘහභාණ්ඩ නිෂ්පාදනය | නව උපකරණ සඳහා ප්‍රවේශයන් අඩුකම |

| | නම | රැකියාව/නිෂ්පාදන | මුහුණපාන ගැටළු |
|---|---|---|---|
| 27. | ඉන්ද්‍රානි | පැලතවාන් | තවාන් නිවාස |
| 28. | මුණසිංහ | යකඩ වැඩ | නව උපකරණ, අමුද්‍රව්‍ය |
| 29. | ප්‍රියන්ත | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | නවීන උපකරණ මිලදී ගැනීමේ දුෂ්කරතා, අමුද්‍රව්‍ය සහ ප්‍රවාහනය |
| 30. | රත්නායක | සිමෙන්ති ගඩොල් නිශ්පාදනය | අමුද්‍රව්‍ය, ණය ලබාගැනීමේ ගැටළු |
| 31. | කරෝලිස් | ගෘහ භාණ්ඩ නිශ්පාදනය | නවීන උපකරණ මිලදී ගැනීමට ඇති දුෂ්කරතා, නව උපකරණ පිළිබඳ පුහුණුව මදිකම |
| 32. | ගුණරත්න | පෙදරේරු | පිහන් ගඩොල් ඇල්ලීම පිළිබඳ පුහුණුවක් නොමැතිකම |
| 33. | සෙනෙවිරත්න | රූපලාවන්‍ය සැලූන් | ව්‍යාපාර භූමියක් නොමැති වීම, කුලී ඉහළ ගණන් පැවතීම, ණය ලබාගැනීමේ අපහසුතා, රජයේ සහය මදිකම |
| 34. | ගුණසේන | ගෘහභාණ්ඩ නිශ්පාදනය | ලී සහ නවීන උපකරණ සඳහා ප්‍රවේශයන් අඩුකම |

**වගුව 3.3: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජීවනෝපාය වෘත්තිකයින් මුහුණපාන ගැටළු**

| | නම | වෘත්තිය | ගැටළු |
|---|---|---|---|
| 1. | සිල්වා | මාළු වෙළෙඳාම | ණය ලබා ගැනීමේ අපහසුතා |
| 2. | කුමාරි | ක්‍ෂණික ආහාර නිශ්පාදනය | වෙළෙඳපොළ ප්‍රවේශවීම, ව්‍යාපාරික භූමිය |
| 3. | ජයලත් | යෝගට් සහ අයිස් පැකට් සාදන යන්ත්‍ර නිෂ්පාදනය | අලෙවි කිරීමේ දුෂ්කරතා, රජයේ සහයෝගය අඩුකම |
| 4. | ප්‍රියංකර | සිල්ලර වෙළෙඳාම | බඩු තොග පාලනය කිරීම, ව්‍යාපාර කළමණාකරණය |
| 5. | චන්ද්‍රකාන්ති | ඇඳුම් මැසීම | අමුද්‍රව්‍ය සොයාගැනීමේ අපහසුතා |
| 6. | ගුණසේකර | ඇඳුම් මැසීම | වෙළෙඳපොළ ප්‍රවේශයන් මදිකම |
| 7. | ප්‍රියන්ති | කිරි නිෂ්පාදනය | ව්‍යාපාරික භූමියක් නොමැතිකම |
| 8. | තිලකරත්න | සත්ත්ව පාලනය | තණබිම් සඳහා ප්‍රවේශයන් මදිකම, සේවකයින් අඩුකම |

| | නම | වෘත්තිය | ගැටළු |
|---|---|---|---|
| 9. | හේරත් | සම්ප්‍රදායික කුකුළු ගොවිපොළ | මිළ ගණන් උච්චාවචනය වීම |
| 10. | ඉන්ද්‍රලතා | පැලතවාන් | පුහුණු වැඩසටහන් දේශපාලනීකරණය වීම, ප්‍රවාහන පහසුකම් අඩුකම |
| 11. | ප්‍රේමසිංහ | මාළු වෙළෙඳාම | මූල්‍ය අපහසුතා, ව්‍යාපාර ස්ථානයක් නොමැතිකම |
| 12. | රූපසිංහ | පළතුරු පැල තවාන් | ව්‍යාපාර භූමි සොයා ගැනීමේ අපහසුතා, කාර්මික දැනුම අඩුකම |
| 13. | හේමලතා | පාන වර්ග සෑදීම සහ අලෙවිය | සංචාරක ස්ථාන පිළිබඳව ප්‍රසිද්ධියන්/ප්‍රචාරනයන් මදිකම |
| 14. | රත්නායක | සහල් සහ ධාන්‍ය මෝල් | උපකරණ මදිකම, මුදල් නැතිකම |
| 15. | බණ්ඩා | කොන්ක්‍රීට් විසිතුරු භාණ්ඩ සෑදීම | අමුද්‍රව්‍ය, ඉහළ තරඟකාරීත්වය |
| 16. | වික්‍රම | පැලතවාන් | අලෙවිය, රජයේ වැඩසටහන් දේශපාලනීකරණය |
| 17. | විජේරත්න | ජංගම මාළු වෙළෙඳාම | මෝටර් බයිසිකලයක් මිළදී ගැනීමේ අපහසුතාව |
| 18. | නිමල් | බඩ ඉරිඟු විකිණීම | බඩ ඉරිඟු වගාකරන්නේ කෙසේදැයි දැනගැනීම |
| 19. | ඥාණවතී | ගිනිකූරු නිෂ්පාදනය | අමුද්‍රව්‍ය ලබාගැනීමේ දුෂ්කරතා, වෙළෙඳපොළ සඳහා ප්‍රවේශයන්අඩුකම |
| 20. | ආරියවතී | කිරි පට්ටි, කුකුළු ගොවිපොළ | තණබිම් සදහා ප්‍රවේශයන් මදිකම |
| 21. | සේනාරත්න | නිවාස සැලසුම් | වැඩිදුර පුහුණුව මදිකම |
| 22. | ඩිශාන් | විසිතුරු මසුන් | නිපුණතාවයන් මදිකම, අවශ්‍යතරම් ටැංකි නොමැතිකම, සත්ත්ව ආහාර අඩුකම |
| 23. | රේණුකා | ආහාර සැකසීම | දැනුම සහ නිපුණතා අඩුවීම |
| 24. | ප්‍රියන්ත | මුහුදු මාළු විකිණීම | මූල්‍ය ප්‍රවේශයන් අඩු වීම, ණය ලබා ගනීම සහ බදු වැඩි වීම |
| 25. | සෙනවිරත්න | පානීය ජලය සැකසීම සහ බෙදා හැරීම | වෙළෙඳපොළ ප්‍රවේශයන් අඩුවීම |

| | නම | වෘත්තිය | ගැටළු |
|---|---|---|---|
| 26. | අබේසිංහ | මී කිරි නිශ්පාදනය | කිරි සංරක්ෂණ ක්‍රම, වැසි සමයේදී මැටි හට්ටි සොයා ගැනීමේ අපහසුව, වෙළෙඳපොළ ප්‍රවේශයන්, යන්ත්‍ර සූත්‍ර නොමැති වීම |
| 27. | ජයතිලක | කාබනික පොහොර නිෂ්පාදනය | අලෙවි ප්‍රචාරණය, වෙළෙඳ දැන්වීම්, රජයේ සහාය සහ වෙළෙඳපොළ ප්‍රවේශයන් අඩුවීම |
| 28. | බන්දුසේන | මී කිරි නිෂ්පාදනය | කිරි සංරක්ෂණ ක්‍රම, වැසි සමයේදී මැටි හට්ටි සොයා ගැනීමේ අපහසුතා, වෙළෙඳපොළ ප්‍රවේශයන්, යන්ත්‍ර සූත්‍ර නොමැතිවීම |
| 29. | අරුණශාන්ත | ආහාර සැකසීම | මුදල් නොමැතිකම, ජලය සහ ව්‍යාපාරික ස්ථානවලට ප්‍රවේශයන් |
| 30. | ඉන්දික | ආහාර සැකසීම | මුදල් නොමැතිකම, ජලය සහ ව්‍යාපාරික ස්ථානවලට ප්‍රවේශයන් |
| 31. | ධර්මබන්දු | වේවැල් ආශ්‍රිත නිෂ්පාදන | ස්ථාවර මිලක් නොමැතිවීම, වෙළෙඳපොළ ප්‍රවේශයන් සහ මූල්‍ය ගැටළු |
| 32. | නුවන් | ඇඳුම් මැසීම | මූල්‍ය ප්‍රවේශයන් |

### 3.4 ජීවනෝපාය වෘත්තිකයින් විසින් ලබාගෙන ඇති පුහුණු

3.4 සහ 3.5 වගුමඟින් විවිධ ජීවනෝපාය වෘත්තිකයින්ගේ පුහුණු අවශ්‍යතා පෙන්වා දෙයි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ රජය මඟින් ක්‍රියාත්මක කරනලද දිවි නැගුම වැඩසටහන යටතේ ජීවනෝපාය වෘත්තීන්ගේ පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වා තිබේ. ජීවනෝපාය වෘත්තිකයින් විසින් ලබාගන්නාලද පුහුණුව සම්බන්ධයෙන් පහත සඳහන් දළ කරුණු නිරීක්ෂණය කල හැක.

a. බොහෝ ජීවනෝපාය වෘත්තිකයින් කර්මාන්තගත පුහුණුව ලෙස අවිධිමත් පුහුණුව ලබාගෙන ඇත
b. බොහෝ පුහුණු වැඩසටහන් කෙටිකාලීන ඒවා වේ.
c. ලබාගත් පුහුණුව නිපුණතාවය බෙදාදෙනවා වෙනුවට දැනුවත් කිරීමේ සහ දැනුම ලබාදීමේ සංරචක පමණක් අඩංගුබව පෙනීයයි
d. විශේෂිත තාක්‍ෂණික පුහුණුව ප්‍රමාණවත් නොවේ
e. වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතනවලින් කෙටි කාලීන පුහුණුව ලැබූ පුද්ගලයින් ද ජීවනෝපාය වෘත්තීන්වල නියැලීමට තෝරාගෙන තිබේ.
f. තිරසාර අනාගත වර්ධනය වන ව්‍යවසායන්ට වඩා බොහෝ ජීවනෝපාය වෘත්තිකයන් නියළී සිටින මෙම වෘත්තීන් හුදෙක් ජීවත්වීම සඳහා වේ.

වගුව 3.4: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවනෝපාය වෘත්තිකයින් විසින් දැනට ලබාගෙන ඇති පුහුණුව

| නම | පුහුණුවේ ස්වභාවය/ ආයතනය | කාලය |
|---|---|---|
| හේමමාලි | වැඩමුළුවක් | දින 01 |
| ගුණසේන | කාර්මික විද්‍යාලය | මාස 06 |
| කුසුමලතා | ඇඳුම් මැසීම | මාස 06 |
| සෝමපාල | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | මාස 06 |
| කුමාර | කරණවෑමියා | මාස 06 |
| හඳපාන්ගොඩ | වැඩමුළුවක් | දින 02 |
| නිසන්සලා | වෘත්තීය පුහුණුව | මාස 06 |
| සෙනෙවිරත්න | ජාතික වෘත්තීය සුදුසුකම් - මනාලියන් ඇන්දවීම, කේක් සෑදීම | වසර 01 |
| ලලන්ති | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | වසර 1 ½ |
| මුණසිංහ | වෘත්තීය පුහුණුව | මාස 06 |
| ජයසේන | රූපලාවන්‍ය ශිල්පී | මාස 10 |
| ප්‍රියන්ත | කාර්මික විද්‍යාලය | මාස 10 |
| කරෝලිස් | වෘත්තීය පුහුණුව | මාස 06 |
| සෙනෙවිරත්න | කේක් සෑදීම, මනාලියන් ඇන්දවීම, රූපලාවන්‍ය ශිල්පී, ජාතික තරුණ සේවා සභාව | මාස 07 |
| ගුණසේන | කාර්මික විද්‍යාලය | මාස 06 |

වගුව 3.5: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජීවනෝපාය වෘත්තිකයින් විසින් දැනට ලබාගෙන ඇති පුහුණුව

| නම | පුහුණුවේ ස්වභාවය/ ආයතනය | කාලය |
|---|---|---|
| සිල්වා | අවිධිමත් පුහුණුව | - |
| කුමාරි | අවිධිමත් පුහුණුව | - |
| ජයලත් | කර්මාන්ත පුහුණුව | වසර 02 |
| ප්‍රියංකර | අවිධිමත් පුහුණුව | - |
| චන්ද්‍රකාන්ති | ඇඳුම් මැසීම පිළිබඳ අවිධිමත් පුහුණුව | - |
| ගුණසේකර | ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4, රූපලාවන්‍ය ශිල්පී | මාස 06 |

| නම | පුහුණුවේ ස්වභාවය/ ආයතනය | කාලය |
|---|---|---|
| ප්‍රියන්ති | අවිධිමත් පුහුණුව | - |
| තිලකරත්න | කිරිමණ්ඩලය මඟින් ලබාදුන් පුහුණුව | වසර 01 |
| හේරත් | අවිධිමත් පුහුණුව | - |
| ප්‍රේමසිංහ | ආහාර සැකසීම පිළිබඳව අවිධිමත් පුහුණුව | - |
| රූපසිංහ | අවිධිමත් පුහුණුව | - |
| හේමලතා | අවිධිමත් පුහුණුව | - |
| රත්නායක | අවිධිමත් පුහුණුව | - |
| තිලකරත්න බණ්ඩා | කාර්මික විද්‍යාලය | මාස 03 |
| ඥාණවතී | ජීවනෝපාය පුහුණුව, සමෘද්ධි වැඩසටහන | දින 02 |
| ආරියවතී | අවිධිමත් පුහුණුව | - |
| සේනාරත්න | සැලසුම් ශිල්පී<br>ඔටෝ කැඩ් | වසර 01<br>මාස 06 |
| අබේසිංහ | කාර්මික විද්‍යාලය | - |
| ජයතිලක | කෘෂිකාර්මික පුහුණුව | - |
| ධර්මබන්දු | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ලබාදුන් විලාසිතා නිර්මාණය | මාස 03 |
| නුවන් | බිරිඳ විසින් උගන්වන ලද ඇඳුම් මැසීමේ පාඨමාලාව | - |

එලෙසම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවි නැගුම වැඩසටහන මඟින් පවත්වන ලද අවිධිමත් විවිධ පුහුණු වැඩසටහන් පිළිබඳව 3.6 වගුවේ ලේඛනගතකර ඇත. උප අංශ ගණනාවක ජීවනෝපාය වෘත්තිකයින් ඉලක්ක කරගෙන දිවි නැගුම වැඩසටහන පුහුණු වැඩසටහන් විශාල ප්‍රමාණයක් පවත්වා ඇත. ඒවා නම්; ආහාර හා පාන වර්ග, අත්කම්, විදුලි කාර්මික, රසායනික භාවිතය සහ සැකසුම්, සිමෙන්ති ආශ්‍රිත නිශ්පාදන, ලී ආශිත නිෂ්පාදන, රෙදිපිළි සහ ඇඟළුම්, නිමි ඇඳුම්, සපත්තු සහ සම්භාණ්ඩ, කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන සහ විවිධ සේවා. ඉහත ලැයිස්තුගතකර ඇති සියළු උප අංශ ආවරණය වන පරිදි දිවි නැගුම වැඩසටහන මඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැඩසටහන් 696 ක් පවත්වා ඇත (3.6 වගුව).

**වගුව 3.6: ශ්‍රී ලංකාවේ ජීවනෝපාය වෘත්තිකයින්ට කර්මාන්ත කාණ්ඩ අනුව දිවි නැගුම වැඩසටහන යටතේ ලබාදුන් පුහුණුව**

**Divi-Neguma National Program on Cottage Industry**

***Progress of District Technology Transfer and Training Programs (Sector wise)***

| # | District | Number of Beneficiaries Trained | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | F&B | Handi. | Elect. | Chem. | Cement | Wood | Coco. | K&P | T&A | Garm. | S&L | Paper | Serv. | Misce. |
| 1 | Colombo | 187 | 13 | 8 | 90 | 12 | - | 5 | - | 31 | 36 | 22 | 8 | 192 | - |
| 2 | Anuradhapura | 156 | 69 | 9 | 66 | 11 | 39 | - | 12 | 15 | 85 | 28 | 40 | 58 | 7 |
| 3 | Kegalle | 260 | 88 | 4 | 88 | 21 | 149 | 12 | - | 60 | 142 | 20 | 56 | 502 | - |
| 4 | Gampaha | 241 | 112 | 18 | 89 | 15 | 41 | - | - | 113 | 24 | 59 | 25 | 438 | 14 |
| 5 | Jaffna | 159 | 88 | - | 10 | 1 | 83 | 10 | 143 | 248 | 55 | - | - | 309 | 11 |
| 6 | Moneragala | 90 | 38 | 6 | 12 | 6 | 19 | - | - | 2 | 1 | 18 | 23 | 172 | 3 |
| 7 | Puttlam | 76 | 38 | 15 | 4 | 5 | 3 | - | 46 | 7 | 24 | 37 | 28 | 69 | - |
| 8 | Mannar | 211 | 25 | 9 | 8 | 16 | 99 | - | 50 | 179 | 73 | 1 | - | 358 | 20 |
| 9 | Kandy | 223 | 71 | 8 | 47 | 7 | 36 | - | - | 19 | 93 | 41 | 49 | 53 | 19 |
| 10 | Ratnapura | 324 | 45 | 15 | 26 | 9 | 38 | - | - | 6 | 233 | 29 | 63 | 84 | 2 |
| 11 | Hambanthota | 342 | 514 | 11 | 24 | 4 | 62 | - | 74 | 18 | 356 | 32 | 49 | 72 | 3 |
| 12 | Matale | 273 | 33 | 10 | 60 | 2 | 39 | 18 | - | 9 | 46 | - | 26 | 49 | 7 |
| 13 | Badulla | 320 | 24 | 1 | 96 | 14 | 72 | 36 | - | 15 | 64 | 3 | 61 | 136 | 1 |
| 14 | Killinochchi | 45 | 15 | - | - | 40 | - | - | 88 | 66 | - | - | 34 | 20 | - |
| 15 | Mullaithivu | 130 | 18 | - | 92 | 8 | 3 | - | 49 | 6 | - | 24 | 51 | 1 | - |
| 16 | Polonnaruwa | 116 | 26 | 19 | 85 | 9 | 85 | - | - | 12 | 218 | 2 | 2 | 96 | 6 |
| 17 | Batticaloa | 129 | 1 | - | 64 | - | 24 | 6 | 240 | - | 214 | - | - | 30 | - |
| 18 | Galle | 119 | 149 | - | 79 | 3 | 202 | 41 | - | 63 | 339 | - | 1 | 177 | 14 |
| 19 | Vavuniya | 10 | - | - | 5 | 16 | - | 3 | 63 | 7 | - | - | 1 | 102 | 2 |
| 20 | Trincomalee | 140 | - | - | 2 | 16 | - | - | 37 | 14 | - | - | - | - | 1 |
| 21 | Nuwara-Eliya | 26 | - | - | 126 | 9 | - | - | - | 8 | - | 1 | - | 101 | 8 |
| 22 | Kalutara | 245 | 10 | 6 | 71 | 12 | 38 | - | 1 | 18 | 4 | - | - | - | 13 |
| 23 | Kurunegala | 306 | - | 1 | 178 | 5 | - | - | - | 13 | - | 1 | - | - | 1 |
| 24 | Matara | 340 | - | - | 208 | - | 58 | 70 | - | 20 | - | - | - | - | - |
| | **Total** | **4468** | **1377** | **140** | **1530** | **241** | **1090** | **201** | **803** | **943** | **2007** | **318** | **517** | **3019** | **132** |
| | **Grand Total** | | | | | | | | | | | | | | **16786** |

**F&B** – Food and Beverages **Handi.**– Handicrafts **Elect.** – Electronics **Chem.** – Chemical based **Cement** – Cement based **Wood** – Wood based
**Coco.**- Coconut based **K&P** – Kithul and Palmyrah **T&A** – Textile and Apparel **Garm.** – Garments **S&L** – Shoe and Leather **Paper** – Paper based
**Serv.** – Services **Misce.** - Miscellaneous

3.7 වගුව මඟින් ජීවනෝපාය වෘත්තිකයින් සඳහා විවිධ පුහුණු පාඨමාලා පැවැත්වීම සම්බන්ධ වූ ආයතන ලේඛනගතකර ඇත. ඒවා නම්; කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, විද්‍යා සම්පත් මධ්‍යස්ථානය, ජාතික ව්‍යවසාය සංවර්ධන ආයතනය, ජාතික ශිල්ප සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය, කාර්මික තාක්ෂණ ආයතනය, ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය, රෙදිපිළි දෙපාර්තමේන්තුව, තල් සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රෙදිපිළි සහ ඇඟළුම් ආයතනය, ජාතික ඉංජිනේරු සහ පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය, සහ පොල් සංවර්ධන අධිකාරිය. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ජීවනෝපාය වෘත්තිකයින් සඳහා පුහුණු පාඨමාලා ලබාදීමට සැලසුම් කරන්නේ නම් මෙම ආයතන හරහා එම පුහුණුව ලබාදීම ඉතා යෝග්‍ය වේ. මෙම ආයතන විශේෂඥ දැනුම ලබාදීමට නැඹුරුවන අතර විශේෂිත පුහුණු පාඨමාලා පවත්වන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුමක් ඇත.

වගුව 3.7: ශ්‍රී ලංකාවේ ජීවනෝපාය වෘත්තිකයින්ට පුහුණුව සපයන්නන් විසින් දිවි නැගුම නැගුම වැඩසටහන යටතේ ලබාදුන් පුහුණුව

**Divi-Neguma National Program on Cottage Industry**

***Progress of District Technology Transfer and Training Programs (Institution wise)***

| # | District | Number of Beneficiaries Trained | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | IDB | VIDATHA | NEDA | NCC | SEDD | NDC | ITI | NERD | PDB | SLITA | Textile | ACCC | CDA | Total |
| 1 | Colombo | 117 | 86 | 52 | 47 | 142 | 4 | 31 | 115 | - | - | 2 | 8 | - | 604 |
| 2 | Anuradhapura | 241 | 95 | 9 | 119 | 28 | 21 | 29 | 24 | 12 | - | 8 | 9 | - | 595 |
| 3 | Jaffna | 239 | 46 | 19 | 201 | 252 | 77 | 57 | 1 | 123 | 92 | - | - | 10 | 1117 |
| 4 | Kegalle | 652 | 217 | 125 | 111 | 157 | 15 | 26 | 22 | - | 61 | - | 4 | 12 | 1402 |
| 5 | Gampaha | 424 | 145 | 22 | 156 | 211 | 30 | 46 | 59 | - | 46 | 32 | 18 | - | 1189 |
| 6 | Moneragala | 136 | 54 | 5 | 55 | 87 | 12 | 22 | 12 | - | - | 1 | 6 | - | 390 |
| 7 | Puttlam | 149 | 15 | 16 | 45 | 29 | 01 | 14 | 15 | 46 | - | 7 | 15 | - | 352 |
| 8 | Mannar | 176 | 42 | 99 | 50 | 187 | 91 | 95 | 16 | 30 | 263 | - | - | - | 1049 |
| 9 | Kandy | 133 | 226 | 88 | 131 | 30 | 18 | 13 | 19 | - | - | 3 | 5 | - | 666 |
| 10 | Ratnapura | 316 | 147 | 183 | 73 | 74 | 38 | 10 | 13 | - | - | 5 | 15 | - | 874 |
| 11 | Polonnaruwa | - | 94 | 212 | 95 | 86 | 75 | 17 | 67 | - | - | 11 | 19 | - | 676 |
| 12 | Hambanthota | 185 | 196 | 357 | 494 | 72 | 57 | 117 | 19 | 35 | - | 18 | 11 | - | 1561 |
| 13 | Badulla | 369 | 77 | 101 | 53 | 91 | 70 | 15 | 16 | - | - | 15 | - | 36 | 843 |
| 14 | Matale | 100 | 137 | 115 | 80 | 44 | 35 | 18 | 14 | - | - | 4 | 7 | 18 | 572 |
| 15 | Killinochchi | 89 | - | - | 51 | - | - | - | 59 | 83 | - | 20 | - | - | 302 |
| 16 | Galle | - | 96 | 384 | 193 | 155 | 202 | 67 | 22 | - | 16 | 11 | - | 41 | 1187 |
| 17 | Mullaithivu | 177 | - | 75 | 24 | - | - | 37 | 15 | 48 | - | 6 | - | - | 382 |
| 18 | Vavuniya | - | 9 | - | 35 | 67 | - | 8 | 20 | 63 | - | 7 | - | - | 209 |
| 19 | Batticaloa | - | 136 | 214 | 40 | - | 23 | 42 | 7 | 240 | - | - | - | 6 | 708 |
| 20 | Nuwara-Eliya | - | 31 | 106 | - | 122 | - | - | 12 | - | - | 8 | - | - | 279 |
| 21 | Trincomalee | - | 27 | - | - | - | - | - | 132 | 37 | - | 14 | - | - | 210 |
| 22 | Kalutara | - | 238 | - | - | - | 38 | - | 15 | - | 117 | 10 | - | - | 418 |
| 23 | Kurunegala | - | 48 | 262 | - | 89 | - | 60 | 35 | - | - | 11 | - | - | 505 |
| 24 | Matara | - | 184 | 315 | - | 64 | 58 | - | 20 | - | - | 20 | - | 35 | 696 |
| | **Total** | **3503** | **2346** | **2759** | **2053** | **1987** | **865** | **724** | **749** | **717** | **595** | **213** | **117** | **158** | **16786** |

**IDB** – Industrial Development Board
**NEDA**- National Enterprise Development Authority
**NCC**- National Crafts Council
**NDC**- National Design Centre
**SEDD** -Small Enterprises Development Division
**ITI**- Industrial Technology Institute
**ACCC**- Arthur C. Clerk Centre
**Textile** – Textile Department
**PDB**- Palmyrah Development Board
**SLITA**-Sri Lanka Institute of Textile Apparel
**NERD**- National Engineering and Research Development Centre
**CDA** - Coconut Development Authority
**VIDATHA** – VIDATHA Research Centre

3.8 වගුව මගින් සිද්ධි අධ්‍යයනවලින් මතුවී පෙනුන පරිදි එක් එක් වෘත්තීය කාණ්ඩවල ජීවනෝපාය වෘත්තිකයින්ගේ අනාගත පුහුණු අවශ්‍යතා ලේඛනගතකර ඇත. සිද්ධි අධ්‍යයන වලදී දිස්ත්‍රික්ක දෙකෙහිම සාකච්ඡාවට බාජනය කරන ලද පුද්ගලයින්ගෙන්, සියළුම ජීවනෝපාය වෘත්තිකයින් පාහේ පවසන ලද්දේ ඔවුන්ට තමතමන්ගේ ක්ෂේත්‍රවල විශේෂිත නිපුණතාවය පදනම් කරගත් පුහුණුව අවශ්‍ය බවයි. මෙයින් ඇඟවෙන්නේ විවිධ රජයේ වැඩසටහන් මගින් පුහුණුව ලබාගෙන ඇති සියළුම ජීවනෝපාය වෘත්තිකයන්ම පාහේ, ඔවුන්ට අවශ්‍ය විශේෂිත කුසලතා පදනම්කරගත් පුහුණු බවට විශ්වාස කරන බවයි.

වගුව 3.8 : උතුරු මැද පළාතේ දිස්ත්‍රික්ක දෙකෙහි පුද්ලයින්ගේ පුහුණු අවශ්‍යතා

| වෘත්තීය කාණ්ඩය | පුහුණු ක්ෂේත්‍රය/ අපේක්ෂිත නිපුණතා |
|---|---|
| ආහාර සහ පාන වර්ග | ආහාර සහ පාන සැකසීම, ඇසුරුම් කිරීම, ආරක්ෂාකිරීම, ආරක්ෂාව සහ සෞඛ්‍ය කරුණු |
| හස්ත කර්මාන්තය | කලා සහ ශිල්පීය පුරුදු, නිර්මාණ සහ තාක්ෂණය, නව නිෂ්පාදන සංවර්ධනය, අලෙවිකරණය |
| ඉලෙක්ට්‍රොනික් | නඩත්තු කිරීම, අළුත්වැඩියාව |
| රසායනික ද්‍රව්‍යමත පදනම් වූ | මිශ්‍රකිරීම, අච්චු සෑදීම, නිර්මාණ කිරීම, නිෂ්පාදන සංවර්ධනය, ව්‍යාපාර සංවර්ධනය |

| වෘත්තීය කාණ්ඩය | පුහුණු ක්ෂේත්‍රය/ අපේක්ෂිත නිපුණතා |
|---|---|
| දැව ආශ්‍රිත | වෘත්තීය කළමණාකරණ සංවර්ධනය, දැව සැකසුම්කරණය සහ නිමාකිරීමේ තාක්‍ෂණය, ගෘහ භාණ්ඩ නිර්මාණ සැදීම |
| පොල් ආශ්‍රිත | - |
| කිතුල් සහ තල් | පැණි සහ හකුරු සැදීම, ඇසුර්ම් කිරීම, ආරක්‍ෂා කිරීම, සෞඛ්‍ය ක්‍රම |
| රෙදි පිළි | මෝස්තර නිර්මාණය, මැසීම, නිෂ්පාදන සංවර්ධනය |
| ඇඟළුම් | යන්ත්‍ර ක්‍රියාකිරීම, මෝස්තර නිර්මාණය, මිනුම් ලබාගැනීම සහ කැපීම, තත්ත්ව පාලනය |
| පාවහන් සහ සම්භාණ්ඩ | නිෂ්පාදන මෝසතර නිර්මාණය |
| කඩදාසි ආශ්‍රිත | නිෂ්පාදනය කිරිම |
| සේවා | එක් එක් සේවාවලට විශේෂයෙන් සැකසූ පුහුණුව |
| සුළු පරිමාණ කෘෂිකාර්මික නිෂ්පාදන | තිරසාර වගාක්‍රම/ පිළිවෙත්, කාබනික පොහොර නිෂ්පාදනය, කුඩා ගොවීන් සඳහා පසු අස්වනු තාක්‍ෂණය, අපද්‍රව්‍ය කළමණාකරණය, රෝග/ පරපෝෂිතයන් වැලැක්වීම සහ පාලනය කිරීම |
| මිරිදිය ධීවර | ධීවර තාක්‍ෂණය, මාළු ගබඩා කිරීම, මාළු පිරිසිදු කිරිම සහ සැකසීම, උපකරණ නඩත්තුකිරීම |
| පශු සම්පත් සහ කුකුළු ගොවිපොළ | නිවාසය පද්ධති ක්‍රම, ආහාර ලබාදීම සහ ආහාර ලබාදීමේ ක්‍රම, රෝග/ පරපෝෂිතයන් වැලැක්වීම සහ පාලනය කිරීම, දෛනික හා විශේෂිත ක්‍රියාකාරකම් |
| ගෙවතු වගාව | උද්‍යාන විද්‍යා තාක්‍ෂණය, සංරක්‍ෂණය කිරීම සහ ඉඩම් කළමණාකරණය, රුක් වගා තාක්‍ෂණය, මල්වගා තාක්‍ෂණය, උද්‍යාන අලංකරණය, තවාන් නඩත්තු කිරීම, උද්‍යාන/ ගෙවතු නඩත්තු කිරීම |

අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල පවත්වන ලද සිද්ධි අධ්‍යයන සම්මුඛ පරීක්‍ෂණ හරහා අප විසින් නිරීක්‍ෂණය කරන ලද කරුණු අනුව හේතු ගණනාවක් නිසා ජීවනෝපාය වෘත්තිකයින්ගේ පුහුණු සැලසුම් කිරීමේ දී ඇතැම් අභියෝග හා ප්‍රශ්න නිරාකරණය කරගැනීමට අවශ්‍ය වේ. ජීවනෝපාය වෘත්තීන්වල නියැලී සිටින පුද්ගලයින් නොයෙක් සමාජ ආර්ථික පසුබිම්වලින් සහ විවිධ අධ්‍යාපන මට්ටම්වලින් පැමිණෙති. ඔවුන් විවිධ පුහුණු අවශ්‍යතා ඇති බව පෙන්වයි. ඇතැම් සාමාන්‍ය පුහුණු අවශ්‍යතා පවතින අතර විවිධ ජීවනෝපාය වෘත්තීන් සඳහා ඒ වෙනුවෙන් වෙනස් කරන ලද පුහුණු ප්‍රතිපාදන අවශ්‍ය බව පෙනෙන්නට තිබේ. පුහුණුව සැපයීම සඳහා පහත සඳහන් ගැටළු සහ අභියෝග සැලකිල්ලට ගත යුතුය.

a. විවිධ රජයේ ආයතන විසින් ජීවනෝපාය වෘත්තිකයින් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් බොහෝමයක් මූලික දැනුවත්කිරීම් වැඩසටහන් සහ දැනුම බෙදාහැරීමේ ආකාරයේ ඒවා වන අතර, නිපුණතාවය ලබාදීමේ පුහුණු වැඩසටහන් නොවේ. සිද්ධි අධ්‍යයනයේදී සම්මුඛ පරීක්ෂණයට ලක්කරන ලද ජීවනෝපාය වෘත්තිකයින්ගේ අදහසට අනුව ඔවුන්ට අවශ්‍ය වන්නේ තම වෘත්තියට/ නිෂ්පාදනයට/ සේවාවට විශේෂිත වූ ජීවනෝපාය වෘත්තීන් වැඩි දියුණු කරගැනීම සඳහා උසස් නිපුණතාවයන් ලබාදෙන පුහුණුවක් වේ. මෙයින් පෙන්නුම් කෙරෙන්නේ දේශන සහ කථා පැවැත්වීමට වඩා ප්‍රායෝගික නිපුණතා වැඩි ප්‍රතිශතයක් ලබාදෙන පුහුණු වැඩසටහන් අවශ්‍ය බවයි.

b. තවද ජීවනෝපාය වෘත්තිකයින් විසින් ඔවුන්ට රජයෙන් වෙළෙඳපොළ ලබාගැනීමට ප්‍රවේශයක්, නිෂ්පාදන ප්‍රවර්ධනය, වාසිදායක බදු පාලන තන්ත්‍රයන්, සහ පහසු නියාමන ව්‍යුහයන් සඳහා සහාය අවශ්‍ය බවද සඳහන්කර ඇත. මෙම අංශ පිළිබඳව පුහුණුව ද අවශ්‍ය වේ.

c. පුහුණු වන්නන්ගේ සමාජ-ආර්ථික පරිසරය පැහැදිලි ලෙස අවබෝධකර ගැනීමට අවශ්‍යවන අතර අවශ්‍ය පරිදි ප්‍රතික්‍රියා කලයුතුය. පුහුණු මට්ටම් හඳුනාගැනීමට ගැටළු විශ්ලේෂණය කිරීමේ මෙවලමක් භාවිතා කල යුතු බව පෙනෙන්නට තිබේ. මෙම පුහුණු වැඩසටහන් පුළුල් සංවර්ධන මූලපිරීම් සමඟ ක්ෂේත්‍ර කාර්යයන් ඒකාබද්ධ කිරීම අවශ්‍ය වේ.

d. වෘත්තීන්ගේ විවිධත්වය ඇතිකල යුතු වේ. පුහුණුව සඳහා 'සරල නිපුණතා හිඟය' ප්‍රවේශය ප්‍රයෝජනවත් නොවිය හැකිය. පළමුව පුද්ගලයින් කොපමණ දුරට දන්නේ ද යන්න සොයා බලා ඒ මට්ටමේ සිට පුහුණුව ආරම්භකිරීම සහ එයට වැඩිදුර කුසලතා ගොඩනැගීම අවශ්‍ය වේ. ග්‍රාමීය වෘත්තියන්හි බොහෝවිට නොයෙක් ජීවනෝපාය සංරචක ඇති බැවින් පුහුණු වැඩසටහන්වලදී ඒවා හඳුනාගත යුතුය. තිරසාර ග්‍රාමීය ජීවනෝපාය බොහෝවිට දේශීය සහ නවීන නිපුණතා යන දෙකෙහිම සංකලනයක් වේ.

e. බොහෝ අනාගත පුහුණුවන්නන් ඉතා කෙටි කාලසීමාවක් ඇති පුහුණු වැඩසටහන් සඳහා කැමැත්තක් දක්වන බව පෙනී යයි. මෙය වැඩිවශයෙන් එක් දින පුහුණු වැඩසටහන් සඳහා වේ. මෙය ප්‍රමාණවත් කුසලතාවයන් උත්පාදනයකර ඵලදායී හා අර්ථවත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බරපතල බාධාවක් විය හැකිය. පුහුණු වැඩසටහන් සැලසුම්කිරීමේදී මේ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

## 3.5 සාරාංශය සහ නිර්දේශ

අපගේ ක්ෂේත්‍ර නිර්දේශ පදනම් කරගෙන සලකාබැලීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්දේශ ගොඩනගා ඇත.

a. දැනට පවතින පුහුණු වැඩසටහන් විශාල වශයෙන් දැනුවත් කිරීමේ මට්ටමේ වැඩසටහන් බව පුහුණුවන්නන්ගේ අදහස වන අතර නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් අවශ්‍ය වේ.

b. විවිධ කර්මාන්ත අංශවල අවශ්‍යතාවයන්ට අනුව ගැලපෙන ලෙස පුහුණු වැඩසටහන් වෙනස් විය යුතුයි

c. වත්මන් පුහුණු වැඩසටහන් බොහෝදුරට සාමාන්‍යකරණය වූ ස්වභාවයේ වැඩසටහන් වන බැවින් අදාල ක්ෂේත්‍රවල විධිමත් පුහුණු පාඨමාලා පවත්වා විශේෂඥයින්ගේ මැදිහත්වීමක් අවශ්‍ය වේ. මෙයට විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයින් අවශ්‍ය විය හැකිය.

d. ජීවනෝපාය වෘත්තීන්වල නියැලී සිටින පුද්ගලයින් සඳහා ප්‍රායෝගික යෙදුම් සමඟ යාවජීව ඉගෙනුම් ක්‍රමයක් සැලසුම්කිරීම සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

e. බොහෝ පුහුණුවන්නන් ඔවුන්ගේ අදාල ව්‍යාපාරික ස්ථානවල පවත්වන ක්ෂේත්‍රගත නිපුණතා සංවර්ධන පුහුණුවට වැඩි කැමැත්තක් දක්වයි.

f. පුහුණු වැඩසටහන් වැඩියෙන් ප්‍රායෝගික පුහුණුවමත වැඩි අවධානයක් යොමුකර යුතුය

g. පුහුණු වැඩසටහන්වලට වෘත්තීය වර්ගීකරණය සහ ප්‍රමිතිකරණ පද්ධතියක් ද ඉවහල් විය හැකිය

h. නිපුණතා නැඹුරුව/කාර්මික පුහුණුව සහිත පුහුණුවක් ලබාදිය යුතුය

i. බොහෝ පුහුණුවන්නන් දිගු කාලයක් පවත්වාගෙ යන සහ නොකඩවා පවත්වාගෙන යන පුහුණු පාඨමාලා සඳහා වැඩි කාලයක් වැය කිරීමට අපේක්ෂා නොකරන බැවින් විසම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කල හැකියි.

## 04 වන පරිච්ඡේදය

## කර්මාන්ත ක්ෂේත්‍රවල දැනට පවතින සහ පුරෝකථනය කරන ලද මානව සම්පත් අවශ්‍යතාවය

### 4.1 කර්මාන්ත නැඹුරුව පිළිබඳ දළ විශ්ලේෂණය

උතුරු මැද පළාතේ ඉහළින්ම පවතින්නේ වී වගාව වන අතර, ජීවනෝපාය වෘත්තීන් දෙවන වැඩිම නැඹුරුතාවය පෙන්වයි. ගොවිපොළ නොවන ආර්ථික කටයුතු පැවතීම විශාල ප්‍රමාණයකින් අඩුවේ. කෙසේ වෙතත්, මෙම කලාපය පෞරාණිකත්වයමත පදනම් වූ සංචාරක කර්මාන්තය සඳහා ප්‍රචලිත බැවින් සැලකිය යුතු ලැගුම්හල් ප්‍රමාණයක් පවතී. තවද, ඉදිකිරීම්, සිල්ලර සහ තොග වෙළෙඳාම්, බැංකු සහ මූල්‍ය, සනීපාරක්ෂාව සහ රථවාහන නඩත්තුව යන අංශ සේවා ක්ෂේත්‍රයේ ඉහළින්ම ඇත. නිෂ්පාදන ක්ෂේත්‍රය විශාල ලෙස සුළු සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට සීමා වී ඇත. පළාතේ ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍ර හඳුනාගැනීමේ දී ආර්ථික කටයුතුවල සංයුතිය සහ වර්ථමාන වර්ධන නැඹුරුව අප විසින් සලකන ලදී.

මුළු බිම් ප්‍රමාණයමත සලකන විට උතුරු මැද පළාත ශ්‍රී ලංකාවේ විශාලතම පළාත වේ. උතුරු මැද පළාතේ ආර්ථිකයේ ක්ෂේත්‍ර සංයුතිය විග්‍රහ කිරීමේ දී කාර්මික අධ්‍යාපන සහ පුහුණු ආයතනවලින් පුහුණුව ලබා ඇති පුද්ගලයින් සඳහා සැලකියයුතු ඉල්ලුමක් තිබීම ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට උදව් වේ. 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයට දැක්වූ දායකත්වය අනුව උතුරු මැද පළාත දුර්වලම ආර්ථික ඇති පළාත් වලින් එකක් වේ. බස්නාහිර පළාත දළ ජාතික නිෂ්පාදනය සඳහා 42% ක දායකත්වයක් ලබාදෙන විට උතුරු මැද පළාතේ දායකත්වය 5.1% ක් පමණි. ඌව සහ උතුරු පළාත් හැර ඉතිරි සියළුම පළාත්වල මාසික දළ ජාතික නිෂ්පාදනය සඳහා දායකත්වය උතුරු මැද පළාතේ දායකත්වයට වඩා වැඩිවේ. (වගුව 4.1)

උතුරු මැද පළාතේ දුර්වල ආර්ථිකයක් පෙන්නුම් කරනුයේ රටේ අනෙකුත් පළාත් සමඟ සන්සන්දනය කරන විට ශ්‍රමය අන්තර්ග්‍රහනය කර ගැනීමට ඉතා අවම හැකියාවක් ඇති පළාතක් ලෙසයි. උතුරු මැද පළාතේ වර්ථමාන සහ අනාගත රැකියා පැතිකඩ පළාතේ සාපේක්ෂ ආර්ථික ශක්තියමත රඳා පවතී.

උතුරු මැද පළාතේ ආර්ථිකයේ ආංශික ව්‍යුහය අනුව කෘෂිකර්ම ක්ෂේත්‍රය පළාත් දළ දේශීය නිෂ්පාදනයට 13.8% කින් දායකත්වය දක්වයි. මේ අතර කර්මාන්ත සහ සේවා ක්ෂේත්‍ර වලින් පිළිවෙලින් 21.3% ක් සහ 64.8% ක දායකත්වයක් ලබාදෙයි (4.2 වගුව). පළාතේ රැකියාගතවීමේ විභවය තේරුම් ගැනීමට කුමන හෝ උත්සාහයක් ගැනීමට සිදුවේ. පළාතේ ශ්‍රම වෙළෙඳපොළ

අන්තර්ග්‍රහනය කරගැනීමේ වැඩිම විභවයක් ඇත්තේ සේවා අංශයේ වන අතර කර්මාන්ත අංශයේ ඊට පසු විභවය පවතී. උතුරු මැද පළාතේ ක්ෂේත්‍රීය ශ්‍රම අන්තර්ග්‍රහන ක්ෂේත්‍රයද ඉතා වැදගත් වේ.

**වගුව 4.1: 2014 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයේ පළාත් දායකත්වය**

| පළාත | ශ්‍රී ලංකාවේ මුළු දළ ජාතික නිෂ්පාදියෙන් ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|
| බස්නාහිර | 42.0 |
| දකුණ | 10.8 |
| වයඹ | 10.7 |
| මධ්‍යම | 10.4 |
| සබරගමුව | 6.7 |
| නැගෙනහිර | 5.8 |
| උතුරු මැද | 5.1 |
| ඌව | 5.0 |
| උතුර | 3.6 |

*මූලාශ්‍රය: www.cbsl.gov.lk, 2015*

**වගුව 4.2: 2014 දී උතුරු මැද පළාත් දළ ජාතික නිෂ්පාදිතයට ක්ෂේත්‍ර දායකත්වය**

| කාණ්ඩය | මුළු පළාත් දළ ජාතික නිෂ්පාදිතයෙන් ප්‍රතිශතය (%) |
|---|---|
| කෘෂිකර්මය | 13.8 |
| කර්මාන්ත | 21.3 |
| සේවා | 64.8 |

*මූලාශ්‍රය: www.cbsl.gov.lk, 2015*

පළමුව උතුරු මැද පළාතේ කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතන මඟින් ලබාදෙන පුහුණුව නිපුණ ශ්‍රමිකයන් ආකර්ශනයකර ගැනීමට තරම් ව්‍යුහගත වී නොමැත. උතුරු මැද පළාතේ කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා ජාතික, වෘත්තීය සුදුසුකම් ලැබූ පුද්ගලයින් සඳහා කිසිඳු ඉල්ලුමක් නොමැති වීම මඟින් මෙය පැහැදිලි වේ. උතුරු මැද පළාතේ ජනගහනයෙන් බහුතරයකින් ඔවුනගේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය ලෙස කෘෂිකර්මය මත රඳාපවතී. වී වගාව ගොවීන් අතර ඉතා ජනප්‍රිය බෝගවගාව වේ. මේ අතර අනෙකුත් බෝගවගා වන්නේ බඩ ඉරිඟු, මෙනේරි, සෝයාබෝංචි, වම්බටු, ගම්මිරිස්, කෙසෙල්, වට්ටක්කා වැනි බෝග වේ. නිෂ්පාදන ක්‍රියාවලියේ දී

සරල යන්ත්‍ර සහ උපකරණ භාවිතා කරයි (4.3 වගුව). මෙම ක්‍රියාකාරකම් ජීවනෝපාය වෘත්තීන් යටතේ සාමාන්‍යයෙන් වර්ගීකරණය කල හැකිය.

**වගුව 4.3: උතුරු මැද පළාතේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි 2011-2012 වර්ෂ තුල කර්මාන්ත අනුව පළාත් දළ දේශීය නිෂ්පාදිතය (රු. මිලියන වලින්)**

| උප ක්ෂේත්‍රය | 2011 | 2012 |
|---|---|---|
| තේ | - | - |
| රබර් | - | - |
| පොල් | 3435 | 4392 |
| සුළු අපනයන බෝග | 4 | 5 |
| වී | 25167 | 27547 |
| පශු සම්පත් | 5621 | 6067 |
| වෙනත් ආහාර බෝග | 22258 | 24025 |
| වැවිලි | 220 | 354 |
| දර සහ වනවගා | 5261 | 7086 |
| වෙනත් කෘෂි බෝග | 2128 | 2120 |
| ධීවර | 3775 | 4212 |
| කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ මුළු ගණන | 70248 | 73428 |

*මූලාශ්‍රය: www.cbsl.gov.lk, 2014*

දෙවනුව, උතුරු මැද පළාතේ කර්මාන්ත අංශය ඩයි ක්ෂේත්‍රය සහ කුඩා ව්‍යාපාර මඟින් පාලනය කරනු ලබයි. මුළු උතුරු මැද පළාතේම ඇත්තේ මධ්‍යම ප්‍රමාණයේ සහ විශාල ප්‍රමාණයේ ව්‍යාපාර 45 ක ප්‍රමාණයක් පමණි. මෙය රටෙහි මුළු කර්මාන්ත ආයතන ප්‍රමාණයෙන් 1.7% ක් පමණි (4.4 වගුව). මෑත අතීතයේදී උතුරු මැද පළාතේ නිෂ්පාදන සහ ඉදිකිරීම් කර්මාන්තවල ස්ථාවර වර්ධනයක් පෙන්නුම්කර ඇත (4.5 වගුව). මෙම අංශයේ කුසලතා ශ්‍රමය අවශෝෂණය කරගැනීමට හැකිවන විභවයක් පවතී. උතුරු මැද පළාතේ ඉතා දුර්වල කර්මාන්ත ක්ෂේත්‍රයක් පැවතීමෙන් පෙන්නුම් කරනුයේ කුසලතා ශ්‍රමය අවශෝෂණය කරගැනීමේ හැකියාව ඉතා කුඩා බවයි. මෙය අළුත් රැකියා සඳහා විශේෂයෙන් පෙන්නුම් කරයි. එපමණක් නොව, ගෘහ කර්මාන්තය. විදුලි, ගෑස් සහ ජලය, ඉදිකිරීම් ප්‍රධාන අංශ වේ. ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ලැබූ පුහුණුලාභීන් ආකර්ශණය කරගැනීමේ විභවයක් පවතී. ගෘහකර්මාන්තය බොහෝදුරට අවිධිමත් ශ්‍රමයමත රඳාපවතී (4.6 වගුව). විදුලිබල, ගෑස් සහ ජලය සම්පත් රැකියා සඳහා ජාතික මට්ටමේ බඳවා ගැනීම් තිබෙන

අතර, එයින් පෙන්නුම් කරනුයේ බොහෝ පළාත් මට්ටමින් රැකියා නොමැති පුද්ගලයින් සඳහා මෙම ආයතනවල රැකියා ලබාගැනීම පිළිබඳව කිසිඳු වගකීමක් නොලැබෙන බවයි.

**වගුව 4.4: පළාත් අනුව කර්මාන්ත ආයතනවල ව්‍යාප්තිය (2012)**

| පළාත | මධ්‍යම සහ විශාල ආයතන සංඛ්‍යාව | මුළු ගණනින් ප්‍රතිශතය (%) |
|---|---|---|
| බස්නාහිර | 1405 | 54.2 |
| දකුණ | 304 | 11.7 |
| වයඹ | 269 | 10.4 |
| මධ්‍යම | 266 | 10.3 |
| සබරගමුව | 208 | 8.0 |
| නැගෙනහිර | 68 | 2.6 |
| උතුරු මැද | 45 | 1.7 |
| ඌව | 18 | 0.7 |
| උතුර | 11 | 0.4 |
| **මුළු එකතුව** | **2593** | **100** |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2013, වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය.*

**වගුව 4.5: උතුරු මැද පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි 2011-2012 වර්ෂතුල කර්මාන්ත අනුව පළාත් දළ දේශීය නිෂ්පාදිතය (රු. මිලියන වලින්)**

| උප ක්ෂේත්‍රය | 2011 | 2012 |
|---|---|---|
| කැනීම් සහ ගල් කොරි | 15074 | 9370 |
| නිෂ්පාදන | 32399 | 37841 |
| - සැකසුම් | 395 | 638 |
| - කර්මාන්ත ශාලාවල | 2581 | 3548 |
| - ගෘහ කර්මාන්ත | 6191 | 6655 |
| විදුලි, වායු සහ ජලය | 3754 | 6651 |
| ඉදිකිරීම් | 22786 | 34236 |
| **කර්මාන්ත අංශයේ මුළු එකතුව** | **74013** | **88058** |

*මූලාශ්‍රය: www.cbsl.gov.lk, 2014*

තෙවනුව, සේවා අංශය, ආගන්තුක සත්කාර සහ සංචාරක ක්ෂේත්‍රය, ප්‍රවාහන සහ සන්නිවේදන, බැංකු, රක්ෂණ සහ නිශ්චල දේපල ක්ෂේත්‍ර පිළිබඳ උතුරු මැද පළාතේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම්කර ඇත (4.6 වගුව). උතුරු මැද පළාතේ සේවා අංශය: වෙළෙඳ, ප්‍රවාහනයේ වාහන සේවා, සෞඛ්‍ය සේවා සහ පුද්ගලික සනීපාරක්ෂක සේවා, බැංකු, රක්ෂණ සහ නිශ්චල දේපල වැනි ක්ෂේත්‍රවල බොහෝ

ආයතනවලට ජාතික මට්ටමින් සේවකයින් බඳවා ගන්නා නිසා පළාත් මට්ටමින් සේවකයින් බඳවා ගැනීම අවශ්‍ය නොවේ. මේ නිසා පළාතේ ඇති මෙම ක්ෂේත්‍රවල ආයතන පළාතේ පුද්ගලයින් රැකියා සඳහා බඳවා ගන්නා බවට කිසිඳු වගකීමක් ලබා නොදෙයි.

**වගුව 4.6: උතුරු මැද පළාතේ සේවා අංශයෙහි 2011-212 වර්ෂතුල කර්මාන්ත අනුව පළාත් දේශීය නිෂ්පාදිතය**

| උප ක්ෂේත්‍රය | 2011 | 2012 |
|---|---|---|
| තොග සහ සිල්ලර වෙළෙඳාම | 53230 | 58638 |
| හෝටල් සහ නවාතැන් | 1618 | 2056 |
| ප්‍රවාහන සහ සන්නිවේදන | 46683 | 54945 |
| බැංක, රක්ෂණ සහ ඉඩකඩම් | 22510 | 32174 |
| වාසස්ථාන අයිතිය | 7774 | 8954 |
| රාජ්‍ය සේවා | 22469 | 27109 |
| පුද්ගලික සේවා | 7432 | 8832 |
| **ක්ෂේත්‍රයේ මුළු එකතුව** | **161,714** | **192,707** |

*මූලාශ්‍රය: www.cbsl.gov.lk, 2014*

උතුරු මැද පළාතේ ද නිරතුරුවම විදේශ රැකියා සඳහා පුද්ගලයින් ඉහළ සංඛ්‍යාවක් ඉන්නා බව පෙන්නුම් කරයි. උදාහරණයක් වශයෙන්, 2013 වර්ෂයේදී ලංකාවේ පුද්ගලයින් 293,105 ක් විදේශ රැකියා සඳහා පිටත්වගොස් ඇති අතර, එම වර්ෂයේදී උතුරු මැද පළාතින් විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් ඇති ප්‍රමාණය 14,262 ක් (4.7 වගුව). මෙම අගය ශ්‍රී ලංකාවේ විදේශ රැකියා සඳහා පිටත්වගොස් ඇති ප්‍රමාණයෙන් 4.9% කි. මෙම අගය එම වර්ෂයේ දී උතුරු මැද පළාතේ ශ්‍රම වෙළෙඳපොළට එකතු වූ ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් හරි අඩකට සමාන බවද සැලකිය යුතුය. විශාල පුද්ගලයින් සංඛ්‍යාවක් විදේශ රැකියා සඳහා පිටත්ව යාම මඟින් පෙන්නුම් කරනුයේ පළාතේ ඇති රැකියා අවස්ථා ඉතා අඩු බව සහ පවතින රැකියාවල කාර්යයසාධනය ඉතා අඩු බවයි. පවතින සහ වර්ධනය වන රැකියාවල පැහැදිලිව පෙන්නුම් කරන අවිධිමත්භාවය, අස්ථාවරත්වය සහ තාවකාලික ස්වභාවය බොහෝ රැකියා සොයන්නන් රටෙහි බස්නාහිර පළාතට හෝ වෙනත් රටකට සංක්‍රමණය වීමට බලෙන් හෝ යොමු කරවයි. මෙම දත්ත වලින් පෙන්නුම් කරනුයේ උතුරු මැද පළාතෙන් අළුතින් ශ්‍රම වෙළෙඳපොළට එකතුවන්නන් පමණක් නොව දැනට ශ්‍රම වෙළෙඳපොලෙහි සිටින සේවකයින්ද විදේශ රැකියා සඳහා පිටත්ව යන බවයි.

වගුව **4.7: 2013** වර්ෂයේදී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයින් සංඛ්‍යාව

| කාණ්ඩය | උතුරු මැද පළාත | ශ්‍රී ලංකාවේ මුළු ගණන |
|---|---|---|
| පිරිමි | 5,609 | 175,047 |
| ගැහැණු | 8,655 | 118,058 |
| මුළු එකතුව | **14,264** | **293,105** |

*මූලාශ්‍රය: www.cbsl.gov.lk, 2014*

ඉහත සාකච්ඡාව පදනම් කරගෙන, ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍ර ලෙස නිෂ්පාදන අංශය, ඉදිකිරීම් අංශය, ආගන්තුක සත්කාර, සංචාරක අංශය සහ අනෙකුත් සේවා අංශය (වෙළෙඳ, වාහන සේවා, ප්‍රවාහන සේවා, සෞඛ්‍ය සේවා, සහ පුද්ගලික සනීපාරක්ෂක සේවා) යන අංශ වලට දැනට සිටින ශ්‍රමබලකායට අමතරව කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතනවලට පුද්ගලයින් අන්තර්ග්‍රහණය කරගැනීමට විභවයක් පවතී. මෙහිදී ක්ෂේත්‍රවල පුරෝකථනයන්ට වඩා එක් එක් වෘත්තීන් සඳහා පුරෝකථනයන් සලකා බලන ලදි. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතනවලට තම පුහුණු වැඩසටහන් සැලසුම් කිරීමේ දී එක් එක් වෘත්තීන් සඳහා දැනට සිටින සහ අනාගත රැකියා අවස්ථා හඳුනාගැනීම අවශ්‍යවන බව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අවධාරණය කරන ලදී.

**මුළු ගහනය සහ නියැදිය**

උතුරු මැද පළාතේ සහ දිස්ත්‍රික්ක දෙකෙහි පුද්ගලික සහ අවිධිමත් අංශයේ මුළු ව්‍යාපාර ආයතන සංඛ්‍යාව මෙම අධ්‍යනයේ ඉලක්කගත ගහනය විය. උතුරු මැද පළාතේ මුළු ව්‍යාපාර ආයතනවල ගහනය ලෙස උතුරු මැද පළාතේ සේවක භාරකාර අරමුදල් මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයේ දත්ත ගබඩාව භාවිතා කරන ලදී. සේවකයින් බඳවා ගන්නා සියළුම ආයතන සේවකයින් සියළුදෙනාටම පාහේ සේවක භාරකාර අරමුදල් ගෙවීමට අවශ්‍ය වේ. පෞද්ගලික අංශයේ සියළුම සේවකයින්ට ද ගෙවිය යුතු වේ. පෞද්ගලික අංශයේ සියළුම ස්ථිර, තාවකාලික හෝ අනියම් පදනම මත බඳවා ගන්නා සියළුම සේවකයින්ට නීතිය අනුව සේවක භාරකාර අරමුදලේ ආයතනික කොටස ගෙවීම අන්වාර්යය වේ. එබැවින් සේවක භාරකාර මණ්ඩලය පෞද්ගලික අංශයේ සියළුම සේවකයින්ගේ තොරතුරු සතුවේ. ඕනෑම ආයතනයකට සේවක භාරකාර අරමුදල් නොගෙවා සේවකයින් බඳවාගෙන සිටීම නීතිවිරෝධී වේ. මේ නිසා, සේවක භාරකාර අරමුදල් කාර්යාලයෙන් ලබාගත් දත්ත ගබඩාවෙහි ඇතුලත් ආයතන ලැයිස්තුවෙහි සියළුම ආයතනවලට පාහේ බඳවාගත් සේවකයින් ඇතුලත් වේ. මෙම දත්ත ගබඩාවට ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව, ඒ වායේ පිහිටීම, ව්‍යාපාර/ක්‍රියාකාරකම්වල ස්වභාවය, සහ සේවක සංඛ්‍යාව ඇතුලත් වේ. පළාතේ හෝ දිස්ත්‍රික්කයක පවතින ව්‍යාපාර ආයතනවල මුළු ගහනය ලෙස යොදාගැනීමට මෙම දත්ත කට්ටලය ඉතා ප්‍රයෝජනවත් වේ. අපි මුළු ව්‍යාපාර පිළිබඳ තොරතුරු එක් එක් ආයතනවල සිටින සේවක සංඛ්‍යාව, එක් එක් ව්‍යාපාරික

ස්ථානයේ ව්‍යාපාර ලිපිනයන් සහ ව්‍යාපාර අළුත්කරවීම ලබාගෙන ඇත. මෙම තොරතුරු අප අධ්‍යයනයේ ගහනය ලෙස යොදාගන්නා ලදී. මෙම දත්ත කට්ටලය වැනි පුළුල් දත්තයන් ලබාදෙන වෙනත් ද්විතීයික මූලාශ්‍රයන් නොමැත. මෙම දත්ත කට්ටලය පදනම් කරගෙන එක් එක් වෘත්තීන්වල යෙදී සිටින පුද්ගලයින් සංඛ්‍යාව වර්ගීකරණය කිරීමට අපට හැකි විය.

උතුරු මැද පළාතේ සේවක අර්ථසාධක අරමුදල් මණ්ඩලයේ ප්‍රාදේශික කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව, පළාතේ ව්‍යාපාරික ආයතන 2,528 ක් තිබිණ. දිස්ත්‍රික්ක දෙකෙහි ව්‍යාපාරික ස්ථානවල අනාගත රැකියාගතවීම පුරෝකතනයන් සඳහා නියැදියකින් ප්‍රයෝජනවත් දත්ත රැස්කිරීමට වෙරදැරීමට අපගේ අවදානය යොමුවිය. එමනිසා, අර්ධ පුහුණු සහ පුහුණු ශ්‍රම සම්පත් භාවිතා කිරීමට අපේක්ෂා කරන පළාතේ සියළුම ව්‍යාපාරික ආයතන අපගේ අධ්‍යයනයට භාවිතා කරන ලදී. මුළු ව්‍යාපාරික ආයතන සංඛ්‍යාවෙන්, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතන මඟින් පුහුණුව ලැබූ අර්ධ පුහුණු සහ පුහුණු ශ්‍රමිකයින් රැකියාවේ නොයෙදෙන සිල්ලර සහ තොග සිල්ලර ව්‍යාපාරික ස්ථාන අපි බැහැර කරන ලදී. උතුරු මැද පළාතේ මුළු ව්‍යාපාර 2,369 ක් තිබුණි. මෙයින් සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරික ආයතන ආර්ථිකයෙන් විශාල කොටසක් නිර්මාණයකර ඇත. සියළුම ව්‍යාපාර වලින් 80% ක් (http://www.nhrep.gov.lk) තනි පුද්ගල හෝ සිල්ලර ව්‍යාපාරික ස්ථාන, සුළු සහ ඉතා කුඩා ප්‍රමාණයේ ව්‍යාපාරික ස්ථාන ලෙස ගණනය කර ඇත. මෙම ව්‍යාපාර සඳහා කාර්මික හා වෘත්තීය පුහුණු ආයතන මඟින් පුහුණුකල නිපුණ සේවකයින් සඳහා ඉල්ලුමක් නොපවතී. මෙම ව්‍යාපාරික ස්ථාන බොහෝමයක් වැඩියෙන් කැමැත්තක් දක්වන්නේ නුපුහුණු සහ දෛනික වැටුප් ලබන සේවකයින්ගෙන් සේවය ලබාගැනීමටයි. මෙම ආයතන නුපුහුණු ශ්‍රමිකයන්ගේ හෝ අවිධිමත් ලෙස පුහුණුව ලැබූ යන දෙපාර්ශවයේම සේවකයින් යොදාගනී. මේ නිසා, ව්‍යාපාර 2,369 න් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 1,896 ක් පුහුණු ශ්‍රමිකයන් බඳවා නොගන්නා ලෙස සලකමින් අධ්‍යනයෙන් ඉවත් කරන ලදී. නිශ්පාදන ක්ෂේත්‍රය, හෝටල් සහ සේවා යන ක්ෂේත්‍රවල ව්‍යාපාරික ආයතන 473 ක් මෙම අධ්‍යයනයේ මුළු ව්‍යාපාර ගහනය ලෙස සලකන ලදී. ව්‍යාපාරික ආයතන 400 ක් උතුරු මැද පළාතේ මෙම අධ්‍යයනයට ඇතුලත් විය. ව්‍යාපාරික ආයතන 73 ක් ව්‍යාපාරික ලිපිනයන් නොතිබීම නිසා සමීක්ෂණය නොකරන ලදී. මීට අමතරව මෙම සමීක්ෂණයේදී උතුරු මැද පළාතේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සහ ඉදිකිරීම් සංගමය වැනි කර්මාන්ත සංගම් වලින් ශ්‍රම ඉල්ලුම පිළිබඳ තොරතුරු ලබාගන්නා ලදී.

වගුව **4.8:** නියැදියේ විස්තර

| | **කාණ්ඩය** | **සමීක්ෂණය කරනලද ආයතන සංඛ්‍යාව** | **පළාතේ ඇති මුළු ආයතන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|
| 1 | නිෂ්පාද අංශය | 74 | 10% |
| 2 | සංකාරක සහ ආගන්තුක සේවා | 40 | 19% |
| 3 | වෙනත් සේවා අංශය | 287 | 71% |
| 4 | සමීක්ෂණය කරන ලද මුළු ආයතන | 400 | 100% |

*මූලාශ්‍රය: සේවක භාරකාර අරමුදල් ප්‍රාදේශීය කාර්යාල මඟින් ලබාදුන් දත්ත, 2013*

මෙම නියැදිය ඕනෑම සංඛ්‍යාන සම්මතයක විශාල ප්‍රමාණයේ නියැදියක් යන කාණ්ඩයට අයත් වේ. නියැදියක ප්‍රමාණවත් විශාල බවෙහි ප්‍රතිඵලයක් ලෙස විශ්ලේෂණය, නිගමනයන් සහ නිර්දේශ ඉහළ වලංගුතාවයක් සහ විශ්වාසනීයත්වයක් ඇති බව සහතික කල හැකිය. නිශ්පාදන, ආගන්තුක සත්කාර සහ සංචාරක, සහ සේවා කාණ්ඩවලට ඇතුලත්කල හැකි සියළුම ව්‍යාපාරික ආයතන අපි නියැදියට ඇතුලත්කර ඇත. මේ නිසා, ඉහත ඕනෑම උප ක්ෂේත්‍රයකට අයත් ව්‍යාපාරික ආයතනවල මුළු ගහනය ±10% ක් වැරදීම් හෝ මගහැරීම්වලට යටත්ව අප විසින් සමීක්ෂණය කරන ලදී.

**සමීක්ෂණ ක්‍රමය**

කර්මාන්ත ක්ෂේත්‍රවල වත්මන් ශ්‍රම ඉල්ලුම ලබාගැනීම සඳහා ව්‍යුහාත්මක ප්‍රශ්නාවලී සමීක්ෂණයක් පවත්වන ලදී. පළාතේ සේවායෝජකයන්ගෙන් අංශ ගණනාවක් යටතේ දත්ත එක්රැස් කිරීම සඳහා විස්තරාත්මක ප්‍රශ්නාවලියක් භාවිතා කරන ලදී. දත්ත රැස්කිරීමට ගණන්ගන්නා නිළධාරීන් යොදාගන්නා ලදී. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් තෝරාගත් සංඛ්‍යාවක් භාවිතයෙන් ප්‍රශ්ණාවලිය පෙර පරීක්ෂාවක් කරන ලදී. සමීක්ෂණයකිරීම සඳහා ප්‍රශ්නාවලිය භාවිතා කරමින් සමීක්ෂණ නිළධාරීන් පුහුණු කරනලදී. ප්‍රශ්ණාවලියේ පහත සඳහන් සංරචක අඩංගු වේ.

a. පුහුණු ආයතන පිළිබඳව සේවායෝජකයාගේ හැඟීම
b. පාඨමාලා සහ පුහුණුවන්නන් පිළිබඳව සේවායෝජකයින්ගේ හැඟීම
c. කර්මාන්ත ක්ෂේත්‍රවල වත්මන් රැකියා පැතිකඩ
d. ඉදිරි වර්ෂ පහ තුල කර්මාන්ත ක්ෂේත්‍රවල අපේක්ෂිත රැකියාගත වීම

දත්ත සකස්කිරීම සහ විශ්ලේෂණයකිරීම සඳහා පහසුවෙන් භාවිතාකිරීමට ක්ෂේත්‍ර යෙදූ ප්‍රශ්නාවලිය භාවිතා කරන ලදී.

## 4.2 ආයතනවල වත්මන් පුහුණු සැපයුම පිළිබඳව සේවායෝජකයාගේ හැඟීම

පුහුණු ආයතන සහ ඒවායේ පාඨමාලා පිළිබඳව සේවායෝජකයින්ගේ හැඟීම් ලබා ගැනීමට ලිකර්ට් ශ්‍රේණිගත පරිමාණයක් භාවිතයෙන් දත්ත ලබාගන්නා ලදී. මෙම ශ්‍රේණිගත කිරීමේ පරිමාණය 1 සිට 5 දක්වා පරාසයක පවතී. මෙහි 1න් ආයතන සහ ඒවායේ පුහුණු පාඨමාලා පිළිබඳව වැඩිම අපෘත්තිමත් බව පෙන්නුම් කරන අතර 5 න් ආයතන සහ ඒවායේ පුහුණු පාඨමාලා පිළිබඳව වැඩිම තෘප්තිමත් බව පෙන්නුම් කරයි. සමීක්ෂණය සඳහා මෙම ප්‍රශ්ණය ඇතුලත් කිරීමේ අරමුණ වන්නේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතන මඟින් පවත්වනු ලබන පාඨමාලාවල ගුණාත්මකභාවය සහ එම පාඨමාලාවල අදාලත්වය පිළිබඳ දත්ත රැස්කිරීමයි.

a. සමීක්ෂණයකල පුහුණු ආයතන අතරින් VTA, NAITA, NYSC සහ DTET යන ආයතන ඉහළම පරිමාණයක් පෙන්නුම් කරයි. මෙයින් පෙනී යන්නේ සේවායෝජකයින් මෙම ආයතන පිළිබඳව වැඩි තෘප්තිමත්භාවයක් ඇති බවයි. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට සම්බන්ධ රජයේ පුහුණු ආයතන සේවයෝජකයින්ගේ අපේක්ෂාවන් ඉටු වන ආකාරයට ගුණාත්මකභාවයෙන් වැඩි සහ අදාල පුහුණු වැඩසටහන් ලබාදෙන බවට පැහැදිලි දර්ශකයකි (4.9 වගුව).

b. කෙසේ වෙතත් සේවා යෝජකයින් පෞද්ගලික සහ රාජ්‍ය නොවන පුහුණු ආයතන සහ ඒවායේ සේවා පිළිබඳව අඩු තෘප්තිමත්භාවයක් දක්වයි (4.9 වගුව). අනෙකුත් රාජ්‍ය පුහුණු ආයතන ලබාගෙන ඇති දර්ශකය 5 න් 2.3 ක් වන අතර රාජ්‍ය නොවන ආයතන මඟින් ලබාගෙන ඇති දර්ශකය 3 ක් වේ. සීමාවක් නොමැති පෞද්ගලික උපකාරක පන්ති විවිධ පුහුණු පාඨමාලා සපයන ආයතන සේවායෝජකයින් විසින් හොඳ ආයතන ලෙස හඳුනාගෙන නොමැත.

c. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට සම්බන්ධ පුහුණු ආයතන ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රමාණය කිරීම සඳහා නිර්මාණ කල පාඨමාලා ලබාදෙන බැවින් සේවා යෝජකයින් විසින් ඉහළ ලෙස පිළිගන්නා බව මෙම දත්ත අනුව මනාව පැහැදිලි වේ. මෙයිනුත් ඉතා පැහැදිලි ලෙස පෙන්නුම් කරනුයේ වෙනත් රාජ්‍ය පුහුණු ආයතන මෙන්ම රාජ්‍ය නොවන පුහුණු ආයතන පාඨමාලාවල ගුණාත්මකභාවය පවත්වා ගැනීමට ජාතික වෘත්තීය සුදුසකම් රාමුව වෙතට ගෙන ආ යුතු බවයි.

වගුව 4.9: අධ්‍යාපනය සහ පුහුණුව සපයන ආයතන පිළිබඳව සේවා යෝජකයන්ගේ දැක්ම

| | ආයතනය | සාමාන්‍ය අනුස්ථානය |
|---|---|---|
| 1 | වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) | 4.1 |
| 2 | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) | 4.2 |
| 3 | ජාතික තරුණ සේවා සභාව (NYSC) | 4.1 |
| 4 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ අධිකාරිය (DTET) | 4.1 |
| 5 | අනෙක් රජයේ ආයතන | 2.3 |
| 6 | රාජ්‍ය නොවන ආයතන | 3 |

සටහන: 1 සිට 5 දක්වා පෙළ ගැස්සවීමේ පරිමාණය පදනම් කරගෙන 1 න්, වැඩියෙන් අතෘප්තිමත් බව පෙන්වන අතර 5 න්, වැඩියෙන්ම තෘප්තිමත් බව පෙන්වයි.

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත

එලෙසම සේවායෝජකයින්ගේ හැඟීම් පිළිබඳ ප්‍රතිචාර අනුව විවිධ ආයතන මඟින් පවත්වන පාඨමාලාවල ගුණාත්මකභාවය සහ අදාලත්වය පිළිබඳ දත්ත ද ලබාගෙන ඇත. වගුව 4.10 මඟින් මෙයට සම්බන්ධ සාරාංශ සංඛ්‍යාලේඛන ලබාදෙයි.

a. සේවායෝජකයින් විසින් VTA, NAITA, NYSC සහ DTET පාඨමාලා සාපේක්ෂ ලෙස ඉහළ ශ්‍රේණිගතකර ඇති අතර, තවමත් ඔවුන්ගේ පාඨමාලා ඉහළම මට්ටමකට ලඟා වීමට වැඩි දියුණු කිරීමේ හැකියාවක් පවතී.

b. පුහුණුවන්නන් පිළිබඳව සේවායෝජකයින් මතුකරන ප්‍රධාන ගැටළු වලින් එකක් වන්නේ රැකියාවට සම්බන්ධ වන මූලික සාක්ච්ඡාවලදී සහ වැඩකරන කාලය තුල පුහුණුවන්නන් ඉතා ඉහළ වැටුප් සහ බරපතල නොවන වැඩ බලාපොරොත්තු වීමයි.

c. සේවායෝජකයින්ට අනුව බොහෝමයක් පුහුණුවන්නන් 'සුදු කරපටි' (white collar) රැකියා බලාපොරොත්තුවන අතර එවැනි රැකියා කර්මාන්ත ක්ෂේත්‍රවල විශාල වශයෙන් අඩංගු නොවේ. සේවායෝජකයින් යෝජනා කරන්නේ කර්මාන්ත ක්ෂේත්‍රයේ ඕනෑම වැඩ පරීක්ෂණයකට ගැලපෙන ලෙස වැඩකල හැකි පරිදි පුහුණු ආයතන විසින් පුහුණුවන්නන්ගේ ආකල්ප වෙනස් කිරීමට සම්බන්ධ පාඨමාලා පවත්වන ලෙසයි.

d. අනෙක් අතට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතට අයත් නොවන විවිධ ආයතන මෙන්ම වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු පාඨමාලා පවත්වාගෙන යනු ලබන ආයතන රාජ්‍ය නොවන ආයතන මඟින් ඉදිරිපත් කරන පාඨමාලා පිළිබඳව සේවායෝජකයින් සෑහීමකට පත්නොවේ.

e. වෙනත් රාජ්‍ය පුහුණු ආයතන සහ රාජ්‍ය නොවන පුහුණු ආයතනවල බොහෝ පුහුණුවන්නන් න්‍යායික පුහුණුවට නැඹුරුතාවක් දක්වන නමුත් නියම වැඩබිමෙහි සහ යෙදවුම් වලදී වැඩි පළපුරුද්දක් නැති බව සේවායෝජකයින්ගේ හැඟීමයි.

f. ප්‍රායෝගික පුහුණුවේ මදිකම නිසා පුහුණුවන්නන් සේවායෝජකයින්ගේ යන්ත්‍ර සූත්‍රවලට හානි කිරීම/ කැඩීම සිදුවන බවට සේවායෝජකයින් පැමිණිලි කරයි.

**වගුව 4.10: අධ්‍යාපන සහ පුහුණුව සපයන ආයතන පිළිබඳව සේවා යෝජකයන්ගේ දැක්ම**

| | ආයතනය | සාමාන්‍ය අගය |
|---|---|---|
| 1 | වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) | 4.0 |
| 2 | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) | 3.9 |
| 3 | ජාතික තරුණ සේවා සභාව (NYSC) | 3.8 |
| 4 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ අධිකාරිය (DTET) | 3.9 |
| 5 | අනෙක් රජයේ ආයතන | 3.0 |
| 6 | රාජ්‍ය නොවන ආයතන | 3.0 |

*මූලාශ්‍රය: පළාත් සාමාන්‍ය සමීක්ෂණය*

## 4.3 කර්මාන්ත ක්ෂේත්‍රවල රැකියා පැතිකඩ

එහි පළමු පියවර වශයෙන් ඉදිරි පස් වසර තුල දිස්ත්‍රික්ක දෙකෙහි පළාතෙහි එක් එක් වෘත්තිය සඳහා අනාගත ඉල්ලුම වශයෙන් සේවායෝජකයින් සපයන ලද දත්ත අපි භාවිතා කලෙමු. මෙම උප පරිච්ඡේදයෙන් දිස්ත්‍රික්ක දෙකෙහි හා පළාතෙහි රැකියා පැතිකඩ අපි සාකච්ඡා කරන්නෙමු. උතුරු මැද පළාතේ විවිධ නිපුණ සේවක කාණ්ඩ සඳහා වත්මන් සහ අනාගත ඉල්ලුම හඳුනාගැනීමට අපි ප්‍රවේශයන් දෙකක් භාවිතා කළෙමු. එක් ප්‍රවේශයක් වූයේ සේවායෝජකයන්ගේ ප්‍රතිචාර පදනම් කරගෙන අනාගතයේදි එක් එක් ව්‍යාපාර ස්ථාන මඟින් බඳවා ගැනීමට යන නව සේවක සංඛ්‍යාව වාර්ථා කිරීමයි. අනෙක් ප්‍රවේශය වූයේ පළාතේ විවිධ වෘත්තීන් සඳහා පස් අවුරුදු ඉල්ලුම පුරෝකථනය කිරීමයි. 4.11, 4.12 සහ 4.13 වගු මඟින් උතුරු මැද පළාතේ සහ දිස්ත්‍රික්ක දෙකෙහි (අනුරාධපුර සහ පොළොන්නරුව) වත්මන් සහ අනාගත රැකියා පැතිකඩ පිළිබඳ දත්ත සපයයි.

වගුව **4.11:** අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිෂ්පාදන අංශය තුල වත්මන් සහ අපේක්ෂිත රැකියා පැතිකඩ

| වෘත්තිය | දැනට සිටින මුළු සේවක සංඛ්‍යාව | පුරෝකථනය කරනලද සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** |
| මෝටර් කාර්මික ශිල්පී | 71 | 14 | 10 | - | - | 09 |
| කුෂන් වැඩකරු | 21 | 19 | 12 | 6 | 9 | - |
| වාහන දුනු නිශ්පාදකයින් | 12 | 6 | 4 | - | - | 7 |
| කොන්ක්‍රීට් වැඩකරු | 53 | 11 | 9 | - | 3 | 1 |
| ලියවන පට්ටල් වැඩකරු | 13 | - | 10 | 5 | - | 3 |
| හිස්වැසුම් නිෂ්පාදක | 6 | - | - | - | - | - |
| අත්යන්ත්‍ර | 8 | 2 | 2 | 5 | 1 | - |
| වේවැල් නිශ්පාදනය | 30 | 3 | 1 | 3 | 6 | 7 |
| පැස්සුම් ශිල්පී | 97 | 8 | 4 | 12 | 9 | 19 |
| බේකරි සේවක | *51* | *10* | *14* | *12* | *20* | *13* |
| පේස්ට්‍රි සාදන්නා | 18 | 23 | 15 | 13 | 8 | 7 |
| රන්කරු | 27 | 3 | 2 | 5 | 1 | - |
| රන් ආභරණ නිර්මාණ නිර්මාණකරු | 11 | - | - | - | - | - |
| යකඩ වැඩ | 19 | 7 | 12 | - | - | 10 |
| ඇලුමිනියම් සේවක | 12 | 10 | 13 | 7 | 9 | 2 |
| ෆයිබර්ග්ලාස් සේවක | 3 | - | - | - | - | - |
| ඉන්ජෙක්ටර් පොම්ප යාන්ත්‍රිකශිල්පී | 5 | - | - | - | - | - |
| විදුලි කාර්මික | 51 | 10 | 2 | 1 | - | 7 |
| පරිගණක අළුත්වැඩියාව | 12 | 5 | 3 | 10 | 6 | - |
| දැව ශිල්පීය නිර්මාණකරුවන් | 8 | - | - | - | - | - |
| පැල තවාන් | 5 | - | - | - | - | - |
| ඡායාරූප නිර්මාණකරුවන් | 7 | - | - | - | - | - |
| බයිට් නිෂ්පාදකයන් | 18 | - | - | - | - | - |
| සහල් මෝල් සේවකයින් | 180 | - | - | - | - | - |
| ගණකාධිකාරී / ගණකාධිකාරී සහායකයන් | 24 | - | - | 8 | 11 | 10 |

| වෘත්තිය | දැනට සිටින මුළු සේවක සංඛ්‍යාව | පුරෝකථනය කරනලද සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| පින්තූර රාමුකිරීම | 8 | - | - | - | - | - |
| වීදුරු කපන්නන් | 9 | - | - | - | - | - |
| පරිගණක ක්‍රියාකරුවන් | 113 | - | 11 | 9 | 14 | 20 |

*සටහන: පුරෝකථනය කරන ලද අතිරේක ඉල්ලු මඟින් නව ඉල්ලුම පෙන්නුම් කරන අතර දී ඇති වර්ෂ තුල දැනට සිටින සේවකයින් ගණනට අමතරව නව ඉල්ලුමක් උපදවනු ඇත.*

*මූලාශ්‍රය: කර්මාන්ත ක්ෂේත්‍ර සමීක්ෂණය*

**වගුව 4.12: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නිෂ්පාදන අංශය තුල වත්මන් සහ අපේක්ෂිත රැකියා පැතිකඩ**

| වෘත්තිය | දැනට සිටින මුළු සේවක සංඛ්‍යාව | පුරෝකථනය කරන ලද සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** |
| මෝටර් කාර්මික ශිල්පී | 12 | 5 | 11 | - | 12 | - |
| කුෂන් වැඩකරු | 8 | - | - | 3 | 8 | 7 |
| වාහන දුනු නිශ්පාදකයින් | 2 | - | - | - | - | - |
| කොන්ක්‍රිට් වැඩකරු | 11 | 12 | - | 8 | 11 | 14 |
| ලියවන පට්ටල් වැඩකරු | 2 | - | - | - | 11 | 9 |
| හිස්වැසුම් නිෂ්පාදක | - | - | - | - | - | - |
| අත්යන්ත්‍ර | 3 | - | - | - | - | - |
| වේවැල් නිශ්පාදනය | 11 | - | - | - | - | - |
| පැස්සුම් ශිල්පී | 21 | 9 | 6 | 4 | 10 | 2 |
| බේකරි සේවක | *7* | *20* | *14* | - | *2* | *8* |
| පේස්ට්‍රි සාදන්නා | 8 | 20 | 13 | 12 | - | - |
| රන්කරු | 9 | - | - | - | - | - |
| රන් ආභරණ නිර්මාණ නිර්මාණකරු | 4 | - | - | - | - | - |
| යකඩ වැඩ | 12 | 11 | 3 | 6 | 2 | - |

| වෘත්තිය | දැනට සිටින මුළු සේවක සංඛ්‍යාව | පුරෝකථනය කරන ලද සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| ඇලුමිනියම් සේවක | 9 | 4 | - | 5 | 9 | 12 |
| ෆයිබර්ග්ලාස් සේවක | - | - | - | - | - | - |
| ඉන්ජෙක්ටර් පොම්ප යාන්ත්‍රිකශිල්පී | 2 | - | 4 | - | 1 | - |
| විදුලි කාර්මික | 21 | 4 | 10 | 8 | - | 12 |
| පරිගණක අළුත්වැඩියාව | 8 | 2 | 1 | 1 | 9 | - |
| දැව ශිල්පීය නිර්මාණකරුවන් | 6 | - | - | - | - | - |
| පැල තවාන් | 10 | - | - | - | - | - |
| ඡායාරූප නිර්මාණකරුවන් | 4 | - | - | - | - | - |
| බයිට් නිෂ්පාදකයන් | 7 | - | - | - | - | - |
| සහල් මෝල් සේවකයින් | 180 | 10 | 7 | 13 | - | 11 |
| ගණකාධිකාරි / ගණකාධිකාරි සහායකයන් | 10 | 9 | 3 | 6 | 2 | 1 |
| පින්තූර රාමුකිරීම | 3 | - | - | - | - | - |
| වීදුරු කපන්නන් | 2 | - | - | - | - | - |
| පරිගණක ක්‍රියාකරුවන් | 23 | 6 | 4 | 9 | 11 | - |

*මූලාශ්‍රය: කර්මාන්ත ක්ෂේත්‍ර සමීක්ෂණය*

වගුව **4.13:** අනුරාධපුර දිස්ත්‍රික්යේ සංචාරක හා ආගන්තුක සත්කාර අංශයේ වත්මන් සහ අපේක්ෂිත රැකියා පැතිකඩ

| වෘත්තිය | දැනට සිටින මුළු සේවක සංඛ්‍යාව | නව සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** |
| අයිතිකරු | 18 | 2 | 1 | 4 | 5 | - |
| හෝටල් කළමනාකරු | 18 | 3 | 1 | 1 | 4 | 4 |

| වෘත්තිය | දැනට සිටින මුළු සේවක සංඛ්‍යාව | නව සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| ආහාර හා පාන වර්ග කළමනාකරු | 14 | 6 | 2 | 1 | 3 | 5 |
| ආපන ශාලා සුපරීක්ෂක | 21 | 6 | 8 | 3 | 1 | 8 |
| වේටර්වරුන් | 80 | - | - | 3 | 1 | 7 |
| ආපන ශාලා සේවක | 8 | - | - | 3 | 2 | 4 |
| කායීල සුපරීක්ෂක | 18 | 3 | 1 | 2 | - | 6 |
| පිළිගැනීමේ නිළධාරී | 18 | 5 | 6 | 4 | 2 | 1 |
| බෙල්බෝයි | 9 | 4 | 6 | 3 | 1 | 1 |
| සූපවේදී | 26 | 6 | 5 | 2 | 4 | 7 |
| අරක්කැමියා | 41 | 7 | 6 | 4 | 11 | 10 |
| බේකරිකරු | 29 | 12 | - | 6 | 2 | 5 |
| පේස්ට්‍රි සාදන්නා | 10 | 20 | 12 | 10 | - | 2 |
| ගෘහ පාලක | 26 | 4 | 5 | 9 | 2 | 1 |
| ගෘහ පාලන සුපරීක්ෂක | 4 | 5 | 8 | 3 | 3 | 1 |
| ලොන්ඩරි සුපරීක්ෂක | 18 | 6 | 4 | 8 | - | - |
| රූම් බෝයි | 56 | - | - | 4 | 8 | 2 |
| ලොන්ඩරිකරු | 15 | - | - | - | - | - |
| ගණකාධිකාරී | 18 | 2 | 1 | 5 | 4 | 1 |
| රාත්‍රී විගණක | 18 | 3 | 7 | 2 | 1 | 8 |
| මුදල් අයකැමි | 18 | 2 | 8 | 2 | 2 | 2 |
| ගිණුම් සහකාර | 15 | 3 | 5 | 9 | 1 | 4 |
| ගබඩා භාරකරු | 15 | 3 | 5 | 1 | 1 | 9 |
| පරිගණක යෙදවුම් සහායක | 34 | 4 | 8 | 7 | 3 | 9 |
| Mechanic | 7 | 2 | 3 | 2 | 4 | 1 |
| විදුලි කාර්මික | 10 | 6 | 5 | 7 | 8 | 2 |
| නාන තටාක උපස්ථායක | 3 | 4 | 3 | 4 | 1 | 1 |
| උයන්පල්ලා | 28 | 4 | 3 | 2 | 1 | 8 |

*සටහන: පුරෝකථනය කරන ලද අතිරේක ඉල්ලුම මඟින් නව ඉල්ලුම පෙන්නුම් කරන අතර දී ඇති වර්ෂය තුල දැනට සිටින සේවකයින් ගණනට අමතරව නව ඉල්ලුමක් උපදවනු ඇත.*

*මූලාශ්‍රය: පළාත් කර්මාන්ත ක්ෂේත්‍ර සමීක්ෂණය*

වගුව **4.14: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සංචාරක හා ආගන්තුක සත්කාර අංශයේ වත්මන් සහ අපේක්ෂිත රැකියා පැතිකඩ**

| වෘත්තිය | දැනට සිටින මුළු සේවක සංඛ්‍යාව | නව සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** |
| අයිතිකරු | 06 | 4 | 3 | 5 | 2 | 1 |
| හෝටල් කළමනාකරු | 06 | 6 | 4 | 3 | 4 | 5 |
| ආහාර හා පාන වර්ග කළමනාකරු | 06 | 4 | 5 | 4 | 6 | 8 |
| ආපන ශාලා සුපරීක්ෂක | 12 | 4 | 2 | 1 | 2 | 1 |
| වේටර්වරුන් | 21 | 1 | - | - | 3 | 4 |
| ආපන ශාලා සේවක | 6 | - | - | 2 | 1 | 1 |
| කායීල සුපරීක්ෂක | 10 | 4 | 7 | 2 | - | - |
| පිළිගැනීමේ නිළධාරී | 8 | 2 | 4 | 1 | - | - |
| බෙල්බෝයි | 9 | 4 | 2 | 1 | 5 | 3 |
| සූපවේදී | 14 | 3 | 2 | 4 | - | 1 |
| අරක්කැමියා | 31 | 8 | 4 | 6 | 1 | 2 |
| බේකරිකරු | 16 | 3 | 2 | 7 | 1 | 9 |
| පේස්ට්‍රිඅරක්කැමියා | 20 | 7 | 3 | 1 | 3 | 9 |
| ගෘහ පාලක | 10 | - | - | - | - | - |
| ගෘහ පාලන සුපරීක්ෂක | 8 | - | - | - | - | - |
| ලොන්ඩරි සුපරීක්ෂක | 14 | - | - | - | - | - |
| රූම් බෝයි | 13 | 2 | - | 1 | 5 | - |
| ලොන්ඩරිකරු | 06 | 4 | 1 | 7 | - | 2 |
| ගණකාධිකාරී | 16 | 6 | - | 4 | 1 | 6 |
| රාත්‍රී විගණක | 8 | 5 | 1 | - | - | - |
| මුදල් අයකැමි | 10 | 4 | 8 | 3 | 1 | 9 |
| ගිණුම් සහකාර | 8 | 3 | 6 | 4 | 9 | 1 |
| ගබඩා භාරකරු | 4 | 2 | 1 | 3 | - | 1 |
| පරිගණක යෙදවුම් සහායක | 13 | 8 | 2 | 1 | 2 | - |
| කාර්මික | 5 | 4 | 2 | 1 | 6 | - |
| විදුලි කාර්මික | 7 | 3 | 1 | 7 | - | 2 |
| නාන තටාක උපස්ථායක | 3 | 2 | 3 | 1 | 6 | 3 |
| උයන්පල්ලා | 3 | 5 | 2 | 7 | 1 | 8 |

*සටහන: පුරෝකථනය කරන ලද අතිරේක ඉල්ලුම මඟින් නව ඉල්ලුම පෙන්නුම් කරන අතර දී ඇති වර්ෂය තුල දැනට සිටින සේවකයින් ගණනට අමතරව නව ඉල්ලුමක් උපදවනු ඇත.*

*මූලාශ්‍රය: පළාත් කර්මාන්ත ක්ෂේත්‍ර සමීක්ෂණය*

වගුව **4.15:** අනුරාධපුර දිස්ත්‍රික්කයේ සේවා අංශයේ වත්මන් සහ අපේක්ෂිත රැකියා පැතිකඩ

| වෘත්තිය | දැනට සිටින මුළු සේවක සංඛ්‍යාව | නව සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** |
| රූපලාවන්‍ය ශිල්පී | 40 | 4 | 7 | 2 | - | 8 |
| කරණවෑමියා | 27 | 10 | 8 | 4 | 1 | - |
| ඡායාරූප ශිල්පී | 21 | 4 | 2 | 7 | 1 | 3 |
| සැලසුම්කරු | 02 | 1 | - | - | - | - |
| ඖෂධවේදී | 21 | 2 | - | - | 4 | 1 |
| දෘෂ්ටි විශේෂඥයා | 4 | 5 | 6 | 7 | - | 5 |
| මෝටර් කාර්මික ශිල්පී | 10 | 6 | 7 | - | - | 3 |
| වාහන පින්තාරු ශිල්පී | 14 | 4 | 2 | 2 | 1 | 1 |
| දැන්වීම්කරු | 10 | 5 | 1 | 3 | 9 | 1 |
| වාහන සේවා කාර්මික | 27 | 1 | 4 | 2 | 7 | 1 |
| ඩිජිටල් මුද්‍රක සහ ස්ටිකර් | 14 | 5 | 2 | - | - | 3 |
| ඇඳුම් මසන්නා | 51 | 12 | 11 | 5 | 7 | 6 |
| පරිගණක අළුත්වැඩියාව | 17 | 13 | 11 | 9 | 1 | 9 |
| රන්කරු | 8 | 2 | 4 | 3 | 1 | 8 |
| ඩිජිටල් මුද්‍රක | 14 | 2 | 1 | 4 | 5 | 9 |
| රසායනාගාර නිලධාරී | 04 | 1 | 1 | 1 | - | - |
| වඩු කාර්මික | 127 | 12 | 13 | 8 | 14 | 12 |
| පෙදරේරු කාර්මික | 140 | 12 | 3 | 13 | - | 4 |
| ව්‍යාපෘති සිවිල් ඉංජිනේරු | - | - | - | - | - | - |
| ගබඩා භාරකරු | 10 | 3 | 4 | 1 | 8 | 2 |
| විදුලි කාර්මික | 16 | 10 | 5 | 1 | 8 | - |
| මිනින්දෝරු | 9 | 12 | 10 | 3 | 9 | 1 |
| ප්‍රමාණාත්මක මිනින්දෝරු | 11 | 8 | 4 | 6 | 11 | - |
| ව්‍යාපෘති සුපරීක්ෂක | 7 | 12 | 9 | 7 | 12 | 14 |
| පෑස්සුම් ශිල්පී | 16 | 10 | 13 | 12 | 6 | 9 |
| ඇලුමිනියම් නිර්මාණ ශිල්පී | 20 | 2 | 3 | 1 | 5 | 6 |
| ඖෂධවේදී | 28 | 12 | 3 | 1 | 7 | 2 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 18 | 7 | 1 | 4 | 7 | - |
| ආරක්ෂක නිලධාරී | 11 | 5 | 1 | 8 | 3 | 8 |
| මූල්‍ය සහකාර | 9 | 11 | 4 | 6 | 3 | 1 |
| මුදල් අයකැමි | 10 | 12 | 3 | 8 | 6 | 4 |

| වෘත්තිය | දැනට සිටින මුළු සේවක සංඛ්‍යාව | නව සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| සෞඛ්‍ය සේවා සහකාර | 11 | - | - | - | - | - |
| සෞඛ්‍ය සේවා හෙදි | 12 | - | - | - | - | - |
| සෞඛ්‍ය සේවා ප්‍රධාන හෙදි | 06 | - | - | - | - | - |

*සටහන: පුරෝකථනය කරන ලද අතිරේක ඉල්ලුම මඟින් නව ඉල්ලුම පෙන්නුම් කරන අතර දී ඇති වර්ෂය තුල දැනට සිටින සේවකයින් ගණනට අමතරව නව ඉල්ලුමක් උපදවනු ඇත.*

*මූලාශ්‍රය: පළාත් කර්මාන්ත ක්ෂේත්‍ර සමීක්ෂණය*

වගුව **4.16:** **පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සේවා අංශයේ වත්මන් සහ අපේක්ෂිත රැකියා පැතිකඩ**

| වෘත්තිය | දැනට සිටින මුළු සේවක සංඛ්‍යාව | නව සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| රූපලාවන්‍ය ශිල්පී | 38 | 10 | 7 | 8 | 11 | 3 |
| කරණවෑමියා | 27 | 12 | 10 | 3 | 7 | 1 |
| ඡායාරූප ශිල්පී | 19 | 10 | 11 | 18 | 12 | 7 |
| සැලසුම්කරු | 6 | 2 | 1 | - | - | - |
| ඖෂධවේදී | 8 | 2 | 1 | - | - | 2 |
| දෘෂ්ටි විශේෂඥයා | 7 | - | 1 | 5 | 2 | - |
| මෝටර් කාර්මික ශිල්පී | 7 | 2 | - | 4 | 8 | 1 |
| වාහන පින්තාරු ශිල්පී | 11 | 5 | 4 | - | 6 | 1 |
| දැන්වීම්කරු | 8 | 8 | 4 | 1 | 3 | 9 |
| වාහන සේවා කාර්මික | 21 | 13 | 11 | - | 5 | 9 |
| ඩිජිටල් මුද්‍රක සහ ස්ටිකර් | 18 | 1 | 6 | 5 | 9 | 1 |
| ඇඳුම් මසන්නා | 51 | 12 | 9 | 3 | 1 | 5 |
| පරිගණක අළුත්වැඩියාව | 10 | 2 | 1 | 1 | 2 | 1 |
| රන්කරු | 7 | 4 | 2 | 1 | - | 2 |
| ඩිජිටල් මුද්‍රක | 8 | 1 | - | 2 | - | - |
| රසායනාගාර නිලධාරී | 4 | 3 | 1 | - | - | - |
| වඩු කාර්මික | 132 | 15 | 20 | 13 | 11 | 26 |
| පෙදරේරු කාර්මික | 149 | 18 | 12 | 21 | 32 | 10 |
| ව්‍යාපෘති සිවිල් ඉංජිනේරු | - | - | - | - | - | - |

| වෘත්තිය | දැනට සිටින මුළු සේවක සංඛ්‍යාව | නව සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| ගබඩා භාරකරු | 14 | - | - | - | - | - |
| විදුලි කාර්මික | 16 | 12 | - | - | - | 3 |
| මිනින්දෝරු | 9 | 1 | - | - | - | 4 |
| ප්‍රමාණාත්මක මිනින්දෝරු | 4 | 1 | - | - | - | - |
| ව්‍යාපෘති සුපරීක්ෂක | 5 | 2 | 9 | 1 | 4 | 1 |
| පැස්සුම් ශිල්පී | 28 | 1 | 2 | 7 | 1 | 9 |
| ඇලුමිනියම් නිර්මාණ ශිල්පී | 18 | 3 | 4 | 5 | 1 | 9 |
| ඖෂධවේදී | 6 | 4 | 5 | 1 | 8 | 7 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 14 | 2 | 3 | 4 | 6 | 1 |
| ආරක්ෂක නිලධාරී | 21 | 5 | 1 | 3 | 1 | 1 |
| මූල්‍ය සහකාර | 9 | 1 | 1 | 1 | - | - |
| මුදල් අයකැමි | 9 | 4 | 5 | 3 | 9 | 1 |
| සෞඛ්‍ය සේවා සහකාර | 10 | - | - | - | - | - |
| සෞඛ්‍ය සේවා හෙදි | 34 | - | - | - | - | - |
| සෞඛ්‍ය සේවා ප්‍රධාන හෙදි | 6 | - | - | - | - | - |

*සටහන: පුරෝකථනය කරන ලද අතිරේක ඉල්ලුම මඟින් නව ඉල්ලුම පෙන්නුම් කරන අතර දී ඇති වර්ෂය තුල දැනට සිටින සේවකයින් ගණනට අමතරව නව ඉල්ලුමක් උපදවනු ඇත.*

*මූලාශ්‍රය: පළාත් කර්මාන්ත ක්ෂේත්‍ර සමීක්ෂණය*

ඉහත දත්ත මඟින් පෙන්නුම් කරනුයේ විවිධ නිපුණ සේවක කාණ්ඩ සඳහා ඉල්ලුම ඉතා අඩු බවයි.

උතුරු මැද පළාතේ නිශ්පාදන අංශයෙන් නිපුණ සේවකයින් සඳහා අඩු ඉල්ලුමක් පැවතීමට හේතු පහත පරිදි හඳුනාගෙන ඇත.

1. කලින් පැහැදිලිකර ඇති පරිදි, උතුරු පළාතේ නිශ්පාදන අංශයේ ප්‍රමාණය ඉතා කුඩා වේ. මධ්‍යම හා මහා පරිමාණ ව්‍යාපාර ඉතා සුළු ප්‍රමාණයක් හැරෙන්නට (ඇඟළුම් කර්මාන්ත වැනි) ආසන්න වශයෙන් 95% ක් පමණ සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරික ස්ථාන වේ. මේවායේ සේවක සංඛ්‍යාව 200 ට වඩා අඩු වේ. වර්ධනය වන සහ ස්ථාපිත නිශ්පාදන අංශයක් නොමැති වීම කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණුලාභීන්ට රැකියා සොයා ගැනීමට අපහසු වීමට ප්‍රධාන හේතුව වේ.

2. ව්‍යාපාරික ස්ථාන නුපුහුණු සහ අවිධිමත් පුහුණුව ලැබූ පුද්ගලයින් කෙරෙහි විශ්වාසය තබා ඇති අතර එම පුද්ගලයින්ගේ වේතන වියදම් ඉතා අඩුවන අතර ඔවුන්ගේ සේවා කොන්දේසි ඉල්ලීම් පහළ මට්ටමක තිබෙන බවද නිරීක්ෂණය කල හැකිය.

3. එලෙසම ව්‍යාපාරික ආයතන දෛනික පදනම මත හෝ අනියම් පදනම මත කම්කරුවන් සේවයේ යෙදවීමට වැඩි කැමැත්තක් දක්වන බවද නිරීක්ෂණය විය. මෙහිදී සේවක අර්ථසාධක අරමුදල් සහ සේවකභාරකාර අරමුදල් ගෙවීම ඔවුන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා බරපතල ගැටළුවක් බවට පත්ව ඇති බව සඳහන් කරයි.

4. බොහෝ සමාගම්වලට ව්‍යාපාරය පුළුල් කිරීමේ කිසිම අනාගත සැලැස්මක් නොමැති බව ප්‍රශ්ණාවලී සමීක්ෂණයේදී නිරීක්ෂණය විය. ව්‍යාපාරිකයන්ගේ තත්ත්වය වන්නේ ඔවුන්ගේ ව්‍යාපාර ඉතා අමාරුවෙන් පවත්වාගෙන යන අතර, අනාගත ව්‍යාපාර පුළුල් කිරීම සඳහා කිසිදු ඉඩක් නැති බවයි. මෙම ගැටළු නිසා සමහර ව්‍යාපාරිකයන් තම ව්‍යාපාර වසා දැමීමට බලාපොරොත්තුවන බව පවා සඳහන්කර ඇති අතර ඔවුන් වෙනත් ස්ථානවල රැකියා සොයා ගන්නාබව පෙන්වා දී ඇත.

5. බොහෝ සේවායෝජකයින් ඔවුන්ගේ අනාගතය ගැන අශුභවාදී ලෙස බලන නිසා ඔවුන්ට අනාගතයේදී ඉල්ලුම තවදුරටත් වැඩිකර ගැනීමට අවශ්‍ය නොවන බව කියාසිටී.

6. තවදුරටත් නිරීක්ෂණය කල හැකි වූයේ, සමස්ථ නිශ්පාදන, සංචාරක සහ සේවා අංශවල කලා සහ කළමණාකරණ උපාධිධාරීන් සඳහා රැකියා නොපවතින බවයි. ඒවායේ රැකියා පවතින්නේ පහළ මට්ටමේ පුහුණු පුද්ගලයින් සඳහා වේ.

7. බොහෝ ව්‍යාපාරික ආයතන ස්ථිර බඳවා ගැනීම් සඳහා ආදේශකයක් ලෙස කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතන මඟින් සපයන පුහුණුවන්නන් භාවිතාකරන බවද අපිට නිරීක්ෂණය විය. මෙම ව්‍යාපාරික ස්ථාන මඟින් පුහුණුවන්නන් බඳවා ගැනීමට චක්‍රානුකූල ක්‍රමයට සැලසුම් සාදාඇත. මේ නිසා ඔවුන්ගේ ව්‍යාපාර පුහුණු වන්නන් භාවිතයෙන් නොකඩවා පවත්වාගෙන යාමට හැකිවේ. පුහුණුවන්නන් ඉහළ වැටුප් ඉල්ලා සිටින්නේ නැති බැවින් කුඩා දීමනාවක් පමණක් ගෙවීමට අවශ්‍යවේ. මෙම ව්‍යාපාරික ස්ථාන වෘත්තීය පුහුණුවන්නන්මත රඳා පවතින අතර චක්‍රාණුකූල ක්‍රමයට ස්ථිර රැකියා අවස්ථා ඇති ස්ථානවලට බඳවාගනී. මෙම කරුණ රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් පවා නිරීක්ෂණය කල හැකි විය.

8. සංචාරක සහ හෝටල් ක්ෂේත්‍රයේ වෙළෙඳපොළෙහි එක් එක් කාලවල ස්වභාවය අනුව ව්‍යාපාරික ආයතනවලට ස්ථිර ශ්‍රම බලකායක් බඳවා ගැනීමට නොහැකි බව සාමාන්‍ය හැඟීම වේ. බොහෝ සේවක කාණ්ඩ සඳහා ව්‍යාපාරික ආයතන අවිධිමත් පුහුණුව ලබාගත් පුද්ගලයින් හෝ නුපුහුණු සේවකයින් අඩු වැටුපට සේවය ලබා ගනී. උදාහරණයක් ලෙස, සූපවේදීන්/අරක්කැමියන්, කාමර සේවකයින් සහ අනෙකුත් හෝටල් සේවකයින් වැනි කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුහුණුව ලැබූ පුද්ගලයින්ගෙන් පිරවිය හැකි විශාල ඉල්ලුමක් ඇති බව යමෙක් සිතුවත් සත්‍ය වන්නේ

මෙම රැකියාවලින් විශාල ප්‍රමාණයක් සඳහා වැඩි ප්‍රතිශතයක් නුපුහුණු සහ අවිධිමත් ලෙස පුහුණුව ලැබූ පුද්ගලයින් බඳවා ගන්නා බවයි. විධිමත් ලෙස පුහුණුව ලැබූ සේවකයින් පමණක් අපගේ දත්තවලින් පෙන්නුම් කරයි. එක් බරපතල වැරද්දක් වන්නේ සංචාරක සහ හෝටල් ක්ෂේත්‍රයේ පවත්වාගෙන යන ව්‍යාපාර වලින් 95% කට වඩා ප්‍රධාන හෝටල් නොවීමයි. ඒවා සුළු ලෙස පවත්වාගෙන යන නවාතැන් සහ ආපනශාලා වන අතර ඒවාට වැටුප් ගෙවන සේවකයින් බඳවා ගන්නවා වෙනුවට පවුලේ සාමාජිකයින් සේවයේ යෙදෙයි. සංචාරක ව්‍යාපාරය පුළුල් වීමත් සමඟ සිදුවන්නේ මේ අකාරයේ ව්‍යාපාර දියුණුවීම වන අතර වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ක්ෂේත්‍රයේ ශ්‍රම බලකාය සඳහා කිසිඳු ඉල්ලුමක් නිර්මාණය නොවේ.

9. සේවා අංශයේ පවා ව්‍යාපාර විශාල ප්‍රතිශතයක් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණුව ලැබූ පුහුණුලාභීන් කිසිඳු සැලකිය යුතු සංඛ්‍යාවක් සේවයේ යොදවා නොමැති සිල්ලර සහ තොග වෙළෙඳ ආයතන වේ. මෝටර් කාර්මික, අළුත්වැඩියා කිරීම් සහ අනෙකුත් සේවා පුහුණු වන්නන් හෝ නුපුහුණු ශ්‍රමිකයින් මෙම රැකියාවල ප්‍රධාන භූමිකාව ගෙන තිබේ.
10. කර්මාන්ත ක්ෂේත්‍රවල පවතින අඩු වැටුප් සහ රැකියාවල අවිනිශ්චිතභාවය නිසා බොහෝ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණුව ලැබූ පුද්ගලයින් විදේශ රැකියා සඳහා මැදපෙරදිග රටවලට හෝ දකුණු කොරියාව වැනි ආසියාතික රටවලට පිටත්වයාම පෙන්නුම් කරයි.

උතුරු මැද පළාත් ආර්ථිකය තුල බරපතල ව්‍යුහාත්මක සාධක පවතින අතර, ඉල්ලුමක් නිර්මාණය කිරීම මඟින් එය වලක්වාගෙන ඇති බව අවධාරණය කලයුතුය. එහි ප්‍රතිඵලයක් ලෙස, අනාගත සංවර්ධන සැලසුම්වලට සමස්ථ ප්‍රතිපත්ති සහ නියාමන වෙනස්කම් සමඟ ක්ෂේත්‍ර මූලිකකර ගත් ප්‍රතිසංස්කරණ සහ ප්‍රවර්ධනයන් අවශ්‍ය වේ. මේවා පිළිබඳව මෙම වාර්ථාවේ 6 වන පරිච්ඡේදයේ සඳහන්කර ඇත.

### 4.4 සේවායෝජකයින් විසින් පෙන්වාදෙන ලද අපේක්ෂිත සේවා සංඛ්‍යාවේ ප්‍රශ්ණ සහ ගැටළු

ඉදිරි වර්ෂ පහ තුලදී පළාතේ ශ්‍රම බලකාය සඳහා ඉල්ලුම සේවායෝජකයාගේ ප්‍රතිචාරමත සම්පූර්ණයෙන් ලබාගැනීමට අවශ්‍යනම්, සේවායෝජකයින් විසින් අපේක්ෂිත රැකියා ප්‍රමාණය ප්‍රකාශකිරීමට පුහුණු සැපයුම් භාවිතා කිරීමට තීරණය කරනු ඇත. කෙසේ වෙතත්, ඉදිරි පස් වසර තුල ශ්‍රම ඉල්ලුම සඳහා සේවායෝජකයින් ලබාදුන් දත්ත මඟින් සැලකිය යුතු ප්‍රශ්න සහ ගැටළු ඇතිකරන බව අපගේ අදහස වන අතර, එම ගැටළු පහත සඳහන් පරිදි සාරාංශකල හැක.

a. ආදායම්බදුවලට ලක්වේ යැයි යන බිය නිසා සේවායෝජකයින් ශ්‍රමය සඳහා අනාගත ඉල්ලුම මෙන්ම වත්මන් ඉල්ලුමද ප්‍රකාශ කරන්නේ නැත.

b. සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා භාරකාර අරමුදල ගෙවීමට බලකරණු ඇතැයි යන හැඟීම නිසා ද සේවායෝජකයින් තමන්ගේ අනාගත සේවක සංඛ්‍යාව පුරෝකථනය කිරීමේ දී අඩු ප්‍රතිචාරයක් පෙන්වයි.

c. සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා භාරකාර අරමුදල් ගෙවීමෙන් වැලකී සිටීම සඳහා බොහෝ සේවායෝජකයින් කෙටිකාලීන සහ තාවකාලික මෙන්ම දෛනික ශ්‍රමිකයින්ගේ සේවය ලබාගනී.

d. පුහුණුවන්නන්ට වෙළෙඳපොළේ පවතින වැටුප්වලට සමාන වැටුප් ගෙවිය යුතු බැවින් සේවායෝජකයින් පුහුණු සේවකයින් භාවිතා කරනවාට වඩා පුහුණුව ලබන පුද්ගලයින් තම සේවා සඳහා යොදවා ගැනීමට වැඩි කැමැත්තක් දක්වන බව පෙනී යයි.

e. සමහර සේවායෝජකයින් තම පෞද්ගලික දේශපාලන අදහස්වලට යටත්ව ප්‍රතිචාර දක්වන ලදී. ඔවුන් බලයේ සිටින රජයට එරෙහි විට, ඔවුන්ගේ ව්‍යාපාර හොඳනැති බව ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වේ. තවද, ඔවුන් මෙම ව්‍යාපාර වලින් ඉවත් විය හැකි බවත් එම නිසා අනාගතයේදී නව බඳවා ගැනීම් අනවශ්‍ය බවත් පවසයි.

f. බොහෝ ව්‍යාපාර කෙටිකාලීන අරමුණු සහිත ඒවා බැවින් ඔවුන්ට අනාගත ව්‍යාපාර සැලසුම් කිසිවක් නැති අතර අනාගතයේ ඔවුනගේ රැකියාගතවීම් පිළිබඳ විස්තර ලබාදීමට හැකියාවක් නොමැත. බොහෝ ව්‍යාපාරික ආයතනවලට ඇත්තේ ඉතාමත්ම වත්මන් ව්‍යාපාරික අවධානයන් පමණි. එම නිසා අනාගත මෙහෙයුම් පිළිබඳව ඉතා අවිනිශ්චිත බලාපොරොත්තු ඇත. මේ නිසා ඔවුන්ට ව්‍යාපාර පුළුල් කිරීමේ සැලසුම් නැති බැවින් අනාගතයේ කිසිම සේවක වැඩිකිරීමක් අවශ්‍ය නොවේ.

සේවායෝජකයින් විසින් ප්‍රකාශකල පරිදි වර්තමාන සහ අපේක්ෂිත රැකියා සංඛ්‍යාවලට සම්බන්ධ මෙම ප්‍රශ්න සහ ගැටළු පුරෝකථනය කරන ලද ශ්‍රම ඉල්ලුම සඳහා බරපතල ලෙස බලපෑමේ නැඹුරුවක් පවතී. සේවායෝජකයින්ගේ හැඟීම්මත ආර්ථික ශ්‍රම ඉල්ලුම පුරෝකථනය කිරීම ආර්තික විශාරදයින් විසින් මූලික වශයෙන් බලාපොරොත්තු නොවේ. මෙයට හේතුව ඔවුන්තුල පවතින විශ්වාසයන් මෙන්ම අවදානම් ඔවුන්ගේ හැඟීම්වලට බලපාන නිසා වේ. ඕනෑම අර්ථවත් ආර්ථික අනාවැකියක් සඳහා ආර්ථික ප්‍රවනතාවයන් සහ මූලධර්මයන් සලකාබැලීමට අවශ්‍ය වේ. මේ නිසා, අනාගත රැකියා සඳහා විකල්ප දත්ත කට්ටලයක් ලබාදීමට අපි ආර්ථික පුරෝකථනයන් භාවිතා කරයි. සේවායෝජකයින් හැඟීම් පාදක කරගෙන කරනු ලබන පුරෝකථනයන්ට විකල්පයක් ලෙස මෙම පුරෝකථනයන් භාවිතා කල හැක.

## 4.5 සේවායෝජකයන්ගේ හැඟීම් පදනම්කරගත් පුරෝකථනයන් සඳහා විකල්පයක් ලෙස ආර්ථික/ කර්මාන්ත වර්ධනයමත පදනම් වූ පුරෝකතනය

මෙහි ප්‍රතිඵලයක් ලෙස, උතුරු මැද පළාතේ එක් එක් වෘත්තීය සඳහා සේවකයින්ගේ ඉල්ලුම පුරෝකතනය කිරීමට අපි පහත සඳහන් කල ශ්‍රේණි ආර්ථිකමිතික/ සංඛ්‍යානමය ක්‍රමය භාවිතා කළෙමු.

a. 2015 දී j වැනි වෘත්තියෙහි පුරෝකතනය කරන ලද අනාගත සේවක සංඛ්‍යාව

$$DL^i_{2015} = \{DL_{t=0}{}^i(1+g_{EM})^{t+1}\} - \{DL_{t=0}{}^i\}$$

b. 2016 දී j වැනි වෘත්තියෙහි පුරෝකතනය කරන ලද අනාගත සේවක සංඛ්‍යාව

$$DL^i_{2016} = \{DL_{t=0}{}^i(1+g_{EM})^{t+2}\} - \{DL_{t=0}{}^i(1+g_{EM})^{t+1}\} - \{DL_{t=0}{}^i\}$$

c. 2017 දී j වැනි වෘත්තියෙහි පුරෝකතනය කරන ලද අනාගත සේවක සංඛ්‍යාව

$$DL^i_{2017} = \{DL_{t=0}{}^i(1+g_{EM})^{t+3}\} - \{DL_{t=0}{}^i(1+g_{EM})^{t+2}\} - \{DL_{t=0}{}^i\}$$

d. 2018 දී j වැනි වෘත්තියෙහි පුරෝකතනය කරන ලද අනාගත සේවක සංඛ්‍යාව

$$DL^i_{2018} = \{DL_{t=0}{}^i(1+g_{EM})^{t+4}\} - \{DL_{t=0}{}^i(1+g_{EM})^{t+3}\} - \{DL_{t=0}{}^i\}$$

e. 2019 දී j වැනි වෘත්තියෙහි පුරෝකතනය කරන ලද අනාගත සේවක සංඛ්‍යාව

$$DL^i_{2019} = \{DL_{t=0}{}^i(1+g_{EM})^{t+5}\} - \{DL_{t=0}{}^i(1+g_{EM})^{t+4}\} - \{DL_{t=0}{}^i\}$$

f. 2020 දී j වැනි වෘත්තියෙහි පුරෝකතනය කරන ලද අනාගත සේවක සංඛ්‍යාව

$$DL^i_{2020} = \{DL_{t=0}{}^i(1+g_{EM})^{t+6}\} - \{DL_{t=0}{}^i(1+g_{EM})^{t+5}\} - \{DL_{t=0}{}^i\}$$

මෙහි :

DL = ශ්‍රමය සඳහා ඉල්ලුම

i = දෙනලද වෘත්තියක්

$g_{Em}$ = දෙන ලද වෘත්තියක රැකියාගතවීමේ අපේක්ෂිත වර්ධන අනුපාතය

t = කාලය

**ශ්‍රමය සඳහා ඉල්ලුම පුරෝකතනයේදී භාවිතා කල උපකල්පන**

එක් එක් වෘත්තියේ ශ්‍රම බලකාය ගණනය කිරීමට "Satata" නැමැති ආර්ථික මිනිසා මෘදුකාංගය උපයෝගීකරගෙන ඉහත සමීකරණ භාවිතා කරන ලදී. උතුරු මැද පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රවල රැකියාගතවීමේ පුරෝකථනය ගණනය කිරීමේදී පහත සඳහන් කරුණු පදනම් කරගත යුතුවේ;

ඉදිරි වර්ෂ පහ තුල අපේක්ෂිත ආර්ථික වර්ධනය, වැඩකරන ස්ථාන වලින් ඉවත්වන/ විශ්‍රාම බලන පුද්ගලයින්ගේ අපේක්ෂිත අගය, අසනීප සහ මරණ නිසා ශ්‍රම බලකායෙන් ඉවත්වන ගණන, පළාත්වලින් රටෙහි අනෙකුත් පළාත්වලට සහ වෙනත් රටවල රැකියා සඳහා සංක්‍රමණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ජනනය වන පුරප්පාඩු සංඛ්‍යාව. උතුරු මැද පළාතේ ශ්‍රම බලකායේ ඉල්ලුමෙහි පුරෝථතනයන් සඳහා පහත සඳහන් උපකල්පනයන් සහ දළ කරුණු සැලකිල්ලට ගන්නා ලදී.

a. රජයේ මෙන්ම මහ බැංකුවේ දී ඉලක්කය වී ඇත්තේ ඉදිරි වර්ෂ කීපය තුලදී දළ දේශීය නිශ්පාදන වර්ධනය 8%ක අවමයක් පවත්වා ගැනීමට සහ 2030 වන විට වර්ෂයකට ඒකපුද්ගල ආදායම ඇ.ඩො. 12,000 කට ලඟාවීමයි. ආර්ථික වර්ධනය මඟින් උතුරු මැද පළාතේ නව රැකියා උත්පාදනය වනු ඇතැයි අපේක්ෂා කරයි.

   උතුරු මැද පළාතේ ඉදිරි වර්ෂ කීපය තුල මෙම ආර්ථික ප්‍රසාරණයේ ප්‍රතිඵලයක් ලෙස මතු කිරීමට අපේක්ෂාකරන බොහෝ ආර්ථික කටයුතු සලකා බැලීමේදී ප්‍රාථමික කර්මාන්ත සහ අනුගාමී සේවාවල කඩිනම් ආර්ථික කටයුතු බව, පළාතේ ඇතිවිය හැකි නව රැකියාවල අපේක්ෂිත අනුපාතය තීරණය කිරීමට අපි පළාත සඳහා 1:3 ශ්‍රම-නිපැයුම් අනුපාතය භාවිතා කරන ලදී. මේ නිසා ඉදිරි පස් වසරක කාලය තුල පළාත තුල ඉහත අපේක්ෂිත ආර්ථික වර්ධනයට අනුව එක් එක් වෘත්තියේ 3%ක වර්ධන අනුපාතයක් අපි අපේක්ෂා කරයි. ශ්‍රී ලංකාව ඉදිරි දශක දෙක තුල ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම ඉලක්කය වන බැවින් දී ඇති අපේක්ෂිත රැකියා ප්‍රසාරණය සාධාරණ අපේක්ෂාවකි.

b. සෑම වසරකම, විශ්‍රාම යාම නිසා ශ්‍රම බලකායෙන් ඉවත්වන පුද්ගලයින් සංඛ්‍යාව, මරණ හෝ රෝගාබාධ නිසා අදාල සේවා වලින් ඉවත්වන ප්‍රමාණයද පුරෝකතනයන් සඳහා ගණනය කිරීම් වලදී සලකන ලදී. උතුරු මැද පළාතේ පුද්ගලික අංශයේ විශ්‍රාමික දත්ත නොමැති බැවින් පෞද්ගලික අංශයේ විශ්‍රාමික අනුපාත සඳහා අපි ප්‍රතියුක්තයක් ලෙස වයස්ගත ජනගහන අනුපාත භාවිතා කරන ලදී. 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහන අනුපාතය 3.63 ක් විය. මෙය 2021 දී 3.72 ක් විය හැකිය (ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව). එක්සත් ජාතීන්ගේ ජනගහන දත්ත අනුව 2013 දී ශ්‍රී ලංකාවේ දළ මරණ අනුපාතය 7% ක් විය. ස්ථිර රෝග හෝ වයස්ගත වීම අනුව තවත් කොටසක් ද ශ්‍රම බලකායෙන් ඉවත්වේ.

   ඉහත හේතු නිසා ඉදිරි වර්ෂ පහ තුල පළාතේ ශ්‍රම බලකායෙන් ඉවත්වන බව පෙන්නුම්කරන ප්‍රතිශතය වාර්ෂිකව 12% ක් පමණ වේ. අපේක්ෂිත විශ්‍රාමයන ගණන, මරණ සහ රෝගාබාධ සැලකීමේ දී අඩුම වශයෙන් 10% ක් ශ්‍රම බලකායෙන් ඉවත්වන බව අපි උපකල්පනය කළෙමු. මේ නිසා ඉදිරි වර්ෂ පහ තුල උතුරු මැද පළාතේ එක් එක් වෘත්තියෙහි නිපුණ සේවකයින් සඳහා 10% ක නව ඉල්ලුමක් අපි ඇත්ලත් කළෙමු.

c. ශ්‍රමිකයින් සංක්‍රමණය වීමද පළාතක ශ්‍රම බලකායට බලපෑමක් ඇති කිරීමේ ප්‍රවනතාවයක් ඇත. පුහුණු ශ්‍රමිකයන් රටෙහි වෙනත් පළාත්වලට සහ අනෙකුත් රටවලට සංක්‍රමණය වීම අළුතින් ප්‍රමාණයක් ශ්‍රම බලකායට ඇතුළු වීම සඳහා යම් පුරප්පාඩු ප්‍රමාණයක් නිර්මාණය කරයි. ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශවලට සහ අනෙකුත් රටවලට ආගමනය වීම ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංසිද්ධියක් වේ. ප්‍රධාන වශයෙන් ග්‍රාමීය ආර්ථිකයක පළපුරුදු ශ්‍රමිකයින් මෙම පළාතින් වෙනත් පළාත්වලට හෝ වෙනත් රටවල් වලට සංක්‍රමණය වනු ඇතැයි උතුරු මැද පළාත අපේක්ෂා කරයි. බොහෝ විට, ඓතිහාසික සාක්ෂි මඟින් පෙන්නුම් කරන්නේ වඩාත් පළපුරුද්දක් ඇති සහ ජ්‍යේෂ්ඨ නිපුණ සේවකයින් විදේශගතව රැකියා කිරීමට හෝ රටෙහි අනෙකුත් පළාත්වල අගනගරවලට සංක්‍රමණය වීමට තෝරාගෙන ඇති බවයි. මෙම ප්‍රමාණයන් ගණනය කිරීමට ශ්‍රම වෙළෙඳපොළට නව ප්‍රවේශයක් සඳහා 2% ක වර්ධනයක් අපි ඇතුලත් කළෙමු.
| **ජල නල කාර්මික s** | 15 | 1 | 14 | 15 | 2 | 13 | 15 | 4 | 11 | 15 | 4 | 11 | 15 | 5 | 10 |
| නාන තටාක උපස්ථායක | 0 | 0 | 0 | 0 | 2 | -2 | 0 | 3 | -3 | 0 | 3 | -3 | 0 | 4 | -4 |
| ව්‍යාපෘති කළමනාකරු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ව්‍යාපෘති සුපරීක්ෂක | 0 | 2 | -2 | 0 | 3 | -3 | 0 | 4 | -4 | 0 | 6 | -6 | 0 | 7 | -7 |
| ප්‍රමාණාත්මක මිනින්දෝරු | 0 | 3 | -3 | 0 | 3 | -3 | 0 | 4 | -4 | 0 | 6 | -6 | 0 | 7 | -7 |
| පිළිගැනීමේ නිළධාරී | 0 | 4 | -4 | 0 | 6 | -6 | 0 | 8 | -8 | 0 | 10 | 10 | 0 | 13 | 13 |
| ආපන ශාලා සුපරීක්ෂක | 0 | 5 | -5 | 0 | 8 | -8 | 0 | 10 | -10 | 0 | 14 | 14 | 0 | 18 | 18 |

| වෘත්තිය | 2016 | | | 2017 | | | 2018 | | | 2019 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | S | D | G | S | D | G | S | D | G | S | D | G | S | D | G |
| **සහල් මෝල් සේවකයින්** | 0 | 54 | -54 | 0 | 89 | 89 | 0 | 0 | 130 | 0 | 6 | 6 | 0 | 9 | 9 |
| රූම් බෝයි | 20 | 10 | 10 | 20 | 14 | 6 | 20 | 18 | 2 | 20 | 23 | -3 | 20 | 28 | -8 |
| ආරක්ෂක නිලධාරී | 0 | 5 | -5 | 0 | 9 | -9 | 0 | 13 | -13 | 0 | 19 | 19 | 0 | 24 | 24 |
| ඩිජිටල් මුද්‍රක සහ ස්ටිකර් | 30 | 5 | 25 | 30 | 8 | 22 | 30 | 12 | 18 | 30 | 16 | 14 | 30 | 22 | 8 |
| ඇඳුම් මැසීම | 105 | 16 | 89 | 5 | 25 | 0 | 5 | 37 | 248 | 5 | 50 | 5 | 5 | 65 | 0 |
| පිගන් ගඩොල් අතුරන්නා | | 25 | | | 25 | | | 25 | | | 25 | | | 25 | |
| වාහන සේවා කාර්මික | 0 | 7 | -7 | 0 | 12 | 12 | 0 | 16 | -16 | 0 | 22 | 22 | 0 | 28 | 28 |
| වේටර්වරුන් | 30 | 15 | 15 | 30 | 21 | 9 | 30 | 27 | 3 | 30 | 34 | -4 | 30 | 42 | 12 |
| වෙබ් පිටු නිර්මාණ ශිල්පී | 40 | 0 | 40 | 50 | 0 | 50 | 50 | 0 | 50 | 50 | 0 | 50 | 50 | 0 | 50 |
| පැස්සුම් ශිල්පී | 77 | 24 | 53 | 7 | 35 | 2 | 7 | 48 | 199 | 7 | 63 | 4 | 7 | 80 | 7 |
| **දැව ශිල්පීය නිර්මාණකරුවන්** | 0 | 2 | -2 | 0 | 3 | -3 | 0 | 5 | -5 | 0 | 6 | -6 | 0 | 8 | -8 |

සටහන: S = පුහුණු සැපයුම; D = ශ්‍රමය සඳහා ඉල්ලුම; G = වෙනස (ශ්‍රමයේ හිඟය හෝ අතිරික්තය)

5.14 වගුවෙන් ඉදිරි පස් වසර තුල ඉල්ලුම, සැපයුම, හිඟය සහ අතිරික්තය පිළිබඳව පැහැදිලි චිත්‍රයක් ලබාදෙයි. ඉදිරි වර්ෂ කීපය සඳහා පුහුණුව සැලසුම් කිරීමට පුහුණු ආයතනවලට මෙය අතිශයින් ප්‍රයෝජනවත් වේ.

a. වගුවේ ඍණ අගයන් මඟින් පෙන්නුම් කරනුයේ පස් අවුරුදු කාලයක් තුල ඇති වෘත්තියේ මුළු පුහුණු සැපයුම, එම කාලය තුල අදාල වෘත්තියේ නිපුණ පුද්ගලයින් සඳහා ඇති ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නොවන බවයි. මෙම තත්ත්වය තුල, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතන එවැනි පාඨමාලා සඳහා සිසුන් ප්‍රමාණය වැඩිකිරීමට පියවර ගතයුතුය.
b. වගුවේ ධන අගයන් මඟින් පෙන්නුම් කරනුයේ පළාතේ යම් වෘත්තියකට අවශ්‍ය ප්‍රමාණයට වඩා පුහුණු ආයතන මඟින් ඉදිරියේ පුහුණුව ලබාදීම සිදුවිය හැකි අතර පුහුණු සැපයුමෙහි අතිරික්තයක් ඇතිවිය හැකි බවයි. එවැනි අවස්ථා වලදී;
    a. වෘත්තීය පුහුණු ආයතන මඟින් පුහුණු කරන සිසුන් සංඛ්‍යාව අඩු කිරීම හෝ
    b. අනෙකුත් පළාත් වලින් රැකියා අවස්ථා සොයා ගැනීම සඳහා පුහුණු කිරීම හෝ

c. නිපුණ සේවකයින්ගේ විරැකියාව වලක්වා ගැනීම සඳහා වෙනත් රටවල්වලට යැවීමට පුහුණු කිරීම. මේ අවස්ථාවේදී විදේශ භාෂා ප්‍රවීණතා අවශ්‍ය විය හැකි අතර විදේශ භාෂා පුහුණු සංරචක විෂයමාලා තුල තිබීම වැදගත් වේ.

**වගුව 5.15: 2016 සිට 2020 දක්වා උතුරු මැද පළාතේ ඉල්ලුම සහ සැපයුම**

| **වෘත්තිය** | **මුළු පුහුණු සැපයුම** | **මුළු ශ්‍රම ඉල්ලුම** | **හිඟය (-) /අතිරික්තය (+)** |
|---|---|---|---|
| ගුවන්විදුලි, රූපවාහිනී අළුත්වැඩියාකරන්නා | 1395 | 175 | 1220 |
| ගණකාධිකාරී | 200 | 62 | 138 |
| **ගිණුම් සහකාර** | 0 | 89 | -89 |
| දැන්වීම්කරු | 125 | 33 | 92 |
| ඇලුමිනියම් පිරිසැකසුම්කරු | 0 | 69 | -69 |
| **ඇලුමිනියම් සේවක** | 0 | 37 | -37 |
| කෘෂිකාර්මික අලවි සහායක | 180 | - | - |
| බේකරිකරු | 1270 | 73 | 1197 |
| ***බේකරි සේවක*** | 0 | 71 | -71 |
| බාබෙන්ඩර් | - | 125 | - |
| ආපන ශාලා සේවක | 0 | 24 | -24 |
| රූපලාවන්‍ය ශිල්පී | 225 | 144 | 81 |
| බෙල්බෝයි | 0 | 34 | -34 |
| **බයිට් නිෂ්පාදකයන්** | 0 | 38 | -38 |
| පරිසණක යෙදවුම් සහායක | 1850 | 71 | 1779 |
| **වේවැල් නිශ්පාදනය** | 0 | 62 | -62 |
| **හිස්වැසුම් නිෂ්පාදක** | 0 | 6 | -6 |
| වඩු කාර්මික | 75 | 492 | -417 |
| මුදල් අයකැමි | 0 | 80 | -80 |
| සූපවේදී | 150 | 190 | -40 |
| **පරිගණක ක්‍රියාකරුවන්** | 450 | 176 | 274 |
| **පරිගණක අළුත්වැඩියාව** | 1460 | 79 | 1381 |
| පරිගණක දෘඩාංග ශිල්පී | 250 | 0 | 250 |

| වෘත්තිය | මුළු පුහුණු සැපයුම | මුළු ශ්‍රම ඉල්ලුම | හිඟය (-) /අතිරික්තය (+) |
|---|---|---|---|
| කුෂන් වැඩකරු | 0 | 44 | -44 |
| ඩිජිටල් මුද්‍රක | 200 | 36 | 164 |
| සැලසුම්කරු | 100 | 17 | 83 |
| විදුලි කාර්මික | 1495 | 199 | 1296 |
| ඉලෙක්ට්‍රොනික ශිල්පී | 200 | 95 | 105 |
| ඉංජිනේරු සේවා සපයන්නා | 0 | 22 | -22 |
| ඉංග්‍රීසි (සාමාන්‍ය) | 1200 | 0 | 1200 |
| ෆයිබර්ග්ලාස් සේවක | 0 | 4 | -4 |
| වැඩ මූලික | 150 | 30 | 120 |
| කායීල සුපරීක්ෂක | 0 | 46 | -46 |
| උයන්පල්ලා | 100 | 36 | 64 |
| වීදුරු කපන්නන් | 0 | 14 | -14 |
| පරිඝණක චිත්‍රක ශිල්පී | 370 | 28 | 342 |
| රන් ආභරණ නිර්මාණ නිර්මාණකරු | 0 | 23 | -23 |
| රන්කරු | 0 | 86 | -86 |
| කේෂාලංකරණ ශිල්පී | 950 | 71 | 879 |
| අත්යන්ත්‍ර යන්ත්‍ර ක්‍රියාකරු | 0 | 16 | -16 |
| සෞඛ්‍ය සේවා සහකාර | 0 | 39 | -39 |
| සෞඛ්‍ය සේවා හෙදි | 0 | 105 | -105 |
| හෝටල් කළමනාකරු | 0 | 35 | -35 |
| ගෘහ පාලක | 820 | 53 | 767 |
| ගෘහ පාලන සුපරීක්ෂක | 0 | 27 | -27 |
| මානව සම්පත් කළමනාකාර | 820 | 0 | 820 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ | 2525 | 24 | 2501 |
| රසායනාගාර ශිල්පී | 0 | 16 | -16 |
| ලියවන පට්ටල් වැඩකරු | 820 | 18 | 802 |
| ලොන්ඩරි සුපරීක්ෂක | 0 | 57 | -57 |
| ලොන්ඩරිකරු | 0 | 31 | -31 |
| වාහන දුනු නිශ්පාදකයින් | 0 | 17 | -17 |

| වෘත්තිය | මුළු පුහුණු සැපයුම | මුළු ශ්‍රම ඉල්ලුම | හිඟය (-) /අතිරික්තය (+) |
|---|---|---|---|
| යන්ත්‍ර ක්‍රියාකරු | 0 | 57 | -57 |
| යන්ත්‍ර ශිල්පී | 200 | 31 | 169 |
| පෙදරේරු කාර්මික | 425 | 553 | -128 |
| **මෝටර් බයිසිකල් සහ ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී** | 825 | 73 | 752 |
| **මෝටර් කාර්මික ශිල්පී** | 1420 | 105 | 1315 |
| මෝටර් කාර්මික | 0 | 30 | -30 |
| වාහන පින්තාරු ශිල්පී | 0 | 45 | -45 |
| මක්‍රො සොෆ්ට් ඔෆිස් පැකේජය | 1645 | 0 | 1645 |
| රාත්‍රී විගණක | 0 | 41 | -41 |
| දෘෂ්ටි විශේෂඥයා | 0 | 24 | -24 |
| පින්තාරු ශිල්පී | | 125 | |
| පේස්ට්‍රිඅරක්කැමියා | 0 | 65 | -65 |
| ඖෂධවේදී | 0 | 87 | -87 |
| ඡායාරූප ශිල්පී | 0 | 74 | -74 |
| **ඡායාරූප නිර්මාණකරුවන්** | 0 | 18 | -18 |
| **ජල නල කාර්මික** | 75 | 16 | 59 |
| නාන තටාක උපස්ථායක | 0 | 12 | -12 |
| ව්‍යාපෘති කළමනාකරු | 0 | 0 | 0 |
| ව්‍යාපෘති සුපරීක්ෂක | 0 | 22 | -22 |
| ප්‍රමාණාත්මක මිනින්දෝරු | 0 | 23 | -23 |
| පිළිගැනීමේ නිළධාරී | 0 | 41 | -41 |
| ආපන ශාලා සුපරීක්ෂක | 0 | 55 | -55 |
| **සහල් මෝල් සේවකයින්** | 0 | 678 | -678 |
| රූම් බෝයි | 100 | 93 | 7 |
| ආරක්ෂක නිලධාරී | 0 | 70 | -70 |
| ඩිජිටල් මුද්‍රක සහ ස්ටිකර් | 150 | 63 | 87 |
| ඇඳුම් මැසීම | 1245 | 193 | 1052 |
| පිගන් ගඩොල් අතුරන්නා | | 125 | |

| **වෘත්තිය** | **මුළු පුහුණු සැපයුම** | **මුළු ශ්‍රම ඉල්ලුම** | **හිඟය (-) /අතිරික්තය (+)** |
|---|---|---|---|
| වාහන සේවා කාර්මික | 0 | 85 | -85 |
| වේටර්වරුන් | 150 | 139 | 11 |
| වෙබ් පිටු නිර්මාණ ශිල්පී | 240 | 0 | 240 |
| පැස්සුම් ශිල්පී | 1065 | 250 | 815 |
| **දැව ශිල්පීය නිර්මාණකරුවන්** | 0 | 24 | -24 |

# 06 වන පරිච්ඡේදය

# නිර්දේශ සහ ක්‍රියාකාරි සැලැස්ම

මෙම වාර්ථාවේ විවිධ පරිච්ඡේදවල දත්ත විශ්ලේෂණය පදනම්කරගෙන අපි සාමාන්‍ය මෙන්ම විශේෂිත නිර්දේශ ඉදිරිපත් කරන්නෙමු. උතුරු මැද පළාතේ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සංවර්ධනය කිරීමට පුළුල් උපායමාර්ගයක් ක්‍රියාත්මක කිරීමේදී නිශ්චිත ක්‍රියාමාර්ග ගැනීමට සිදුවේ. මෙම ක්‍රියාමාර්ග සත්‍ය වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මෙන්ම අනෙකුත් විවිධ රාජ්‍ය ආයතනවල ද කැපවීම අවශ්‍ය වේ.

## 6.1 ශ්‍රම බලකා දත්තමත නිර්දේශ

ශ්‍රම වෙළෙඳපොළ ප්‍රවණතා විශ්ලේෂණය මඟින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව එක් එක් දිස්ත්‍රික්ක සඳහා පුළුල් ශ්‍රම බලකා දත්ත ගබඩාවක් පවත්වාගෙන යායුතු බව නිගමනය කිරීමට යොමුකරයි. මෙම දත්ත, පුහුණුව සපයන ආයතනවලට ලබාගත හැකිවිය යුතුය. මෙම දත්ත ගබඩාව පුහුණු ආයතනවල භාවිතය සඳහා අන්තර්ජාලයෙන් සම්බන්ධ වියහැකි ආකාරයට සකස් කළ හැකිය. ශ්‍රම බලකා දත්ත ගබඩාවක් නොමැතිවීම නිසා පුහුණු ආයතනවලට එක් එක් පාඨමාලාව සඳහා බඳවා ගතයුතු ශිෂ්‍ය සංඛ්‍යාව තීරණයකිරීම අපහසු වී ඇත. මෙම දත්ත ගබඩාවේ පහත සඳහන් තොරතුරු අන්තර්ගත විය යුතුය.

- සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය අතර විධිමත් සහයෝගීතා යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීමට නියාමනයක් සහ ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කරගත යුතු වේ.
- රාජ්‍ය විශ්ව විද්‍යාලවලට කලා විෂයධාරාවෙන් බාහිර උපාධි සිසුන් ඉතා ඉහළ සංඛ්‍යාවක් ලියාපදිංචි කරන නිසා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා සඳහා ඇති ඉල්ලුමට ඍණාත්මකව බරතපතල ලෙස බලපා ඇත. එලෙසම ශ්‍රම වෙළෙඳපොළ තුල බරපතල අසමතුලිතතාවයක් ඇතිකර තිබේ. මේ නිසා බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව සීමා කිරීම සඳහා නීතිමය පියවර ගතයුතුය.
- සේවායෝජකයින් විසින් නුපුහුණු සහ අර්ධ නිපුණ සේවකයින් භාවිතය අඩුකිරීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මඟින් සියළුම ව්‍යාපාරික ආයතන ජාතික වෘත්තීය සුදුසුකම් ලැබූ සේවකයින් සැලකිය යුතු කොටසක් භාවිතා කිරීම ස්ථිර කරගත යුතුයි.
- සියළුම ආයතනවල ශ්‍රම බලකායේ සැලකිය යුතු කොටසක් ජාතික වාත්තීය සුදුසුකම ලත් පුද්ගලයින් සිටිය යුතු බවට නීතිමය පියවර ගතයුතුය
- ප්‍රමිතිකරණයක් ලෙස සේවාලාභීන්ට සේවා දායකයින්ගේ ගුණාත්මකභාවය හඳුනාගැනීම සඳහා එක් එක් වෘත්තියට අඩුම සුදුසුකම්ලාභී සේවකයාගේ සිට වැඩිම සුදුසුකම්ලාභී සේවකයා දක්වාම කාණ්ඩවලට වෙන්කර බලපත්‍ර ලබාදීමේ ක්‍රමයක් හරහා සේවකයින් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම

- අඩු වියදමින් සේවය ලබාගැනීම සඳහා බදු/ සේවක අර්ථසාධක අරමුදල්/ සේවා භාරකාර අරමුදල් ගෙවීම මගහැරීමට සේවායෝජකයින් විසින් තම සේවා ස්ථානවල ස්ථිර සේවා බලකාය වෙනුවට ආදේශකයක් ලෙස පුහුණු වන්නන් භාවිතා කිරීම තහනම් කිරීමට නීති හඳුන්වාදිය යුතුය.
- ජාතික වෘත්තීය සුදුසුකම් ලබාගැනීම වෙනුවට බොහෝ තරුණයින් කුලී ත්‍රීරෝද රථ රියදුරන් වන නිසා ත්‍රීරෝද රථ කුලී රියදුරන් සඳහා අවම වයස් මට්ටමක් හඳුන්වාදීමට නීති රාමුවක් සකස්කල යුතුය.
- නීතිමය යාන්ත්‍රණයක් හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන කොමිෂම සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අතර ස්ථිර සහයෝගයක් ස්ථාපිත කලයුතුය
- වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු පාඨමාලා සඳහා ඇති ඉල්ලුම ඉහළ නැන්වීම සඳහා සහ ශ්‍රම වෙළෙඳපොළෙහි අසමතුලිතතාවයක් ඇති කරන කාර්යාලවලට නැඹුරු වෘත්තීන් සඳහා ඇති අතිරේක ඉල්ලුම අඩුකිරීමට පුද්ගලික උසස් අධ්‍යාපන ආයතන මඟින් පිරිනමන කාර්යාලවල රැකියා සොයන්නන් සඳහා ඉදිරිපත් කරන පාඨමාලා සීමාකල යුතුවේ.
- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ එක්ව ප්‍රවනතාවයන් සහ රටාවන් හඳුනාගැනීමට අවම වශයෙන් පසුගිය වසර පහ සඳහා එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශ්‍රම බලකා දත්ත ලබාගැනීම
- රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුලත්වීමට අපොහොසත් වූ වෙනත් විවිධ උසස් අධ්‍යාපන ආයතන වලින් අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උ. පෙළ) පසු පාඨමාලා හදාරන පුද්ගලයින්ගේ තොරතුරු
- අ. පො. ස. (උ. පෙළ) පසු රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා ඇතුළු වීමට අපොහොසත් වූ බාහිර උපාධි හදාරන පුද්ගලයින්ගේ දත්ත
- අ. පො. ස. (සා. පෙළ) හෝ අ. පො. ස. (උ. පෙළ) සඳහා දෙවැනිවර හෝ තුන්වැනිවර පෙනීසිටි පුද්ගලයින් සංඛ්‍යාව පිළිබඳ දත්ත
- අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උ. පෙළ) පසු රටෙහි අනෙකුත් ප්‍රදේශ සඳහා සංක්‍රමණය වූ පුද්ගලයින් සංඛ්‍යාව
- අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උ. පෙළ) පසු අනෙකුත් රටවල් සඳහා සංක්‍රමණය පුද්ගලයින් සංඛ්‍යාව පිළිබඳ දත්ත
- අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උ. පෙළ) පසු වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ක්ෂේත්‍රයේ හෝ වෙනත් ක්ෂේත්‍රයක තවදුරටත් අධ්‍යාපනය නොලබා ඍජුව රැකියාවක් සඳහා ඇතුළුවන පුද්ගලයින් සංඛ්‍යාව පිළිබඳ දත්ත
- ක්ෂේත්‍රයේ අවිධිමත් රැකියාගත පුහුණුව ලබාගත් පුද්ගලයින් සංඛ්‍යාවේ දත්ත

## 6.2 ජීවනෝපාය වෘත්තිකයින් සඳහා නිපුණතා පුහුණුවට නිර්දේශ

කුසලතා වැඩි දියුණු කිරිම සඳහා තුන්වන පරිච්ඡේදයේ විශ්ලේෂණයෙන් ලබාගෙන ඇති නිර්දේශ ගණනාවක් ක්‍රියාත්මක කිරීමට යොමුකරයි. ජීවනෝපාය වෘත්තීන් බොහෝ ලෙස විවිධ බැවින් කුසලතා සංවර්ධනය සඳහා වූ පොදු පාඨමාලා හෝ වැඩසටහන් මේ සඳහා සාධ්‍ය නොවේ. මේ පිළිබඳ අවධානය යොමුකර අනාගත ක්‍රියාමාර්ග ගතයුතුය. එක් එක් වෘත්තීන්/ ක්‍රියාකාරකම් සඳහා ඒ සඳහාම සැකසුනු නිපුණතා පුහුණු වැඩසටහන් අවශ්‍ය වේ. විවිධ ජීවනෝපාය වෘත්තීන්වල නියැලී සිටින සියළුදෙනා සඳහා පුහුණුව හෝ මූල්‍යමය දායකත්වය ලබාදුන හොත් ඉහළ හෝ ලාභදායී ව්‍යාපාර ඇතිවීමේ විභවයක් පවතින බවට අවසන් නිගමනයකට පැමිණීම වැරදි ව්‍යාවහාරයකි. බොහෝ ජීවනෝපාය වෘත්තීන්වල නියැලී සිටින අය, එම වෘත්තීන් තමන්ගේ උන්නතිය (පැවැත්ම) සඳහා උපාය මාර්ගයක් ලෙස පවත්වනාගෙන යන බව පෙනී යයි.

- දැනුවත්කිරීම් ආකාරයේ පුහුණු වැඩසටහන් අඩුකර විශේෂිත ව්‍යාපාර/ ක්‍රියාකාරකම්/ වෘත්තීන් ඉලක්කකල නිපුණතා පුහුණුව සැපයීම
- 3.4 වගුවෙහි දක්වා ඇති පරිදි ජීවනෝපාය වෘත්තිකයින්ට නිපුණතා සංවර්ධන පාඨමාලා සැලසුම් කිරීම සහ ලබාදීම
- පුහුණු වැඩසටහන් සඳහා රාජ්‍ය නිළධාරීන් භාවිතයට වඩා ක්ෂේත්‍රවල විශේෂඥයින් භාවිතා කිරීම මඟින් ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ දැනුම ලබාදීම
- ජීවනෝපාය වෘත්තිකයින් වැඩි සංඛ්‍යාවකට දිනයක් හෝ දින කීපයක් ගතකිරීම මඟින් තම උන්නතිය පවත්වාගැනීමේ ගැටළු පවතින නිසා විකල්ප උපායමාර්ග ලෙස ක්ෂේත්‍රගත පුහුණුව, සංචාරක ව්‍යාපාර/ නිත්‍යගත පුහුණු සහ ජංගම පුහුණුව වැනි ක්‍රම අත්හදා බැලිය යුතුය
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ ඒකාබද්ධව ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාපාර ආරම්භක මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට ඇති හැකියාව විමර්ශනය කල යුතුය
- අ. පො. ස. (උ. පෙළ) තාක්ෂණ විෂයය සිසුන් ඉලක්කකර ගනිමින් යෝජිත විශ්ව විද්‍යාල විද්‍යායතන පිහිටුවීමද අත්‍යාවශ්‍ය වේ.
- නිපුණතා සංවර්ධන පාඨමාලාවල සැලසුම් ක්‍රියාවලියන්වලට ජීවනෝපාය වෘත්තිකයන් සහභාගීකර ගැනීමට සොයා බැලිය යුතු අතර, එය ක්‍රියාවේ යොදවා ගත යුතුය
- පාඨමාලා නිර්මාණය කිරීමේදී ජීවනෝපාය නිපුණතා සංවර්ධන පාඨමාලාවලට සාම්ප්‍රදායික/පාරම්පරික දැනුම/කුසලතා සැලකිල්ලට ගතයුතුය
- විවිධ වෘත්තීන්/ව්‍යාපාර/ව්‍යවසායකත්වය පිළිබඳ පුහුණු පාඨමාලාවලදී සාමාන්‍ය දැනුම පමණක් ලබාදීම නිසා බොහෝ රාජ්‍ය පුහුණු වැඩසටහන් අසාර්ථක වී ඇත. එවැනි පුහුණු වැඩසටහන් නතර කල යුතුය

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට ජීවනෝපාය වෘත්තිකයින් හඳුනාගැනීම සඳහා යාන්ත්‍රණයක් තිබිය යුතුය. බොහෝ ජීවනෝපාය වෘත්තිකයින් ස්ථාවර ආදායම් ප්‍රභවයක් සොයාගන්නාතුරු හුදු පැවැත්ම සඳහා ජීවනෝපාය වෘත්තීන්වල නියැලී සිටින බැවින් ඔවුන්ගේ වෘත්තීන් ස්ථාවර මට්ටමක රඳවා ගැනීම සඳහා සංවර්ධනනය කිරීමට සහ ඉහළ මට්ටමකට ගෙන ඒමට විභවයක් පවතී.

## 6.3 පුහුණු වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාලත්වය දියුණු කිරීම පිළිබඳ නිර්දේශ

මෙය 4.1- 4.10 වගුමත පදනම් වේ

- වෘත්තීය අධ්‍යාපන හා පුහුණුව සපයන සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා පොදු නියාමන යාන්ත්‍රණයක් නිර්මාණයකිරීම
- සියළුම රාජ්‍ය නොවන ආයතන විසින් ලබාදෙන පුහුණුවෙහි ගුණාත්මකභාවය ඉතා අඩු බව සේවාදායකයින් විශ්වාසකරන නිසා මෙම ආයතනවලින් ලබාදෙන පුහුණුවේ ගුණාත්මකභාවය අනිවාර්ය පදනමමත පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා පියවර ගැනීම
- වර්ථමානයේ ස්වකැමැත්ත අනුව සැලසුම්කල වැඩසටහන් ප්‍රමාණවත් නොවන බැවින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් ලබන සියළුම වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා සඳහා ජාතික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සහතිකය ක්‍රියාත්මක කිරීම
- වෘත්තීය අධ්‍යාපන සහ පුහුණුව සපයන සියළු ආයතනවලට ගුණාත්මකභාවය තහවුරු කිරිමට බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීම
- කර්මාන්ත ක්ෂේත්‍රය තුල සුදුකරපටි නොවන (non-white color) රැකියා ලබාගැනීමට සිසුන්ගේ ආකල්ප වෙනස්කිරීම සඳහා සියළුම පුහුණු වැඩසටහන් සඳහා පාඨමාලා හෝ සංරචක ඇතුලත්කල යුතුයි.
- ජාතික වෘත්තීය සුදුසුකම නැති පාඨමාලාවල ගුණාත්මකබව ඉතා අඩු බැවින් සියළුම ජාතික වෘත්තීය සුදුසුකම නැති පාඨමාලා ඉවත් කිරීමට පියවර ගතයුතුය
- ප්‍රායෝගික පුහුණුව වැඩිදියුණු කල යුතු අතර ක්‍රමානුකූල කල යුතුය
- සියළුම පාඨමාලා සඳහා හොඳින් සැලසුම් කරන ලද ඉගෙන ගන්නා අතර තුර සිසුන් හුවමාරුකර ප්‍රායෝගික පුහුණුව සඳහා ස්ථානගත කරන ක්‍රමයක් සැදිය යුතුය
- කර්මාන්තගත පුහුණුව විධිමත්කිරීම සහ වැඩිදියුණු කිරීම
- බොහෝ ව්‍යාපාරික ආයතන තම ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා පුහුණුවන්නන් භාවිතාකිරීමේ නැඹුරුවක් පවතින බැවින් කර්මාන්ත සඳහා ජාතික වෘත්තීය සුදුසුකම්ලාභීන් යොදාගැනීමට කර්මාන්ත යොමුකිරීමට යාන්ත්‍රණයක් නිර්මාණයකිරීම සහ ඒ සඳහා ක්‍රියාකිරීම

## 6.4 පළාතේ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතන සඳහා බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩිකර ගැනීම සහ වෘත්තීය පුහුණුව සංවර්ධනය සඳහා නිර්දේශ

මෙම නිර්දේශ වාර්ථාවේ 4 වන සහ 5 වන පරිච්ඡේදවල විශ්ලේෂණයන්ගෙන් මතුවී පෙනේ

- සියළුම ආයතන 4.19 වගුව මඟින් ලබාදෙන අනාගත ඉල්ලුම් දත්ත සමඟ ඔවුන්ගේ පුහුණු දත්ත සැසඳිය යුතුය
- සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන හිඟයක් පවතී: පදවිය, කැබිතිගොල්ලෑව, මහවිලච්චිය, මැදවච්චිය, රාජාංගනය සහ තලාව (වගුව 5.1 සහ 5.2). ඉල්ලුම අනුව මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල නව පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කලයුතුය
- සමහර පුහුණු ආයතනවල ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් නොමැති බැවින් එම පුහුණු ආයතන/ මධ්‍යස්ථාන එකතු කිරීම සහ පර්ෂද මධ්‍යස්ථාන සෑදීම ද අවශ්‍යවේ.
- ජාතික වෘත්තීය සුදුසුකම් 5 සහ 6 ලබාදෙන පාඨමාලා පොළොන්නරුව දිස්ත්‍රික්ක යේ පුහුණු ආයතන/ මධ්‍යස්ථානවල ප්‍රමාණවත් තරම් ස්ථාපිත කලයුතුය
- සිසුන් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ශිෂ්‍යත්ව/ ශිෂ්‍යාධාර ක්‍රම හඳුන්වාදිය යුතුයි
- කලාපීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නව පාඨමාලා/ වැඩසටහන් හඳුන්වාදිය යුතුයි: සහල්මෝල් යන්ත්‍ර ක්‍රියාකරුවන් සහල්මෝල් යන්ත්‍ර සහ උපකරණ නිශ්පාදකයින් සහ නඩත්තුකරුවන්, කෘෂිකාර්මික සහ පසු අස්වනු තාක්‍ෂණය සඳහා යන්ත්‍ර සහ උපකරණ නිශ්පාදනය, පසු අස්වනු ව්‍යාපාර සැකසුම් සඳහා නිපුණතාවය සහ දැනුම, ආහාර සැකසුම් තාක්‍ෂණය, නව කෘෂි ආශ්‍රිත නිශ්පාදන සංවර්ධනය කිරීම හා නිශ්පාදනය කිරීම
- ප්‍රාමාණවත් ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම සඳහා සියළුම ආයතනවල සම්පත් සහ පහසුකම් වැඩිදියුණු කිරීම
- සියළුම ආයතන/මධ්‍යස්ථානවල අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකකයක් පිහිටුවිය යුතුයි
- දැනට පවතින ඒවා ප්‍රමාණවත් නොවන බැවින් සම්පත් මෙන්ම කර්මාන්තගත පුහුණුව සඳහා කර්මාන්ත සහයෝගීතාව වැනි ආයතනික වැඩකටයුතු සංවර්ධනය කල යුතුයි
- පුහුණු වන්නන්ගේ සහභාගීත්වය දිරිමත් කිරීම සඳහා නේවාසික පහසුකම් ලබාදීම
- වෙනස්වන කර්මාන්ත ස්වභාවයන්ට සහ තාක්‍ෂණයට ගැලපෙන පරිදි පවතින සියළුම පාඨමාලාවල විෂයමාලා නිතරම හා අඛණ්ඩව සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම
- ඉගෙනීමට කැපවීමක් ඇතිකරන ආකාරයට සහ පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසු රැකියා තෝරා ගැනීමට සිසුන්ගේ ආකල්ප වෙනස් කිරීමට පුහුණු පාඨමාලා හඳුන්වාදිය යුතුය
- ගාස්තු ව්‍යුහය නිතර සංශෝධනය කිරීමට යාන්ත්‍රණයක් සහ සූත්‍රයක් නිර්මාණය කල යුතුය. එලෙසම බොහෝ සිසුන් සඳහා රාජ්‍ය මූල්‍ය අනුග්‍රහය අවශ්‍ය වේ.

- කෘෂි, සැකසුම්, වීඩියෝකරණය වැනි නැගී එන කර්මාන්තවලට නව පුහුණු වැඩසටහන් අවශ්‍ය වේ.
- ආයතන මගින් ආදි ශිෂ්‍ය සංගම් ස්ථාපිත කිරීම අවශ්‍යවන අතර පුහුණු ආයතනවල සිසුන් සඳහා ඇති රැකියා අවස්ථා සහ කර්මාන්ත ක්ෂේත්‍රවල තෘප්තිය සොයාබැලීම සඳහා පසු විපරම් අධ්‍යනය කිරීම අවශ්‍ය වේ.
- සියළුම ආයතන සේවායෝජකයින්ගේ තෘප්තිමත්භාවය සොයාබැලීම සඳහා සමීක්ෂණ කල යුතු අතර, ඉගෙනනුම්-ඉගැන්වීම් ක්‍රමය උසස් කිරීම සඳහා එම ප්‍රතිඵල භාවිතා කල යුතුය
- පුහුණු ආයතන ඔවුන්ගේ පාඨමාලා ප්‍රචාරණය කිරීම සඳහා පෝස්ටර්, අත්පත්‍රිකා වැනි නවීන ක්‍රම භාවිතා කිරීමට සහ තොරතුරු තාක්‍ෂණය භාවිතා කිරීමට ධෛරමත් කලයුතුය
- අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ විධිමත්ව සම්බන්ධ වී අ.පො. ස. (සා. පෙළ) හෝ අ.පො. ස. (උ. පෙළ) අවසන්කල සිසුන් සඳහා අඛණ්ඩ වැඩමුළු සහ සම්මන්ත්‍රණ පාසැල්තුල සන්විධානය කල යුතුය
- බොහෝ පුද්ගලයින් දේශපාලඥයන් මගින් රැකියා සොයන නිසා අනාගත පුහුණුවන්නන් පාඨමාලා හෝ වැඩසටහන් පිළිබඳ දැනුවත්කිරීම සඳහා දේශපාලඥයන්ගේ/ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ සේවය ලබාගැනීමට යාන්ත්‍රණයක් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට තිබිය යුතුය
- පාඨමාලා ප්‍රවර්ධනය කිරීමට ග්‍රාමීය හෝ ප්‍රජා මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය
- දෙමව්පියන්ගේ තීරණ බරපතල ලෙස ශිෂ්‍යයින්ගේ තෝරාගැනීම්වලට බලපාන බැවින් දෙමව්පියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් අවශ්‍ය වේ.
- ශ්‍රී ලංකාවේ පාසැල් භාවිතා කරමින් කාර්මික හා වෘත්තීය වැඩසටහන් සඳහා පාසැල්වල සහයෝගය ලබාගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සම්බන්ධවී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට විධිමත් යාන්ත්‍රණයක් කිරීම අවශ්‍ය විය හැකිය
- ප්‍රවර්ධන වැඩසටහන්වලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන නිපුණතා සංවර්ධන සහකාර නිළධාරීන් හොඳින් භාවිතා කල හැකිය. මේ සඳහා සහායලබා ගැනීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සමීපව කටයුතු කලයුතු වනු ඇත. මේ සඳහා විවිධ රාජ්‍ය නිළධාරීන් භාවිතා කිරීමට දැනට පවතින වෘත්තීය සීමාවන් බාධාකයක් විය හැකිබව පෙනී යයි
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන නිපුණතා සංවර්ධන සහකාරවරුන් සහ මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් අතර පවතින වෘත්තීය ගැටළු විසඳහා ගතයුතුය
- සමාජීය සහ සංස්කෘතික සාධක අනාගත සිසුන් තෝරාගැනීමේ තීරණ සඳහා නැඹුරුවන බැවින් විවිධ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු පාඨමාලා පිළිබඳව මහජන ආකල්ප වෙනස් කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කල යුතුය

- අනුරාධපුර දිස්ත්‍රික්කය තුල පහත සඳහන් වෘත්තීන්ගේ පුහුණු සැපයුම වැඩිකල යුතුය; බේකරි සේවකයින්, කරණවැමියන්, වඩු කාර්මිකයින්, අයකැමි, විදුලිකාර්මිකයින්, රන්කරුවන්, සෞඛ්‍ය සේවකයින්, පෙදරේරු, ඡායාරූප නිර්මාණ ශිල්පීන්, ඡායාරූප ශිල්පී, ඖෂධවේදීන්, හෝටල් සේවකයින්, ලේකම්වරු, පිළිගැනීමේ නිළධාරීන් සහ වීමෝල් යන්ත්‍ර ක්‍රියාකරුවන්
- අනුරාධපුර දිස්ත්‍රික්කය තුල පහත සඳහන් වෘත්තීන් සඳහා පුහුණුව සැපයීමේ අතිරික්තයක් පවතී; රූපවාහිනී/ගුවන්විදුලි අළුත්වැඩියා, දැන්වීම්කරුවන්, ඇලුමිනියම් නිර්මාණ ශිල්පී, බේකරි සේවක, රූපලාවන්‍ය ශිල්පී, පරිගණක යෙදවුම් සහයක, සූපවේදීන්, පරිගණක ක්‍රියාකරු, පරිගණක කාර්මික, නිවාස සැලසුම්කරු, ෆෝමන්, උයන්පාලක, පරිගණක චිත්‍රක ශිල්පී, කේශලාවන්‍ය ශිල්පී, ගෘහපාලනය, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය, ලියවන පට්ටල් යන්ත්‍ර ක්‍රියාකරු, මෝටර් කාර්මික ශිල්පී, පරිගණක වැටුප් පැකේජ, ඩිජිටල් මුද්‍රණ ශිල්පීන්, ඇඳුම් මසන්නන්, වැද්දුම්කරුවන්, වෙබ් නිර්මාණකරුවන්

  මෙම කාණ්ඩවල පුහුණුව සැපයීම අඩුකිරීම හෝ අතිරික්ත පුහුණුලාභීන් සඳහා විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීම කලයුතුය
- අනුරාධපුර දිස්ත්‍රික්කය තුල පහත සඳහන් වෘත්තීන්වල නව පාඨමාලා අවශ්‍ය වේ; දැව නිර්මාණකරුවන්, සහල්මෝල් යන්ත්‍ර ක්‍රියාකරුවන්, කෘෂි උපකරණ/ යන්ත්‍ර නිෂ්පාදකයින්, සහල්මෝල් යන්ත්‍ර/ උපකරණ නිශ්පාදකයින් සහ ආහාර සැකසුම් ශිල්පීන්
- පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල පහත සඳහන් වෘත්තීන්ගේ පුහුණු සැපයුම වැඩිකල යුතුය; රූපවාහිනී/ ගුවන්විදුලි අළුත්වැඩියා, ඇලුමිනියම් නිර්මාණ ශිල්පී, හෝටල් සේවක, රූපලාවන්‍ය ශිල්පී, පරිගණක යෙදවුම් සහයක, වේවැල් නිශ්පාදකයින්, වඩුකාර්මිකයින්, අයකැමි, සූපවේදීන්, පරිගණක ක්‍රියාකරුවන්, පරිගණක කාර්මික, ඉලෙක්ට්‍රොනික, උයන් පාලක, රන්කරු, සෞඛ්‍ය සේවක, පේස්ට්‍රි අරක්කැමි, සහල්මෝල් යන්ත්‍ර ක්‍රියාකරු, පිහන්ගඩොල් අතුරන්නන්
- පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පහත සඳහන් වෘත්තීන් සඳහා පුහුණු සැපයුම අඩුකල යුතුය; දැන්වීම්කරුවන්, බේකරි ශිල්පීන්, ඩිජිටල් මුද්‍රණ ශිල්පී, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය, යන්ත්‍රකරු, මෝටර් කාර්මික ශිල්පී, ජලනල කාර්මික

  මොවුන්ව අනෙකුත් පළාත්වල හෝ විදේශ රැකියා සොයාගැනීම සඳහා උනන්දුකල යුතුය
- පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල පහත සඳහන් වෘත්තීන් සඳහා නව පාඨමාලා අවශ්‍ය වේ; දැව නිර්මාණ ශිල්පී, සහල්මෝල් යන්ත්‍ර ක්‍රියාකරුවන්, කෘෂි උපකරණ/ යන්ත්‍ර නිශ්පාදකයින්, සහල්මෝල් යන්ත්‍ර/ උපකරණ නිශ්පාදකයින් සහ ආහාර සැකසුම් ශිල්පීන්

**6.5 උතුරු මැද පළාත සඳහා ක්‍රියාකාරී සැලැස්ම, 2015-2020 හඳුනාගත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා නොයෙක් ආයතනවල වගකීම පැවරීම මෙන්ම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභව සඳහා සම්පත් වෙන්කිරීම/ අරමුදල් අවශ්‍යතා හඳුනාගැනීමට, යෝජිත ක්‍රියාකාරකම් සමඟ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම පහත දැක්වේ.**

වගුව 6.1: ක්‍රියාකාරී සැලැස්ම

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| 6.1 සාර්ව ප්‍රතිපත්තියක් හා නියාමන පරිසරයක් නිර්මාණය කිරීම | 6.1.1. සහයෝගීතාවයක් ස්ථාපිත කිරීමට සහ වෘත්තීය අධ්‍යාපනය, සාමාන්‍ය අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය අතර ඒකාබද්ධ තීරණ ඇතිකිරීම පිණිස නියාමන යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම | | TVEC |
| | 6.1.2. බාහිර උපාධි අපේක්ෂකයන් ගණන සීමාකිරීම | | TVEC |
| | 6.1.3. නුපුහුණු සහ අර්ධ-නිපුණ ශ්‍රමිකයන් සීමා කිරීම මඟින් අනිවාර්ය පදනම මත සියළුම කාර්යයන්වලට ජාතික වෘත්තීය සුදුසුකම්ලත් පුද්ගලයින් යොදාගැනීමට සමාගම් සහ සේවායෝජකයින් යොමුකිරීම | | TVEC |
| | 6.1.4. සේවාලාභීන්ට උදව් කිරීමට බලපත්‍ර ක්‍රමයක් හරහා ඉහළ මට්ටමින් (හොඳින්ම) පුහුණුව ලැබූ සේවකයින් හෝ අඩු මට්ටමින් පුහුණුව ලැබූ සේවකයින් පෙළ ගැස්සවීම සඳහා වෘත්තීය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් ස්ථාපිතකිරීම | | TVEC |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | 6.1.5. ස්ථිර සේවාදායකයින්ට ආදේශකයක් ලෙස පුහුණුවන්නන් අඛණ්ඩව සේවයේ යෙදවීම පාලනය කිරීමට නීති හඳුන්වාදීම | | TVEC |
| | 6.1.6. වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති ඉල්ලුමට තරුණයින් ත්‍රීරෝද රථ භාවිතය නිසා බාධා ඇතිකර තිබෙන බැවින් ත්‍රීරෝද රථ රියදුරන් සඳහා වයස් සීමාවක් යෙදවීමට නීති හඳුන්වාදීම | | TVEC |
| | 6.1.7. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, විශ්ව විද්‍යාල ප්‍රතාපාදන කොමිෂන් සභාව සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අතර ස්ථිර සහයෝගී සම්බන්ධයක් ඇති කිරීම සහ ඒකාබද්ධ රැස්වීම් පැවැත්වීම | | TVEC |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | 6.1.8. බොහෝ සිසුන් අනාගතයේදී කාර්යාල රැකියා බලාපොරොත්තුවෙන් පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලින් සුදුසුකම් ලබාගැනීමට යොමුවන අතර මෙය කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු පාඨමාලා සඳහා බලපෑමක් ඇති කරන බැවින් මේ සඳහා නියාමන යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම | | TVEC |
| 6.2 පුහුණු ආයතන සඳහා ලබාගත හැකි යාවත්කාලීන තොරතුරු සම්පූර්ණ කට්ටලයක් නිර්මාණය කිරීම | 6.2.1. එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල ශ්‍රම බලකා දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම | | TVEC |
| | 6.2.2. අ.පො.ස.(සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) න් පසු විවිධ අධ්‍යාපන වැඩසටහන් පවත්වාගෙන යන පුද්ගලයින් පිළිබඳ දත්ත ලබාගැනීම අවශ්‍ය වේ. | | TVEC/පළාත් සභාව |
| | 6.2.3. විශ්ව විද්‍යාලවලට ඇතුළු වීමට අසමත් වූ පසු බාහිර උපාධි කරගෙනයන පුද්ගලයින් පිළිබඳ දත්ත පවත්වාගෙන යායුතුය | | TVEC/පළාත් සභාව |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
| --- | --- | --- | --- |
| | 6.2.4. උතුරු මැද පළාතේ සිට වෙනත් පළාත්වලට සහ වෙනත් රටවල්වලට සන්ක්‍රමණික පුද්ගලයින් ගණන පිළිබඳ තොරතුරු පවත්වාගෙන යා යුතුය | | TVEC/පළාත් සභාව |
| 6.3 ජීවනෝපාය වෘත්තිකයන්ගේ වෘත්තීය හා විශේෂිත නිපුණතා වැඩි දියුණු කිරීමට | 6.3.1. දැනුවත්කිරීම් ඉස්මතුවන පුහුණු වැඩසටහන් ගණන අඩුකිරීම | | පළාත් සභාව/පුහුණු ආයතන |
| | 6.3.2. නිපුණතා පුහුණු වැඩසටහන් සඳහා පොදු හැකියාවන් ඇති පුහුණුකරුවන් භාවිතාකරනවාට වඩා ක්ෂේත්‍රවල විශේෂඥයින් භාවිතා කිරීම | | පළාත් සභාව/පුහුණු ආයතන |
| | 6.3.3. ජංගම සහ ක්ෂේත්‍ර පදනම් නිපුණතා පුහුණු වැඩසටහන් හඳුන්වාදිය යුතුය | | පළාත් සභාව/පුහුණු ආයතන |
| | 6.3.4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රාදේශීය කර්මාන්ත/ව්‍යාපාර ආරම්භක මධ්‍යස්ථාන පිහිටුවීම | | TVEC/පළාත් සභාව |
| 6.4 වෘත්තීය අධ්‍යාපන සහ පුහුණුවට ඇති ප්‍රවේශයන් වර්ධනය කිරීම සහ | 6.4.1.පුහුණුවන්නන්ට ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර ලබදීම | | TVEC |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| පරිමේය කිරීම | | | |
| | 6.4.2.විදේශ රැකියා අවස්ථා සඳහා ඉල්ලුමක් ඇති පාඨමාලාවල බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩිකිරීම | | TVEC/පුහුණු ආයතන |
| | 6.4.3.එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 4-6 සඳහා පාඨමාලා සහයක, අඩුම තරමින් එක් ආයතනයක්වත් ස්ථාපිත කිරීම | | TVEC/පුහුණු ආයතන |
| | 6.4.4.විදේශ රැකියා ඉලක්කරගෙන විශේෂයෙන් මධ්‍යම මට්ටමේ කුසලතා ඇති සේවකයින් බිහිකරන නව පාඨමාලා සංවර්ධනය කිරීම | | පුහුණු ආයතන |
| | 6.4.5.සියළුම පුහුණු ආයතන තමන්ගේ පුහුණුව සමග අනාගත ඉල්ලුම ගැලපීම අනිවාර්ය කල යුතුය | | TVEC/පුහුණු ආයතන |
| | 6.4.6.අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය, මැදවච්චි, රාජාංගනය සහ තලාව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල නව පුහුණු ආයතන ස්ථාපිත කලයුතුයි | | පුහුණු ආයතන |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | 6.4.7.ඉතා කුඩා සිසුන් සංඛ්‍යාවක් සිටින පුහුණු ආයතන පොකුරු පුහුණු මධ්‍යස්ථාන හෝ සංචිත බවට පත්කිරීම | | TVEC/පුහුණු ආයතන |
| | 6.4.8.ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 සහ 6 පාඨමාලා ලබාදීමට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පුහුණු ආයතන ස්ථාපිත කලයුතුය | | TVEC/පුහුණු ආයතන |
| | 6.4.9.ප්‍රාදේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා පහත සඳහන් අංශ සඳහා නව පාඨමාලා/වැඩසටහන් හඳුන්වාදිය යුතුයි. සහල්මෝල් යන්ත්‍ර ක්‍රියාකරු, සහල්මෝල් යන්ත්‍ර අමතර කොටස් නිශ්පාදකයින්, පසු අස්වනු උපකරණ නිශ්පාදනය, ආහාර තාක්‍ෂණය, දැව නිශ්පාදන නිර්මාණ තාක්‍ෂණය, පෞරාණික නිශ්පාදන තාක්‍ෂණය | | පුහුණු ආයතන |
| | 6.4.10. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහත අංශවල පුහුණු සැපයුම වැඩිකල යුතුයි; බේකරි සේවකයින්, කරණවැමියන්, වඩු කාර්මිකයින්, මුදල් අයකැමි, | | පුහුණු ආයතන |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | විදුලිකාර්මිකයින්, රන්භාණ්ඩ නිමැයුම්කරුවන්, සෞඛ්‍ය සේවකයින්, පෙදරේරු, ඡායාරූප නිර්මාණ ශිල්පීන්, ඡායාරූප ශිල්පී, ඖෂධවේදීන්, හෝටල් සේවකයින්, ලේකම්වරු, පිළිගැනීමේ නිළධාරීන් සහ වීමෝල් යන්ත්‍ර ක්‍රියාකරුවන් | | |
| | 6.4.11. අනුරාධපුර දිස්ත්‍රික්කය තුල පහත සඳහන් වෘත්තීන් සඳහා පුහුණුව සැපයීමේ අතිරික්තයක් පවතී; රූපවාහිනී/ගුවන්විදුලි අළුත්වැඩියා, දැන්වීම්කරුවන්, ඇලුමිනියම් නිර්මාණ ශිල්පී, බේකරි සේවක, රූපලාවන්‍ය ශිල්පී, පරිගණක යෙදවුම් සහයක, සූපවේදීන්, පරිගණක ක්‍රියාකරු, පරිගණක කාර්මික, නිවාස සැලසුම්කරු, ෆෝමන්, උයන්පාලක, පරිගණක චිත්‍රක ශිල්පී, | | පුහුණු ආයතන |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | කේශලාවන්‍ය ශිල්පී, ගෘහපාලනය, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය, ලියවන පට්ටල් යන්ත්‍ර ක්‍රියාකරු, මෝටර් කාර්මික ශිල්පී, පරිගණක වැටුප් පැකේජ, ඩිජිටල් මුද්‍රණ ශිල්පීන්, ඇඳුම් මසන්නන්, වැද්දුම්කරුවන්, වෙබ් නිර්මාණකරුවන්. මෙම කාණ්ඩවල පුහුණුව සැපයීම අඩුකිරීම හෝ අතිරික්ත පුහුණුලාභීන් සඳහා විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීම කලයුතුය | | |
| | 6.4.12. අනුරාධපුර දිස්ත්‍රික්කය තුල පහත සඳහන් වෘත්තීන් සඳහා නව පාඨමාලා අවශ්‍ය වේ; ඇව නිර්මාණකරුවන්, සහල්මෝල් යන්ත්‍ර ක්‍රියාකරුවන්, කෘෂි උපකරණ/ යන්ත්‍ර | | පුහුණු ආයතන |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | නිෂ්පාදකයින්, සහල්මෝල් යන්ත්‍ර/ උපකරණ නිශ්පාදකයින් සහ ආහාර සැකසුම් ශිල්පීන් | | |
| | 6.4.13. පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල පහත සඳහන් වෘත්තීන්ගේ පුහුණු සැපයුම වැඩිකල යුතුය; රූපවාහිනී/ ගුවන්විදුලි අළුත්වැඩියා, ඇලුමිනියම් නිර්මාණ ශිල්පී, හෝටල් සේවක, රූපලාවන්‍ය ශිල්පී, පරිගණක යෙදවුම් සහයක, වේවැල් නිශ්පාදකයින්, වඩුකාර්මිකයින්, අයකැමි, සූපවේදීන්, පරිගණක ක්‍රියාකරුවන්, පරිගණක කාර්මික, ඉලෙක්ට්‍රොනික, උයන් පාලක, රන්කරු, සෞඛ්‍ය සේවක, පේස්ට්‍රි අරක්කැමි, සහල්මෝල් යන්ත්‍ර ක්‍රියාකරු, පිඟන්ගඩොල් අතුරන්නන් | | පුහුණු ආයතන |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | 6.4.14. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පහත සඳහන් වෘත්තීන් සඳහා පුහුණු සැපයුම අධුකල යුතුය; දැන්වීම්කරුවන්, බේකරි ශිල්පීන්, ඩිජිටල් මුද්‍රණ ශිල්පී, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, යන්ත්‍රකරු, මෝටර් කාර්මික ශිල්පී, ජලනල කාර්මික. මොවුන්ව අනෙකුත් පළාත්වල හෝ විදේශ රැකියා සොයාගැනීම සඳහා උනන්දුකල යුතුය | | පුහුණු ආයතන |
| | 6.4.15. පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල පහත සඳහන් වෘත්තීන් සඳහා නව පාඨමාලා අවශ්‍ය වේ; දැව නිර්මාණ ශිල්පී, සහල්මෝල් යන්ත්‍ර ක්‍රියාකරුවන්, කෘෂි උපකරණ/ යන්ත්‍ර නිශ්පාදකයින්, සහල්මෝල් යන්ත්‍ර/ උපකරණ නිශ්පාදකයින් සහ | | පුහුණු ආයතන |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | ආහාර සැකසුම් ශිල්පීන් | | |
| | 6.4.16. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, පරිගණක යෙදවුම් සහයක සහ වෙනත් පරිගණක ආශ්‍රිත සිසුන් ගණන අඩුකිරීම | | පුහුණු ආයතන |
| | 6.4.17. වෘත්තීය අධ්‍යාපන සහ පුහුණුව සපයන සියළු රාජ්‍ය ආයතන අතර සම්බන්ධතාවයන් සහ සහයෝගීතාව වර්ධනය කිරීම | | TVEC |
| 6.5 පාඨමාලාවල ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩිදියුණු කිරීම | 6.5.1. අනිවාර්ය පදනම මත සියළුම පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මකකිරීම<br>6.5.2. සියළුම ජාතික වෘත්තීය සුදුසුකම් නොවන පාඨමාලා ඉවත්කිරීමට පියවර ගැනීම<br>6.5.3. සියළුම පාඨමාලාවලට කර්මාන්තගත පුහුණුව සහ සීමාවාසික පුහුණුව අනුගත කිරීම<br>6.5.4. සියළුම පුහුණු ආයතනතුල අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකක ස්ථාපිත කිරීම | | TVEC<br>TVEC<br>පුහුණු ආයතන<br>TVEC/ පුහුණු ආයතන |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | 6.5.5.තත්ත්ව කළමණාකරණ ගැටළුවලට ආමන්ත්‍රණය කිරීමට කර්මාන්ත සහයෝගීතාවයන් ස්ථාපිත කල යුතුය | | TVEC/ පුහුණු ආයතන |
| | 6.5.6.සියළුම පාඨමාලාවල විෂයමාලා නිතරම සහ අඛණ්ඩ පදනම මත සමාලෝචනය සහ සංශෝධනය කලයුතුය | | TVEC/ පුහුණු ආයතන |
| | 6.5.7.සිසුන්ගේ ආකල්ප වෙනස් කිරීමට පාඨමාලා හඳුන්වාදිය යුතුයි | | TVEC/ පුහුණු ආයතන |
| | 6.5.8.අඛණ්ඩ පදනමක්මත ශාස්ත්‍ර ව්‍යූහය සංශෝධනය කිරීමට යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුයි | | පුහුණු ආයතන |
| | 6.5.9.කර්මාන්තයේ සහාය ලබා ගැනීම සඳහා සියළුම පුහුණු ආයතන ආදි ශිෂ්‍ය සංගම් ස්ථාපිත කල යුතුයි | | පුහුණු ආයතන |
| | 6.5.10. සියළුම පුහුණු ආයතන තමන්ගේ පාඨමාලාවල ගුණාත්මකභාවය තේරුම්ගැනීමට සේවායෝජකයන්ගේ තෘප්තිමත්භාවය සෙවීමට සමීක්ෂණ සහ පසුවිපරම් | | පුහුණු ආයතන |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | අධ්‍යයන පැවැත්විය යුතුයි | | |
| | 6.5.11. පුහුණු ආයතන තම ප්‍රචාරණය සඳහා නවීන තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ක්‍රම උපයෝගීකරගත යුතුයි | | පුහුණු ආයතන |
| | 6.5.12. පාඨමාලා ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩ වැඩමුළු සහ සම්මන්ත්‍රණ පාසැල්වල පැවැත්විය යුතුයි | | පුහුණු ආයතන |
| | 6.5.13. දේශපාලඥයන් විවිධ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතන සහ පාඨමාලා පිළිබඳ දැනුවත් කල යුතුයි. එමඟින් ඔවුන්ට රැකියා සොයන අනාගත සිසුන් දැනුවත් කළ හැකියි | | TVEC/පළාත් සභා/ පුහුණු ආයතන |
| | 6.5.14. දෙමව්පියන් සඳහා ගම් මට්ටමින් සහ ප්‍රජා මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | | පළාත් සභා/ පුහුණු ආයතන |
| | 6.5.15. පුහුණු වැඩසටහන් ප්‍රවර්ධන සඳහා නිපුණතා සංවර්ධන සහකාරවරුන්ගේ සේවය ලබාගැනීම | | TVEC/පළාත් සභා |
| | 6.5.16. මානව සම්පත් සංවර්ධන සහකාරවරුන්ගේ සහ නිපුණතා සංවර්ධන | | TVEC/පළාත් සභා |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
| --- | --- | --- | --- |
| | සහකාරවරුන් අතර වෘත්තීය ගැටළු සහ ප්‍රශ්න විසඳීම<br>6.5.17. සියළුම සිසුන් සඳහා විදේශ භාෂා පුහුණුව ලබාදීම | | |
| 6.6 පුහුණුකරුවන්ගේ සහ ඇගයීම්කරුවන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම | 6.6.1. සියළුම කාර්යමණ්ඩල සඳහා අනිවාර්ය ජීව-කාලීන ඉගෙනීමේ අවස්ථා සැපයීම<br>6.6.2. සියළු කාර්යමණ්ඩල සඳහා උපාධි/ පශ්චාත් උපාධි මට්ටමේ පුහුණු සැපයීම<br>6.6.3. සියළු පුහුණුකරුවන්ට/ ඇගයීම්කරුවන්ට ජාත්‍යාන්තර පළපුරුද්ද සැපයීම | | TVEC<br>TVEC<br>TVEC |
| 6.7 සුදුසු ආයතනික පරිසරයක් නිර්මාණකිරීමට | 6.7.1. පොදු නියාමන රාමුවක් නිර්මාණය කිරීම<br>6.7.2. අනිවාර්ය පදනමක්මත සියළුම වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු පාඨමාලා සහතික කිරීමට පියවර ගැනීම<br>6.7.3. රාජ්‍ය නොවන ආයතන මඟින් පිරිනමන පාඨමාලාවල ගුණාත්මකභාවය පවත්වාගැනීමට පියවර ගැනීම | | TVEC/පළාත් සභා<br>TVEC<br>TVEC/පළාත් සභා |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | 6.7.4. සියළු වෘත්තීය පාඨමාලා/ වෘත්තීන් සඳහා කුසලතා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වාදිය යුතුයි<br>6.7.5. බලාත්මක නීතිමය රාමුවක් හරහා තොරතුරු සහ සම්පත් බෙදාගැනීම සඳහා සහ හුවමාරුකර ගැනීම සඳහා අන්තර- ආයතන සහ අන්තර-අමාත්‍යාංශ සහයෝගීතා යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම | | TVEC/පළාත් සභා<br>TVEC/ පුහුණු ආයතන |
| 6.8 සියළුම පුහුණු සේවක ප්‍රභේද සහ පුහුණු ආයතන නියාමනය සහ ප්‍රමිතිකරණය | 6.8.1. වෙනස් මට්ටම් වලින් පුහුණුව ලබන පුද්ගලයින්ගේ සේවයේ ගුණාත්මකභාවය තහවුරු කිරීමට බලපත්‍ර ක්‍රමයක් හරහා එක් එක් වෘත්තීය ප්‍රමිතිකරණය කල යුතුයි<br>6.8.2. සාමාන්‍ය අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනයට සමාන ලෙස නව වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු පනතක් හරහා සියළුම වෘත්තීය පුහුණු අධ්‍යාපන පුහුණු ආයතන නියාමනය කිරීම<br>6.8.3. සියළුම රාජ්‍ය සහ රාජ්‍ය නොවන පුහුණු ආයතන | | TVEC/පළාත් සභා<br>TVEC/පළාත් සභා<br>TVEC |

| අරමුණු | ක්‍රියාකාරකම | අවශ්‍ය සම්පත් හෝ ප්‍රාග්ධනය | ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතනය |
|---|---|---|---|
| | සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය අනිවාර්ය කිරීම | | |
| | 6.8.4. සියළු රාජ්‍ය ආයතන මඟින් සපයන වෘත්තීය අධ්‍යාපන සහ පුහුණුව අත්පත්කර ගැනීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ බලතල වැඩිකිරීම | | TVEC |
| | 6.8.5. සියළුම රාජ්‍ය ව්‍යාපෘතිවල ජාතික වාත්තීය සුදුසුකම්ලාභී පුහුණු සෙවකයින් භාවිතා කිරීමට සියළු රාජ්‍ය කොන්ත්‍රාත්කරුවන්ට බලකිරීම | | TVEC |

**6.6 සීමාවන්**

මෙම විශ්ලේෂණය මෙන්ම නිර්දේශද පහත සඳහන් සීමාවන්ට යටත් වේ. මෙම සීමාවන් දුර්වලතා ලෙස ගතයුතු නැත. ඕනෑම විද්‍යාත්මක පුරෝකථනයක් මෙන්ම ප්‍රතිපත්ති රාමුවක් දී ඇති මෙම සීමාවන්ට යටත්වේ; පරිපූර්ණ තොරතුරු නොමැතිවීම, අනාගතය පිළිබඳ අවදානම්, අනාගත ප්‍රතිඵලවල අවිනිශ්චිතභාවය, කර්මාන්ත සහ සමාජ ගතිකයන් වෙනස් වීම්, සහ පුරෝකථනයන් වෙනස් වීමට බලපාන තාක්‍ෂණයේ ශීඝ්‍ර වෙනස්කම්, ප්‍රතිපත්ති සහ අනාගතය සඳහා යෝජිත ක්‍රියාමාර්ග.

මෙම ප්‍රතිඵල මෙන්ම නිර්දේශ පහත සඳහන් සීමාවන්ට යටත්ව වලංගුවේ.

a. ආර්ථික අනාවැකිවලට විවිධ අවදානම් සහ අවිනිශ්චිතතා මඟින් බලපෑම් එල්ල කරයි. පුරෝකථනයන් පළකිරීමට ජ්‍යෝතිෂ්‍යය හැර වෙනත් සාධ්‍ය විකල්පයක් නොමැති බැවින් පුරෝකථනය සඳහා සාමාන්‍යයෙන් භාවිතා කරන්නේ මෑත අතීතයේ තත්ත්වය සහ වර්ථමාන තත්ත්වයයි. විද්‍යාත්මක ආර්ථික පුරෝකථනයක සාමාන්‍යයෙන් අඩංගු වන්නේ ප්‍රධාන ආර්ථික දර්ශක සහ අනෙකුත් සංකීර්ණ ආර්ථික/ සමාජීය දත්තවල බලපෑම් වේ. මෙම සමස්ථ පුරෝකථනය භාවිතා කරන තීරණාත්මක උපකල්පනය වන්නේ ඉතිහාසය නැවත නැවත සිදුවන බැවින් ඉතිහාසයට අනාගතය පුරෝකථනය කල හැක. ආර්ථික, සමාජීය. තාක්‍ෂණ, සහ දේශපාලන ක්‍රමයෙහි තත්ත්වයන් අනපේක්‍ෂිත වෙනස්කම් සිදුවන්නේ නම් මෙම පුරෝකථනයන් අඩු නිරවද්‍යතාවයට පත්වේ. මෙය පුරෝකථන භූමිකාව සුළුකොට තැකීමක් නොවේ. අපිට පුරෝකථනය කරනලද තොරතුරු ප්‍රවේසමෙන් භාවිතා කිරීමට අවශ්‍ය වේ. මේ නිසා අපිට අවම අනාගත අපේක්‍ෂාවන් සාදාගත හැකිය.

b. පළාතේ ශ්‍රම බලකා ප්‍රවනතාවල පුරෝකථනය දිස්ත්‍රික් මට්ටමින් නිරවද්‍ය තොරතුරු නොමැතිකම මත රඳාපවතී. ශ්‍රම බලකා වර්ධන අනුපාතය, එහි වර්ධන ස්වභාවය, අ.පො.ස.(සා.පෙළ) හෝ අ.පො.ස.(උ.පෙළ) අසමත් සිසුන් විසින් කුමන වර්ගයේ තෝරා ගැනීම් සිදුකරයිද යන්න සහ ඔවුන් සියළුදෙනාම ශ්‍රම බලකායට එකතුවීමේදී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පුහුණු ආයතන ජාලය හරහා සපයන විවිධ පාඨමාලා සොයන්නන් විය හැකිය. එම නිසා, පුරෝකථනය ±10% ක දෝෂයක් සහිතව භාවිතා කලයුතු අතර මෙම බැහැරකිරීම අනුව පුරෝකථනය 90% ක් සඳහා වලංගුවේ.

c. සමස්ථ පළාතේම ජීවනෝපාය වෘත්තිකයන්ගේ පුහුණු අවශ්‍යතා සීමාවන්වලට යටත්වේ. පළාතේ අවිධිමත් අංශයේ පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් සේවයේ නිරත වී සිටින බැවින් සියළුම රැකියාවල විශේෂිත නිපුණතා පුහුණුව අවශ්‍ය මුළු පුද්ගලයින් සංඛ්‍යාව සොයාගැනීම තාත්වික නොවේ. පළාතේ දිස්ත්‍රික්ක දෙකෙහි සිදුකරන ලද සිද්ධි අධ්‍යයනවල නිරීක්‍ෂණයන් අනුව දැනටමත් පුහුණුව ලබාඇති පුද්ගලයින් සංඛ්‍යාව ගැලපීම මෙම අධ්‍යනයේ පුරෝකථනයන්ම පදනම් කරගන්නා ලදී. පළාතේ සිටින මුළු ජීවනෝපාය වෘත්තිකයින්ට පුළුල් සැලැස්මක් අවශ්‍ය වේ. කෙසේ වෙතත්, මෙම අධ්‍යනයේ ප්‍රතිඵල හඳුනාගත් පුද්ගලයින් සංඛ්‍යාව සඳහා සහ ඔවුන්ට අවශ්‍ය කුසලතා වර්ගය සඳහා වලංගුවේ.

d. ඉදිරි වර්ෂ පහ තුල, සේවායෝජකයන්ගේ ප්‍රතිචාර පදනම් කරගෙන ශ්‍රම ඉල්ලුම සඳහා පුරෝකථනය සීමාවන් ගණනාවකට යටත්වේ. සේවායෝජකයින් තමන් ආදායම්බදුවලට ලක්වේ යැයි යන බිය නිසා අනාගතයේ ඇතිවිය හැකි ශ්‍රමය සඳහා ඉල්ලුම මෙන්ම දැනට පවතින ඉල්ලුමද ප්‍රකාශ නොකරයි. සේවා යෝජකයින් විසින් තමන්ගේ අනාගත සේවක සංඛ්‍යාවේ නිවැරදි අගය ප්‍රකාශකළහොත් සේවක අර්ථසාදක අරමුදලට සහ සේවා භාරකාර

අරමුදලට ගෙවීම් කිරීමට බලකිරීමක් කරයි යන මතය නිසා අඩු-තක්සේරුවකටද ලක්කරයි. බොහෝ සේවායෝජකයින් සේවක අර්ථසාදක අරමුදල්, සේවා භාරකාර අරමුදල් සහ අදායම්බදු ගෙවීම පැහැර හැරීමට කෙටිකාලීන සහ තාවකාලික පදනම මත මෙන්ම දෛනික ශ්‍රමය ලබාගැනීමේ පදනම මත සේවකයින් බඳවා ගැනීමේ ප්‍රවනතාවයක් ඇත. මෙවැනි තත්ත්වයක ප්‍රතිඵලය වී තිබුණේ බොහෝ ව්‍යාපාරික ආයතනවල ස්ථිර ශ්‍රමබලකායක් නොමැති වීමයි. තවද සේවායෝජකයින් පුහුණු සේවකයින්ට වඩා පුහුණුව ලබන පුද්ගලයින් සේවයේ යෙදවීමට වැඩි ප්‍රමුඛතාවයක් දෙනබව පෙනෙන්නට තිබේ. මේ මඟින් පුහුණු සේවකයින්ට දැනට කර්මාන්තයේ පවතින වැඩි වැටුප් පරිමාණයන්ට සමාන වැටුප් පරිමාණයක් පුහුණුවන්නන්ට ගෙවීම අවශ්‍ය නොවේ. සමහර ව්‍යාපාරිකයන්ගේ ප්‍රතිචාර ඔවුන්ගේ පුද්ගලික දේශපාලන අදහස්වලට ලක්විය. ඔවුන් බලයේ සිටින රජයට එරෙහිව සිටින විට, ව්‍යාපාර හොඳනැති බවට ප්‍රකාශකිරීමට පෙළඹෙන අතර ව්‍යාපාර වලින් ඉවත්වීමට සිදුවන බවට ප්‍රකාශ කරන බැවින් අනාගතයේදී අළුත් සේවකයින් බඳවා ගැනීමේ අවශ්‍යතාවයක් නැති බවට ප්‍රකාශ කරයි. බොහෝ ව්‍යාපාර කෙටිකාලීන අරමුණු කරගත් ඒවා බැවින් ඔවුන්ට කිසිම අනාගත ව්‍යාපාරික සැලැස්මක් නොමැත. මේ නිසා ඔවුන්ට අනාගතය සඳහා සේවක දත්ත සැපයීමේ හැකියාවක් නොමැත. බොහෝ ආයතනවලට ඇත්තේ ඉතාමත් වත්මන් ව්‍යාපාර අවධානයකි. එබැවින් අනාගත වැඩකටයුතු ගැන ඔවුන් ඇත්තේ අවිනිශ්චිත බලාපොරොත්තු වේ. මේ නිසා ඔවුන්ට ව්‍යාපාර වැඩිදියුණු කිරීමට සැලැස්මක් නොමැති බැවින් බොහෝ ව්‍යාපාරිකයින් සඳහන්කර ඇත්තේ ඔවුන්ට අනාගතයේ සේවක සංඛ්‍යාව වැඩිකිරීමට අවශ්‍ය නොවන බවයි. මේ නිසා කර්මාන්ත අංශවල ශ්‍රම ඉල්ලුමෙහි පුරෝකථනය ±10% ක දෝශයක් සහිතව භාවිතා කල යුතු අතර, මෙම බැහැර කිරීම අනුව පුරෝකථනය 90% ක් සඳහා වලංගුවේ.

e. කරනලද උපකල්පන ආර්ථිකයේ හෝ කර්මාන්ත ක්ෂේත්‍රයේ වෙනස්කම්වලට අනුව උල්ලංඝනය වී හෝ නැවතී නැති නම් කර්මාන්ත ක්ෂේත්රයේ වර්ධනයමත පදනම් වූ පුරෝකථනය සීමාවන්ට යටත්වේ. එම නිසා, මෙම පුරෝකථන ±10% ක දෝශයක් සහිතව භාවිතා කල යුතු අතර, මෙම බැහැර කිරීම අනුව පුරෝකථනය 90% ක් සඳහා වලංගුවේ.

f. සකස්කරන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපත්ති වෙනස් කිරීම සහ ආර්ථිකයේ ව්‍යුහයේ හැකියාව බලපාන අතර, යෝජිත ක්‍රියාවලින් ක්‍රියාත්මක කිරීම සඳහා දේශපාලන අධිකාරිය මඟින් අනුමත කිරීමට අවශ්‍ය වේ.

g. අන්තර-අමාත්‍යාංශ සහ අන්තර-ආයතනවල සහයෝගීතාව නොමැතිකම මේවා ක්‍රියාත්මක කිරීමේ දී නිරවද්‍යතාවය හා කාරයක්‍ෂමතාව කෙරෙහි බලපායි.

h. ආයතන මට්ටමින් තොරතුරු හිඟකම ඕනෑම අර්ථවත් සැලසුම් කිරීමකට බාධාකරයි

i. උතුරු මැද පළාතේ එක් එක් ආයතනවල අතිරික්ත ඉල්ලුම සහ අතිරික්ත සැපයුමට මඟසෑදීමට සම්බන්ධීකරණය සහ සහයෝගය හිඟවීම හේතුවේ.